| | S. R. Amarasingham, 536, Navalar Road, Nallur South, Jaffna .. | 10 |
| | P. Jeganathan, D. I's Office, Batticaloa .. | 10 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| District | Name and Address | Extent Alienated Acres |
|---|---|---|
| JAFFNA | | |
| | T. E. Vivekandada, 72, Semani Road, Nallur, Jaffna .. | 10 |
| | C. N. Visvalingam, Sandilupay North, Sandilupay .. | 10 |
| | M. S. Hameed, 24, 26, Grand Bazaar, Jaffna .. | 10 |
| | S. M. Srikantha, Francied Place, Bambalapitiya .. | 10 |
| | Somasundaram Sabapathipillai, Fancied Place, Colombo 4 | 10 |
| | S. S. Jayasingham, D. A. E. O's Office, Anuradhapura .. | 10 |
| | N. Thiyagarajah, Cottage Lane, Pandertherupu .. | 10 |
| | A. S. Nadarajah, Chankanai West, Pandertheruppu .. | 10 |
| | K. S. Saranapavan, 18/1, Saminar Road, Colombogam Road, Jaffna .. | 10 |
| | K. Somasunderam, No. 10, Stanley Road, Jaffna .. | 10 |
| | R. O. Ganesanathan, Department of Inland Revenue, Colombo 1 .. | 10 |
| | S. Sangarapillai, Commissioner of Sales, Tellipallai .. | 10 |
| | V. Sunderamoorthy, Karainagar West, Karainagar .. | 10 |
| | Mrs. M. Gopalasamy, 2A, 46th Lane, Wellawatte, Colombo .. | 10 |
| | P. M. Ramalingam, 45, Eachamoddai Road, Jaffna .. | 10 |
| | R. Rajaratnam, 40, Saddanathar Road, Nallur, Jaffna .. | 10 |
| | V. Kanagasabai Muthali, Money Order Department, Kollupiddy, Colombo .. .. .. | 10 |
| | A. Rasiah, 40, Saddhanathar Road, Nallur, Jaffna .. | 10 |
| | Phillipu Yahapper Sabastian, Kovilady, Pallaly, Mailiddy .. .. .. | 10 |
| | S. Rajadeva, 105/1, Kandy Road, Jaffna .. .. | 10 |
| | S. Periyathamby, Murugan Aham, Karaveedy, Karaveddy .. .. .. | 10 |
| | S. Manikavasagar, Railway Office, C.G.R., Colombo .. | 10 |
| | A. Ponnambalam, Rly Office, C. G. R., Colombo .. | 10 |
| | V. Kandasamy, No. 9, Kasil Lane, Bambalapitiya, Colombo .. .. .. | 10 |
| | S. Sivagnanam, No. 14, Wyman Road, Jaffna .. | 10 |
| | K. Thiyagarajah, No. 13, Tajveedi, Nallur, Jaffna .. | 10 |
| | S. V. Selliah, Marketing Department, Chatham Street, Colombo .. .. .. | 10 |
| | S. S. Subramaniam, Trained Teacher, Royal Primary School, Colombo .. .. .. | 10 |
| | P. Selvanayagam, 546, Unit 6, Ramanathapuram, Kilinochchi .. .. .. | 10 |
| | V. Somasunderam, C.C., Land Settlement Department, Colombo .. .. .. | 10 |
| | S. Ponnampalam, A.C.L.G's Office, Vavuniya .. | 10 |
| | V. Parameswaran, 52, Rajasinghe Road, Colombo .. | 10 |
| | T. Kadirgamamoorthy, "Muruga Nivasati", Navandil, Karaveddy .. .. .. | 10 |
| | C. K. Kandasamy, Uyarapulam, Anaikoddai .. | 10 |
| | S. Sivanesan, 49, Fernando Road, Wellawatte, Colombo 6 .. | 10 |
| | P. Nadarajah, 397, K.K.S. Road, Jaffna .. .. | 10 |
| | J. Arulanantham, T.C. Office, Vavuniya .. .. | 10 |
| | V. Coomarakuru, M.O. Dept., Kollupitiya, Colombo .. | 10 |
| | S. Ponnambalam, 215, Navalar Road, Jaffna .. | 10 |
| | N. S. Sellathamby, Chundikuli, Pallai .. .. | 10 |
| | T. Appathurai, 40/18, Sarganathar Road, Chankarai .. | 10 |
| | M. V. Kanapathipillai, Karainagar West, Palakadu, Karainagar .. .. .. | 10 |
| | K. Manikathiagarajalingam .. .. | 10 |
| | S. Thiruchelvam, Chundikuli, Pallai .. .. | 10 |
| | S. Rajadurai, 162, Navalar Road, Jaffna .. .. | 10 |
| | Sinnathamby Arumugam, 20, 1st X st. Jaffna .. | 10 |
| | P. Kailasapillai, Thumparai, Viddiyalayam, Theltheniya .. | 10 |
| | Mudiyappu Anthonipillai, Air Ceylon Ltd., Jaffna .. | 10 |
| | Sithamparapillai Saraswathy, Kudakakampavi, Puloly South, Point Pedro .. .. | 10 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| District | Name and Address | Extent Alienated Acres |
|---|---|---|
| JAFFNA | | |
| | S. P. Velauthampillai, Kudulakiri Sempeyam Lane, Kokuvil | 10 |
| | K. Thanigasalam, Market Road, Kokuvil, Udupiddy | 10 |
| | K. Nallainathan, A.C.L.G., Vavuniya | 10 |
| | V. Nagaratnam, Government Veterinary Surgeon, Thumpalai, Pt. Pedro | 10 |
| | T. Sabapathipillai, Vavathalaivilan, Tellipallai | 10 |
| | S. Kanagasabapathy, Department of Labour, Colombo 3 | 10 |
| | K. Vinasithamby, Manivilady, Puloly South Pt. Pedro | 10 |
| | P. K. Mahalingam, Mankai Illam, Udupiddy | 10 |
| | N. Rajadurai, Nelliaddy, Karaveddy | 10 |
| | P. Selladurai, Power Station Road, Point Pedro | 10 |
| | T. Sivaloganathan, Post Office, Vavuniya | 10 |
| | A. S. Sellathurai, S.P.H.S., Tellipallai | 10 |
| | T. Ambalavanar, "Manica Villa", Uduvil | 10 |
| | Selliah Kasipillai, Sir Ramakrishnapavanam, Nanthavil, Amman Kovil, Kokuvil East, Kokuvil | 10 |
| | T. U. Rasendiram, Alvai West, Alvai | 10 |
| | Sivaguru Sunderalingam, Accounts Department of National Housing, Parsons Road, Colombo | 10 |
| | A. Homar Vanniasingam, Cherubim House, Main St., Jaffna | 10 |
| | Arunasalam Kandiah, Nunavil, Kalvayal Road, Munavil East, Chavakachcheri | 10 |
| | S. V. Vadivelu, Railway Station, Mannar | 10 |
| | S. Balasubramaniam, Sandilipay North, Sandilipay | 10 |
| | M. Muttiah, Pokkarappu, Chempianpattu, 4th X. P. Street, Pedro | 10 |
| | Kandiah Thillainathan, Dutch Road, Sangathanai, | 10 |
| | Chavakachcheri | 10 |
| | A. Thalaisingham, 392, Hospital Road, Jaffna | 10 |
| | T. Nadarajah, Movil Veethy, Suthumalai West, Manipay | 10 |
| | Elaiathamby Arulaiah, PHI, Tellipallai | 10 |
| | V. Parameswarathasan, Assist. Teacher, St. Luke's College Ratnapura | 10 |
| | Sivaguru Sunderalingam, Accountant, Dept. of National Housing, Parson Road, Colombo 2 | 10 |
| | Ponniah Kartigesu, Nunavil East, Chavakachcheri | 10 |
| | A. Ratnasingham, A. C. L. G's Office, Local Government Department, Vavuniya | 10 |
| | T. Nadarajah, Edaikaddu, Atchuvely | 10 |
| | A. Rajaratnam, Finance Br. Colombo Port Commission, Colombo | 10 |
| | P. Thiyagarajah, Interpretor, District Courts, Jaffna | 10 |
| | M. Iyathurai, Korudavil, Thondamannaru | 10 |
| | K. Arunasalam, Neerviddy, 29/1, Kaloori Veethy, Jaffna | 10 |
| | D. S. Nathaniel, 208, Main Street, Jaffna | 10 |
| | Murugesu Manonmany, 16, Sakilyan Veethy, Nallur | 10 |
| | R. Ratnasabapathy, 10/4M, 14th Lane, Jinnananda Mawatta, Colombo | 10 |
| | M. Shanmughalingam, Kulapiddy Junction, Kokuvil West, Kokuvil | 10 |
| | A. Gopalaratnam, Sub Post Office, Nallur, Jaffna | 10 |
| | M. Makendthriarajah, Thaveddy North, Kokuvil | 10 |
| | Sinnathamby Rasiah, Teacher, Visuvavalavu, Sarasalai, Chavakachcheri | 10 |
| | A. Mahadeva, Eastern Paper Mills, Valaichchenai | 10 |
| | N. Selvanayagam, 171, Grausault Road, Chundikuli | 10 |
| | A. C. Nagarajah, "Devi Vasa", Arukalimadam, Anaikoddai | 10 |
| | T. Arulanandam, Koddaikaddu, Mullian | 10 |
| | M. Kodeswaran, 15, St. Lawrence Street, Wellawatte, Colombo | 10 |
| | Velupillai Vinasithamby, Pokkamppu, Mullian | 10 |
| | E. Gunaratnam, Medduvil South, Chavakachcheri | 10 |
| | R. Lakshmy Madaan, General Merchant, Musalai | 10 |
| | S. Iyampillai, Luximi Vasa, Iyakachchi | 10 |
| | S. Rajendran, No. 74, Old Park Road, Jaffna | 10 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*
(Mr. F. R. Dias Bandaranaike—Dompe)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න යක් අහන්න තියෙනව. බෙදා දී තිබෙන ඉඩම් අක්කර දාහතර දාහෙන් එක අක් කරයකවත් අද දක්වා කප්ප වගා කර නැති බව ගරු ඉඩම් ඇමතිතුමා හෝ එතුමගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා හෝ පිළිගන් නවද ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
පිළිගන්නෙ නෑ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
එහෙම නම්, අද දක්වා කප්ප වගා කර තිබෙන්නෙ කොයි ඉඩම්වලද යන වග ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කරුණාකර සඳහන් කරනවද ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කල් දුන්නොත් ඊට පිළිතුරු දෙන් නම්.

### ඉංගිරිය නගරයට විදුලිය සැපයීම

### இங்கிரிய நகருக்கு மின்சாரம்

### ELECTRICITY FOR INGIRIYA TOWN

4. **රත්නසිරි වික්‍රමනායක මයා.** (හොරණ)
*(திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறண)*
(Mr. Ratnasiri Wickramanayaka—Horana)
පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ඉංගිරිය නගරයට විදුලිය සැපයීම පිළිබඳ රයිගම් කෝරළේ උගහුහ පත්තු ගම්සභාව භාරගෙන ඇති බව එතුමා දන්නවාද ? (ආ) මෙය භාරදුන්නේ කවදාද ? (ඉ) එනමුත්, තවම මෙය ක්‍රියාත්මක වී නැති බව එතුමා දන්නවාද ? (ඊ) මෙම නගර යට විදුලිය සැපයීම සම්බන්ධව එතුමා ඉක්මණින් කටයුතු කරනවාද ?

*உள்ளூராட்சி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) றைகம் கோறளை உடுககாப்பற்றுக் கிராமச்சபை இங் கிரிய நகருக்கு மின்சாரம் விநியோகிக்கும் பொறுப்பை ஏற்றுள்ளதென்பதை அவர் அறிவாரா ? (ஆ) இது எப்பொழுது ஒப் படைக்கப்பட்டது ? (இ) அது இதுவரை செயற்படுத்தப்படவில்லையென்பதை அவர் அறிவாரா ? (ஈ) இப்பட்டணத்திற்கு மின் சாரம் விநியோகித்தல் சம்பந்தமாய் அவர் விரைவில் நடவடிக்கையெடுப்பாரா ?*

asked the Parliamentary Secretary to the Minister of Local Government : (*a*) Is he aware that the Raigam Korale Udugaha Pattu Village Committee has undertaken to supply electricity to the Ingiriya Town ? (b) When was this handed over ? (c) Is he aware that this has not been implemented yet ? (d) Will he take early action in regard to the supply of electricity to this Town ?

**ආර්. ප්‍රේමදාස මයා.** (පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government)
(අ) ඔව්. (ආ) මෙම වැඩය සඳහා වූ කොන්ත්‍රාත්තුව 1964.9.4 වැනි දින හා 1965.8.10 වැනි දින සමාගම් දෙකකට භාර දී ඇත. (ඉ) ඉඩම්වලට උඩින් යෝජිත විදුලිය සැපයීමේ කම්බි ඇදීම ගැන එම



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

දේපළ අයිතිකරුවන් විසින් දක්වා ඇති විරුද්ධතාවන් සමහරක් හේතුකොට ගෙන මෙම වැඩය තාවකාලික වශයෙන් අත්හිටුවා තිබේ. (ඊ) මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීමෙන් පසු නැවත වැඩ ආරම්භ කිරීමට ක්‍රියා කරනු ලැබේ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මේ කම්බි අදින අවස්ථාවලදී සමහර තැන්වල කම්බි හොරකම් කරනව. මෙවැනි අවස්ථාවලදී කම්බි ආරක්ෂා කිරීමට ස්ථිර වැඩ පිළිවෙළක් තිබෙනවාද නැද්ද කියා මා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැනගන්නට සතුටුයි.

ප්‍රේමදස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)

හොරකම් කිරීම් ගැන කරන්ට තිබෙන්නෙ නීත්‍යනුකූලව ක්‍රියා කිරීමටයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No. 7.

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—කෘෂිකර්ම සහ ආහාර ඇමති වෙනුවට)
(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி—விவசாய, உணவு அமைச்சர் சார்பாக)
(Mr. M. H. M. Naina Marikkar—Parliamentary Secretary to the Minister of Justice—on behalf of the Minister of Agriculture and Food)

The Hon. Minister wants time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

වාචික පිළිතුරු

## කැන්දගමුව-ඇහැළියගොඩ ළදරු විද්‍යාලය අසල ඇති ගම්බද උසාවි ගොඩනැගිල්ල

கந்தன்கமுவ-எஹெலியகொட பாலர் பாடசாலைக் கண்மையிலுள்ள கிராம நீதிமன்றக் கட்டடம்

RURAL COURT BUILDINGS NEAR KENDANGAMUWA—EHELIYAGODA INFANT SCHOOL

1. පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ—පී. බී. විජයසුන්දර මයා.—කිරිඇල්ල—වෙනුවට)
(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந்தலே—திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல சார்பாக)
(Mr. P. M. K. Tennekoon—Mihintale—on behalf of Mr. P. B. Wijesundara—Kiriella)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බොහෝ පාසැල්වලට ඒවාට අවශ්‍ය ගොඩනැගිලි හා ක්‍රීඩා භූමි නොමැති බව එතුමා දන්නවාද? (ආ) අධිකරණ අමාත්‍යාංශය යටතේ තිබෙන ගම්බද උසාවි ගොඩනැගිලි සහ ක්‍රීඩා භූමි හැටියට පාවිච්චි කිරීමට සුදුසු ඉඩම් උසාවිවල කටයුතු සඳහා පාවිච්චියට ගනු ලබන්නේ මසකට දින දෙකක් පමණක් බව එතුමා දන්නවාද? (ඉ) ගම්බද උසාවි ගොඩනැගිලි බොහොමයක් පිහිටා ඇත්තේ පාසැල් අසල බව එතුමා දන්නවාද? (ඊ) එම ගොඩනැගිලි සහ ඉඩම් උසාවි නොපැවැත්වෙන දිනවල පාසැල්වල ප්‍රයෝජනය සඳහා යොදවා ගැනීමට එතුමා කටයුතු කරනවාද? (උ) කැන්දගමුව-ඇහැළියගොඩ ළදරු විද්‍යාලය අසල තිබෙන ඉඩම් සහ ගම්බද උසාවි ගොඩනැගිල්ල එම පාසැලේ තාවකාලික පාවිච්චිය සඳහා ලබා ගැනීමට එතුමා ක්‍රියා කරනවාද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அனேக பாடசாலைகளுக்கு, தேவையான கட்டடங்களும் விளையாட்டு மைதானங்களும் இல்லையென்பதை அவர் அறிவாரா? (ஆ) நீதியமைச்சின் கீழுள்ள கிராம நீதிமன்றக் கட்டடங்களும் விளையாட்டு மைதானங்களுக்குத் தகுந்தவையுமான காணிகளும் மாதாந்தம் இரண்டு நாட்கள் மாத்திரமே நீதிமன்றங்களாகப் பாவிக்கப்படுகின்றன என்பதை அவர்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அறிவாரா? (இ) அனேக கிராம நீதிமன்றக் கட்டடங்கள் பாடசாலைகளுக்கு அண்மையில் அமைந்துள்ளன என்பதை அவர் அறிவாரா? (ஈ) நீதிமன்றம் கூடாத நாட்களில் அக்கட்டடங்களையும் காணிகளையும் பாடசாலைகள் பாவிக்கக் கூடியவகையில் அவர் நடவடிக்கைகள் எடுப்பாரா? (உ) கந்தேகமுவ எகெலியக்கொடை பாலர் பாடசாலைக்கு அருகாமையிலுள்ள கிராமக் கோட்டுக் கட்டடங்களையும் காணியையும் அப்பாடசாலையின் தற்காலிக பாவனைக்குப் பெறுவதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that many schools do not have the buildings and playgrounds needed by them? (*b*) Is he aware that the rural court buildings and the lands suitable for use as playgrounds, which are under the Ministry of Justice, are used by the courts only on two days of the month? (c) Is he aware that many rural court buildings are situated close to schools? (*d*) Will he take steps to enable schools to use these buildings and lands on days when the courts are not held? (*e*) Will he take action to obtain the rural court buildings and land in the vicinity of the Kendangamuwa-Eheliyagoda Infant School to be used temporarily by this school?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(අ) ගොඩනැගිලි අඩු පාසල් මෙන්ම ප්‍රමාණවත් ක්‍රීඩාභූමි නොමැති පාසල් ද සැලකිය යුතු සංඛ්‍යාවක් ඇති බව දනිමි. (ආ) සහ (ඉ) නොදනිමි. ඒවා පාසල් අසල පිහිටුවා තිබුනත්, උසාවිවල කටයුතු සඳහා ඒවා පාවිච්චියට ගනු ලබන්නේ මසකට දින දෙකක් පමණක් වුවත්, පාසල්වල පන්ති කාමර වශයෙන් පාවිච්චි කිරීමට එබඳු ගොඩනැගිලි සුදුසු නොවනු ඇත. (ඊ) ඉහත (ආ) සහ (ඉ) පිළිතුරු අනුව පැන නොනඟී. (උ) පැන නොනඟී.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

මා අතුරු ප්‍රශ්නයක් අහන්න සතුටුයි. එවැනි ක්‍රීඩා භූමි නැති පාසල්වලට ක්‍රීඩා භූමි සැපයීම සඳහා ගන්න පියවර කුමක්ද?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

මුදල් තත්ත්වය අනුව, අවශ්‍යකම් අනුව, පාසල්වල ඒ අඩුපාඩුකම් හැකි තරම් ඉක්මනින්ම මඟහරවන්නට අප බලාපොරොත්තු වෙනව.

**උඩුගම්පොල-මාබොදල ගම් සභාව: දිවුලපිටිය විදුලි යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත්ව**

உடுகம்பொல-மாபொதல முன்னாள் கிராமச்சபை: திவுலப்பிட்டிய மின்சாரத்திட்ட வேலை ஒப்பந்தம்

**DEFUNCT UDUGAMPOLA-MABODALE VILLAGE COUNCIL: DIVULAPITIYA ELECTRICITY SCHEME CONTRACT**

5. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—ටී. බී. එම්. හේරත් මයා.—වලපනේ—වෙනුවට)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனை—சார்பாக)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. T. B. M. Herath—Walapane)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) උඩුගම්පොල-මාබොදල කලින් තිබූ ගම්සභාව මගින් දිවුලපිටිය නගරයේ විදුලි යෝජනා ක්‍රමය යටතේ එකී ගම්සභාවට දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් 7.12.62 දින දී රුපියල් 5,700ක් ද, 29.4.1964 දිනදී රුපියල් 40,000ක් ද, 25.9.1964 දින දී රුපියල් 38,600 ක් ද ගෙවා ඇති බවත්; (ii) යෝජනාවේ කොන්ත්‍රාත්කරුවන් වන සීමාසහිත මොරිස් රෝච් සමාගමට රුපියල් 32,213.76ක මුදලක් අද වන තෙක් නොගෙවා ඇති බවත් ඔබ දන්නවාද? (ආ) ඉහත සඳහන් මෙම ගම්සභාවේ සභාපතිතුමාට ගෙවන ලද මුදල් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නැති බැවින් සභාපතිට විරුද්ධව විශ්වාසානුකූල පරීක්ෂණයක් පවත්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

ඔහුට විරුද්ධව නඩු පැවරීමට එතුමා කට යුතු කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) (i) உடு கம்பொல மாபொதல முன்னாள் கிராமச் சபை, திவுலப்பிட்டிய பட்டண மின்சாரத் திட்டத்திற்கென உள்ளூர்க் கடன்கள், அபி விருத்தி நிதியிலிருந்து 7. 12. 62 இல் 5,700 ரூபாவும், 29. 4. 64 இல் 40,000 ரூபாவும், 25. 9. 64 இல் 38,600 ரூபாவும் செலுத்தி யுள்ள தென்பதை அவர் அறிவாரா? (ii) இத்திட்டத்தைப் பொறுப்பேற்ற ஒப்பந்த காரரான "மொறிஸ் ரோஜ் லிமிற்றெட்" ஸ்தாபனத்துக்கு 32,213 ரூபா 76 சதம் இது வரை கொடுக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) இவ்விடயத்தையொட்டி ஒழுங்கு நடவடிக்கை விசாரணை யொன்று நடாத்தி மேற்சொன்ன கிராமச் சபையால் தலைவருக்குச் செலுத்தப்பட்ட பணத்தை அத்தலைவர் ஒப்பந்தகாரரிடம் கொடுக் காதுள்ளமையால் தலைவர் மீது அவர் வழக் குத் தொடருவாரா? (இ) அன்றேல் ஏன்?

asked the Parliamentary Secretary to the Minister of Local Government: (a) Is he aware that (i) the former Udugampola-Mabodale Village Council has paid out of the Local Loans and Development Fund sums of Rs. 5,700 on 7.12.62, Rs. 40,000 on 29.4.1964 and Rs. 38,600 on 25.9.1964 under the Divulapitiya Town Electricity Scheme to the said Village Council; (ii) up to this date a sum of Rs. 32,213.76 has not been paid to Messrs. Maurice Roche Ltd. who are the contractors for this scheme? (b) Will he hold a disciplinary inquiry and prosecute the chairman as the moneys paid to the chairman of the village council have not been paid by him to the contractors? (c) If not, why?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

(අ) (i) ඔව්. (ii) සීමාසහිත මොරිස් සමාගමට රු. 69,338.55 ක මුදලක් ගෙවා ඇත. නවතාගනු ලැබූ 5% මුදල ගෙවා නැත. (ආ) පරීක්ෂණ පවත්වාගෙන යනු ලැබේ. (ඉ) පැන නොනඟී.



**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මේ ප්‍රශ්නයෙ (අ) (ii) වන කොටසට පිළිතුරු වශයෙන් ගරු පාර්ලිමේන්තු ලේ කම්තුමා කිව්වෙ 5% ක් පමණක් ගෙවා නැත යන්නයි. එසේ නම් සීමාසහිත මොරිස් රෝච් සමාගම දිවුලපිටිය සුළු නගර සභාවට විදුලිය සැපයීමේ වැඩ නතර කර තිබෙන්නෙ මොන හේතුවක් නිසාද? අර 5% මුදල නොගෙවා තිබෙන නිසාද? මුදලක අඩුපාඩුවක් තිබෙනවාය කියායි අපට ඇරංචි. ඒ නිසයි මා මේ ප්‍රශ්නය විශේෂයෙන්ම අහන්නෙ. වැඩ නතර කර තිබෙන්නෙ මොන කාරණාවක් නිසාද?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

දිවුලපිටිය ගැන ප්‍රශ්නයක් මතු වෙන්නෙ නැහැ නොවැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මොරිස් රෝච් සමාගමට මේ කොන්ත්‍රාත්තුව දී තිබෙන්නෙ දිවුලපිටියට ලයිට් සපයන්නයි.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

අර නවතා ගත් 5% මුදල හැර අනෙක් මුදල් අප දැනටමත් මේ සමාගමට ගෙවා තිබෙනව.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වී සිටින පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් මුදල් වංචාවක් කළාම ඔහු අස් කළ යුතුය යන ප්‍රතිපත්තිය ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිගන්නවාද? එසේ නම් වහාම මේ පුද්ගලයාව පළාත් පාලන ආයතනයේ සභාපතිකමෙන් අස් කරනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු කථානායකතුමනි, යම්කිසි කෙනෙකු නීති විරෝධී ක්‍රියාවක් කළොත්, ඔහු එක්සත් ජාතික පක්ෂයේ හෝ වේවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ වේවා ඔහුට විරුද්ධව ක්‍රියා කිරීම මේ රජයේ ප්‍රතිපත්තියයි. මේ කාරණය ගැන පරීක්ෂණයක් පවත්වාගෙන යනවා. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව අප ක්‍රියා කරනවා.

## උඩුගම්පොල-මාබොදල ගම් සභාව: දිවුලපිටිය විදුලි යෝජනා ක්‍රමය සඳහා ලැබුණු මුදල්

உடுகம்பொல-மாபொதல முன்னுள் கிராமச்சபை: திவுலப்பிட்டிய உத்தேச மின்சாரத்திட்டத்துக்காகப் பெற்ற பணம்

DEFUNCT UDUGAMPOLA-MABODALA VILLAGE COUNCIL: MONIES RECEIVED FOR PROPOSED DIVULAPITIYA ELECTRICITY SCHEME

6. **ටී. බී. තෙන්නකෝන් මයා.** (ටී. බී. එම්. හේරත් මයා. වෙනුවට)
*(திரு. ரீ. பி. தென்னகோன்—திரு. ரி. பி. எம். ஹேரத் சார்பாக)*
(Mr. T. B. Tennekoon—on behalf of Mr. T. B. M. Herath)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කලින් තිබූ උඩුගම්පොල-මාබොදල ගම්සභාවේ වත්කම් දිවුලපිටිය ගම්සභාවත්, උඩුගම්පොල ගම්සභාවටත්, මාබොදල ගම්සභාවත්, බෙදා හැරුණ අවස්ථාවේදී දිවුලපිටියේ විදුලි යෝජනා ක්‍රමයේ ලැබීම් සහ ගෙවීම් ඇතුලත් කර නැති බව එතුමා දන්නවාද? (ආ) මේ හේතුවෙන්, 1965 දෙසැම්බර් මස 15 දින එතුමාගේ ගැසට් නිවේදනයකින්, ඉහත කී විදුලි යෝජනා ක්‍රමය දිවුලපිටිය ගම්සභාවට පැවරීම නුසුදුසු බැවින් මෙම යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කිරීම සඳහා කලින් තිබූ උඩුගම්පොල මාබොදල ගම්සභාවේ සභාපති ගැන පරීක්ෂණයක් පැවැත්වීමටත්, ගිණුම් පරීක්ෂණයක් පැවැත්වීමටත් එතුමා කටයුතු කරනවාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

*உள்ளூராட்சி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) திவுலப்பிட்டிய கிராமச் சபை, உடுகம்பொல கிராமச் சபை, மாபொதல கிராமச் சபை ஆகிய கிராமச் சபைகளுக்கு வழங்கப்பட்ட உடுகம்பொல மாபொதல முன்னுள் கிராமச் சபையின் சொத்து விபரங்களில் திவுலப்பிட்டிய மின்சார திட்டம் சம்பந்தமான வரவு செலவு விபரங்கள் காட்டப்படவில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) மேற்சொன்ன காரணத்தை முன்னிட்டு, 15. 12. 1965 எனத் தேதியிடப்பட்ட வர்த்தமானி அறிவித்தல் மூலம் அமைச்சரினால் மேற்சொன்ன மின்சாரத்திட்டம் திவுலப்பிட்டிய கிராமச் சபைக்கு மாற்றப்பட்டமை பிழையானதாகையால் உடுகம்பொல மாபொதல முன்னுள் கிராமச் சபையின் தலைவரின் நடவடிக்கைகளை விசாரணை செய்வதற்கும், இத் திட்டத்தைத் தாமதமின்றிச் செயற்படுத்துவதற்கு ஏதுவாக கணக்குப் பரிசோதனையொன்றை நடாத்துவதற்கும் அவர் நடவடிக்கை எடுப்பாரா? (இ) அன்றேல் ஏன்?*

asked the Paliamentary Secretary to the Minister of Local Government: (*a*) Is he aware that the receipts and payments of the Divulapitiya electricity scheme were not included when the assets of the former Udugampola-Maboda Village Council were distributed among the Divulapitiya V. C., the Udugamapola V. C., and the Mabodale V. C.? (*b*) In view of the fact that the transfer of the said electricity scheme to the Divulapitiya Village Council by the Minister by Gazette notification dated 15.12.1965 is incorrect for the reason stated above, will he take action to investigate the actions of the Chairman of the former Udugampola-Mabodale Village Council and to institute an audit inspection in order to implement this scheme without delay? (c) If not, why?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

(අ) ඔව්. (ආ) පරීක්ෂණ පවත්වා ගෙන යනු ලැබේ. (ඉ) පැන නොනඟී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රත්මලානේ යාන්ත්‍රික අංශයේ වැඩ තහනම් කර ඇති සේවකයින්

நீர்ப்பாசனத் திணைக்களம், இரத்மலானை : வேலை நிறுத்தம் செய்தோரை வேலை இடைநீக்கம்செய்தல்

IRRIGATION DEPARTMENT RATMALANA : INTERDICTION OF STRIKERS

8. ටී. බී. තෙන්නකෝන් මයා. (ආර්. ජී. සේනානායක මයා.—දඹදෙණිය—වෙනුවට :

(திரு. ரீ. பி. தென்னகோன்—திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய—சார்பாக)

(Mr. T. B. Tennakoon—on behalf of Mr. R. G. Senanayake—Dambadeniya)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1966 ජනවාරි මස 8 වෙනි දින සංකේත වැඩ වර්ජනයට සහභාගිවීම නිසා රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ සේවකයින් 9 දෙනෙකුගේ වැඩ තහනම් කර ඇති බව එතුමා දන්නේද? (ආ) ඔවුන්ගේ වැඩ තහනම් කර දැනට මාස 7 ක් පමණ ඉක්ම ගොස් ඇතත් ඒ අයට තවමත් චෝදනා පත්‍ර ඉදිරිපත් කර නොමැති බව එතුමා දන්නේද? (ඉ) එසේ නම්, ඒ මන්ද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : (அ) 1966, ஜனவரி 8 ஆம் தேதியன்று நடைபெற்ற அடையாள வேலை நிறுத்தத்தில் பங்கெடுத்துக்கொண்டமைக்காக இரத்மலான நீர்ப்பாசன திணைக்களத்தின் இயந்திரப் பகுதியில் கடமையாற்றிய 9 ஊழியர்கள் வேலையினின்றும் தற்காலிகமாக நிறுத்தப்பட்டுள்ளனர் என்பதை அவர் அறிவாரா? (ஆ) அவர்கள் வேலையினின்றும் தற்காலிகமாக நிறுத்தப்பட்டு 7 மாதங்கள் கடந்த போதிலும் குற்றப் பத்திரங்கள் எதுவும் அவர்களுக்கு அனுப்பப்படவில்லை என்பதை அவர் அறிவாரா? (இ) ஆமெனில் ஏன்?

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that 9 employees in the Mechanical Branch of the Irrigation Department, Ratmalana, were interdicted for participating in token strike of 8th January 1966? (*b*) Is he aware that although 7 months have passed since their interdiction no charge sheets have been served on them so far? (*c*) If so, why?

වාචික පිළිතුරු

**සෙනෙවිරත්න මයා.**

(திரு. செனெவிரத்ன)

(Mr. Seneviratne)

(අ) ඔව්. (ආ) සේවකයින් 9 දෙනා දැන් ආපසු සේවයට ගෙන ඇත. (ඉ) ඉහත (ආ) හේතුකොටගෙන මෙය පැන නොනඟී.

### මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව : සිංහල නිලධාරීන්ට අසාධාරණ

மோட்டார்ப் போக்குவரத்துத் திணைக்களம் : சிங்கள உத்தியோகத்தர்களுக்கெதிராக பாரபட்சம்

DEPARTMENT OF MOTOR TRAFFIC : DISCRIMINATION AGAINST SINHALA OFFICERS

9. ටී. බී. තෙන්නකෝන් මයා. (ආර්. ජී. සේනානායක මයා. වෙනුවට)

(திரு. ரீ. பி. தென்னகோன்—திரு. ஆர். ஜீ. சேனநாயக்க—சார்பாக)

(Mr. T. B. Tennakoon—on behalf of Mr. R. G. Senanayake)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සියියදී, ශාඛා ප්‍රධාණීන් වශයෙන් විශේෂයෙන් ම යොදවා ඇත්තේ, දෙමළ නිලධාරීන් බවත්, ඒ මඟින් එහි සිටින සිංහල නිලධාරීන් කොන් කිරීමේ ව්‍යාපාරයක් අරඹා ඇති බවත් එතුමා දන්නවාද? (ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, කාර්යාල සහකාර, ප්‍රධාන ලිපිකරු හා ඒ ඒ ශාඛා ප්‍රධාණීන්ගේ නම් එතුමා සඳහන් කරනවාද? (ඉ) 1966 ජනවාරි මස 8 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් (සංකේත වැඩ වර්ජනය) දැනටමත් ඉතාමත් අසාධාරණ දඬුවම් දී තිබියදීත්, නැවතත් ඔවුන්ට අසාධාරණයක් වන අයුරු විශේෂයෙන්ම සිංහල නිලධාරීන්ගේ ආධුනික කාලය දීර්ඝ කිරීමටත්, වැටුප් වැඩිවීම් අනුමත නොකිරීමටත් කටයුතු කරගෙන යනවා ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா : (அ) மோட்டார்ப் போக்குவரத்துத் திணைக்களத்தில் சிங்கள உத்தியோகத்தர்களுக்கெதிராய் அவர்களைப் பாரபட்சமாய் நடாத்தும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இயக்கம் ஒன்று ஆரம்பிக்கப்பட்டுள்ள தென்பதையும் இதன் விளைவாய் திணைக் களத்திலுள்ள சிரேஷ்ட உத்தியோகத்தர் களைப் புறக்கணித்து கிளைத் தலைவர்களாக தமிழ் உத்தியோகத்தர்கள் நியமிக்கப்பட் டுள்ளனரென்பதையும் அவர் அறிவாரா? (ஆ) மோட்டார்ப் போக்குவரத்துத் திணைக் களத்தின் அலுவலக உதவியாளர், பிரதம லிகிதர், கிளைத் தலைவர்கள் ஆகியோரது பெயர்களை அவர் கூறுவாரா? (இ) 1966 ஜனவரி 8 ஆம் தேதியன்று நடைபெற்ற அடையாள வேலை நிறுத்தத்தின் சார்பாய் மிகவும் நியாயமற்ற வகையில் கடும் நட வடிக்கை எடுத்துள்ளபோதிலும் அவர்களது தகுதிகாண் காலத்தை நீடிப்பதற்கும் சம் பள உயர்ச்சிகளுக்கு அங்கீகாரமளிப்பதை நிறுத்துவதற்கும் அதன் மூலம் அவர்களுக்கு மேலும் அநீதி இழைக்கப்படும் வகையில் நட வடிக்கை எடுக்கப்படுகின்றதா?

asked the Minister of Communications: (*a*) Is he aware that a campaign of discrimination against Sinhalese officers has been started in the Department of Motor Traffic whereby Tamil officers have been specially engaged as heads of branches overlooking senior officers in the department? (*b*) Will he state the names of the Office Assistant, Chief Clerk and Heads of Branches of the Department of Motor Traffic? (c) Is action being taken to extend the probationary period and to withhold the approval of salary increments in respect of Sinhalese officers, in spite of the fact that the most unreasonable punitive action has been already taken regarding the token strike of January 8, 1966, thereby causing further injustice to them?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்கு வரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(අ) නැත. ශාඛා ප්‍රධානීන් වශයෙන් පත්වීම් දෙනු ලබන්නේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව වන අතර, දෙපාර්ත

වාචික පිළිතුරු

මේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිසිවෙකුගේ ජ්‍යෙෂ්ඨත්වය නොසලකා හැර නොමැත. සියළුම ලිපිකාර නිලධාරීන් දෙපාර්තමේන්තුවට පත් කොට එවනු ලබන්නේ භාණ්ඩාගාරයෙන් වන අතර, එසේ එවනු ලබන නිලධාරීන්ගෙන් හා දෙපාර්තමේන්තුවේ දැනටමත් සිටින නිලධාරීන්ගෙන්ද ඉතාමත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ශාඛා ප්‍රධානීන් වශයෙන් තෝරා ගනු ලැබේ. (ආ) දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර කෙනෙකු නොමැත. ප්‍රධාන ලිපිකරුගේ සහ ශාඛා ප්‍රධානීන්ගේ නම් පහත දැක්වේ.

ප්‍රධාන ලිපිකරු: ඒ. ද සිල්වා මහතා, ශාඛා ප්‍රධානීන්: (1) කාර්මික ශාඛාව යුනිට් 1: පුරප්පාඩුව ඇත. (2) කාර්මික ශාඛාව යුනිට් 2: කේ. රාජා මහතා. (3) ගිණුම් ශාඛාව: ජී. බී. ජේ. ද සිල්වා මහතා. (4) ආයතන ශාඛාව: ඊ. ඩී. පී. ප්‍රනාන්දු මහතා. (5) "කේ" ශාඛාව: එස්. අමදෝරු මහතා. (6) "එල්" ශාඛාව: එස්. ඒ. ජයසිංහ මහතා. (7) "එම්" ශාඛාව: ඩී. වෙදනායගම් මහතා. (8) "එන්" ශාඛාව: කේ. නඩරාජා මහතා. (9) "ඕ" ශාඛාව: එන්. ජගදීශ්වරන් මහතා. (10) "පී" ශාඛාව: ජේ. එම්. ඩී. ජයමාන්න මහතා. (11) "එක්ස්" ශාඛාව: ඩී. එච්. ඩබ්ලිව්. දිසනායක මහතා. (12) "එස්" ශාඛාව: එස්. පොන්නම්බලම් මහතා. (13) "කිව්" ශාඛාව: ආර්. එම්. කුලරත්න මහතා. (14) "වයි" ශාඛාව: ඒ. සෝමසුන්දරම් මහතා. (15) නීති ශාඛාව: කේ. එස්. නඩරාජා මහතා. (16) ලේඛනාගාරය: ඒ. වී. අමරසේකර මහතා.

(ඉ) 1966.1.8 දින වැඩ වර්ජනයට සහභාගි වූ සියළුම නිලධාරීන්ට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීතිරීති අනුව පමණක් විනයානුකූලව ක්‍රියා කර ගෙන යනු ලැබේ. මෙම නිලධාරීන්ට කිසියම් විශේෂ දඬුවමක් දෙනු නොලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

சபை அலுவல்

BUSSINESS OF THE HOUSE

අ. භා. 2.14

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ දිනයකදී සාකච්ඡාවට ගත යුතු යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ එක්තරා වැඩ පිළිවෙළක් අනුවයි. අප දන්නා හැටියට නම් අද සාකච්ඡාව සඳහා ප්‍රථම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ බද්දෙගම ගරු මන්ත්‍රීතුමා (නිල් ද අල්විස් මයා.) යි. නමුත් එය න්‍යාය පත්‍රයෙහි 13 වැනි අංකයට වැටී තිබෙනවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමා ඒ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ශිෂ්‍ය ගුරුවරුන් ගැනයි. එය අධ්‍යාපනයට සම්බන්ධ කාරණයක්. මා මේ කරුණු සඳහන් කෙළේ බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිවයි. අද දින අංක 1 ට වැටී තිබෙන යෝජනාව ඉදිරිපත් කරන්නට පෙරයි, බද්දේගම මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ඒක එහෙම වෙන්නට බැහැ. එහි යොදා ඇති අංකය බලන්න.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)

මීට පෙරත් මෙවැන්නක් ගැන සෝදිසියක් තිබුණු බව මට මතකයි. මේ වෙනස්කම ඇති වී තිබෙන්නේ මොන හේතුවක් උඩද? පත් කළ මන්ත්‍රීතුමාගේ යෝජනාව මුලින් තිබීම ගැන මා විරුද්ධ නැහැ. එසේ වුවත් මේ ගරු සභාවේ වරප්‍රසාද ආරක්ෂා කර ගැනීම සඳහා අප මේ ගැන දැන ගත යුතුයි. මේ න්‍යාය පත්‍රය සාදා තිබෙන්නේ කොයි ආකාරයටද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

න්‍යාය පත්‍රයෙහි මුලින් සඳහන් වන්නේ මුලින් ඉදිරිපත් කර තිබෙන යෝජනාවයි. ඉදිරිපත් කරන ලද ආකාරයෙනුයි, යෝජනා න්‍යාය පත්‍රයෙහි සඳහන් වන්නේ. ඒ සම්බන්ධයෙන් වැඩි දුර දැන ගන්නට වුවමනා නම් මගේ කාමරයේදී මා මුණ ගැසෙන්න.

## ආහාර නිෂ්පාදනය සඳහා විදේශීය සමාගම් සහභාගි වීම

உணவுற்பத்தியில் வெளிநாட்டுக் கம்பனிகள் பங்கெடுத்தல்

PARTICIPATION OF FOREIGN COMPANIES IN FOOD PRODUCTION.

අ. භා. 2.16

**වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල (පත් කරන ලද මන්ත්‍රී)**
(வைத்திய கலாநிதி ஏ. ரத்னபால—நியமன அங்கத்தவர்)
(Dr. A. Ratnapala—Appointed Member)

ගරු කථානායකතුමනි, මා නමින් ඇති පළමුවැනි යෝජනාව මා දැන් ඉදිරිපත් කරනවා.

"මේ රට ආහාරවලින්, විශේෂයෙන් සහලින් ස්වයංපෝෂිත කිරීම පිණිස, එක්තරා අවදියකදී අපේ මුතුන් මිත්තන්ගේ කුඹුරු වශයෙන් පැවතී, දැනට විශාල යායවල් වශයෙන් පවතින කැලෑ ඉඩම්වල, විශේෂයෙන් සහල් සහ හැකිනම් තිරිඟු හා වෙනත් අවශේෂ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සුදුසු කොන්දේසි යටතේ බාර ගැනීමට රජය සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන ලෙස, විශාල වශයෙන් කරන කෘෂිකාර්මික කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති විදේශීය සමාගම්වලට රජය ආරාධනා කළ යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු කථානායකතුමනි, මා මේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නට ඇනුම් දී දැන් බොහෝ කාලයක් ගත වී තිබෙනවා. මේ රටේ ආහාර ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බොහොම තදින් පැවතුණු කාලයේදියි, මා මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ යෝජනාව යටතේ කරුණු රාශියක් කියන්න තිබෙනවා. පුරාණ කාලයේ දී කවදාවත් අපේ රටට අවශ්‍ය ආහාර පිටරටවලින් හිඟා කෑමට සිදු නොවූ බව අපේ ඉතිහාසයෙන් පෙනෙනවා. ලංකාවේ ජනතාවට වුවමනා සෑම ආහාර ද්‍රව්‍යයක්ම පාහේ, විශේෂයෙන්ම ප්‍රධාන ආහාර ද්‍රව්‍යය වන හාල්, මේ ලංකා පොළෙවෙන්ම ලබා ගත් බවත්, සමහර කාලවල අපේ රටේ හාල් පිටරට වලට පවා යැවූ බවත් අපේ ඉතිහාසයෙන් පෙනෙනවා. මේ රටේ මීට කලින් කවදාවත් නොතිබුණු අන්දමේ ආහාර හිඟයක් දැන් ඇති වී තිබෙනවා. මේ ආහාර ප්‍රශ්නය අපේ රටට පමණක් නොව මුළු ලෝකයටම බලපාන එකක්. දැන් හැම රටක්ම මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා බලවත් උනන්දුවකින් ක්‍රියා කරගෙන යන බව පුවත්පත් මඟින් අපට පෙනී යනවා.

ගරු කථානායකතුමනි, අපේ රටට මේ විධියේ විපතක් සිදු වීමට හේතු රාශියක් තියෙනවා. අප බොහෝ කාලයක් පරාධීනව සිටි නිසා—විදේශීන්ට යටත්ව සිටි නිසා—අපේ දියුණුව ක්‍රමක්‍රමයෙන්ම නැති වී ගොස් ආර්ථික අතිනුත් වෙනත් නොයෙක් අතිනුත් අප පිරිහෙන්නට පටන් ගත්තා. එසේ අප පිරිහීමට පත් වූ කාලවලදී අපේ කුඹුරු ආදියත්, වැව් පොකුණු ආදියත් වල් බිහි වන්නට ඉඩ හැර අපි බලාගෙන සිටියා. මේ රට විදේශීන්ගේ පාලනය යටතේ තිබුනු කාලයේදී ඔවුන් මේ රටේ පොළොවෙන් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා ගන්නට පුළුවන් දේ ලබා ගැනීමට කටයුතු කළා මිස මේ රටේ මහජනයාට වුවමනා ආහාර වගී වගා කිරීම සම්බන්ධයෙන් උත්සාහයක් කළේ නැහැ. ඒ නිසා ක්‍රමක්‍රමයෙන් අපේ ආහාර වගාව පිරිහෙන්නට පටන් ගත්තා.

පුරාණ කාලයේදී අපේ රටේ වැව් පොකුණු විශාල වශයෙන් තිබුණා. කෙටියෙන් කියනවා නම් ලංකා පොළොවට වැටෙන එක වැහි බිඳක්වත් අපතේ නොහැර ආරක්ෂා කර ගන්නට පුළුවන් වන අන්දමට ඒ කාලයේ වැව් පොකුණු බැඳ තිබුණු බව අපේ ඉතිහාසයෙන් පෙනෙනවා. නමුත් අද එවැනි තත්ත්වයක් නැහැ. ඒ වැව් පොකුණු රාශියක් අද වල් බිහි වී තිබීම නිසා වතුර රඳවා ගන්නට ක්‍රමයක් නැති වීමෙන් දැන් ඒ පළාත් ගොවිතැනට සුදුසු නැති තත්ත්වයට පත් වී තිබෙනවා. ඒ කාලයේදී අපේ රටේ වී ගොවිතැන් ආදියට වුවමනා පෝර වර්ග පිටරටින් ගෙන්නුවෙ නැති බව අපි දන්නවා. අපට වුවමනා පෝර වර්ග ලංකාවේ කොළ ආදී දේවලින් සකස් කරගෙන ඒ කාලයේදී වී ගොවිතැන සශ්‍රීක අන්දමින් කළ බව අපි දන්නවා. ඒ කාලයේදී මීට වඩා විශාල ජනගහනයක් සිටි බවත් ඉතිහාසයෙන් පෙනෙනවා. ඒ කාලයේ ලංකාවේ ජනගහනය කෝටි 6 ක් පමණ වූ බව ඇතැම් තැන්වල සඳහන් වී තිබෙනවා. ඒ කාලයේදී ලංකාවට වුවමනා ආහාර පිටරට වලින් ගෙන්වීමක් නොවූ බව ඉතිහාසයේ සඳහන් වෙනවා. අද මේ ප්‍රශ්නය විසඳීමේදී ඉතාමත් වැදගත් කරුණු රාශියක් අප විසින් සලකා බැලිය යුතුව තිබෙනවා. මෙය ආණ්ඩු පක්ෂයට පමණක් නොව හැම ගරු මන්ත්‍රීවරයෙකුටම බල පාන ඉතා වැදගත් ප්‍රශ්නයක් නිසා ඒ ගැන හැම දෙනාගේම කල්පනාව යොමු කරන්න වටිනවා.

ලංකාවාසී අපට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය අපේ රටෙන්ම ලබා නොගත්තොත් විශාල මුදල් ප්‍රමාණයක් පිටරට යවන්නට සිදු වෙනවා. අපට වුවමනා ආහාර ද්‍රව්‍ය අපේ රටේම උපදවා ගන්න පුළුවන්කම තිබියදී එසේ නොකර පිටරටවලින්ම ලබා ගැනීමට බලා සිටියොත් විදේශ විනිමය ඒ සඳහා වැය කරන්න වෙනවා. අපේ ආදායම් මාර්ග වශයෙන් තිබෙන තේ, රබර් සහ පොල්වල මිල පහත බැස තිබෙන මේ කාලයේදී අප රටෙන්ම උපදවා ගන්නට පුළුවන් ආහාර ද්‍රව්‍ය ගෙන්වීම සඳහා විදේශ විනිමය වැය කරන්න සිදු වීම අපරාධයක් බව අප විසින් ප්‍රථමකොටම වටහාගත යුතුව තිබෙනවා. ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ස්වයම්පෝෂිත වන්නට නම් අප තුළ ප්‍රථමකොටම ජාතික හැඟීමක්—මේ රට අපේය, ඒ නිසා අපේ රට අප හොඳින් දියුණු කර ගන්න ඕනෑය යන හැඟීමක්—සහ ජාතික අභිමානයක් ඇති වෙන්න ඕනෑ. අපේ ආහාර ද්‍රව්‍ය අපේ රටේ පොළොවෙන්ම සපයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල]

ගන්න අප විසින් තරයේ සිතට ගත යුතුව තිබෙනවා. කර්මාන්ත දියුණු කළාට වරදක් නැහැ. එහෙත් ප්‍රධාන වශයෙන් අපට වුවමනා කරන්නේ මේ රටේ ජනතාව බඩගින්නේ නොසිටුවා, ආහාර සඳහා පිටරටවලින් හිඟන්නෙත් නැතිව, මේ රටේම අපේ ආහාර ද්‍රව්‍ය උපදවා ගන්නටයි. ඒ සඳහා අවශ්‍ය ජාතික හැඟීම සහ ජාතික අභිමානය අප තුළ නැත්නම් එවැනි ප්‍රයත්නයකින් අපට වැඩක් වන්නේ නැහැ. එතකොට අපේ රට දියුණු කිරීමේ අදහසක් අප තුළ ඇති වෙතැයි මා හිතන්නෙ නැහැ.

ආහාර ද්‍රව්‍ය වුවමනා තරම් අපේ රටේම නිපදවා ගැනීම ඉතා වැදගත් දෙයක් වන අතර එම කටයුත්ත රජයේ සහයෝගය නැතිව ජනතාවට පමණක් කළ හැකි දෙය කැයි මා හිතන්නෙ නැහැ. ඒ සඳහා ඒ ඒ දෙපාර්තමේන්තුවල සහයෝගය වුවමනා කරනවා. විදේශිකයන්ගේ අත යට මේ රට පැවැති කාලයේදී කටයුතු කළ අන්දමටම ඒ අනුවම කටයුතු කරන්න යාමෙන් දැනටමත් අපේ රට දියුණු කිරීමේ භාර දූර කාර්යයට බාධා පැමිණ තිබෙන බව මෙනෙහි කරන්න ඕනෑ. ඒ ඒ දෙපාර්තමේන්තුවල කටයුතු කරන ප්‍රධාන නිලධාරීන්ගේ මෙන්ම අවශේෂ නිලධාරීන්ගේත් සම්පූර්ණ සහයෝගය ඇතිව සම්පූර්ණ වගකීම භාර ගෙන ජාතික මමත්වයෙන් ක්‍රියා කරනවා නම් මහ ජනතාවගේ සහයෝගය ලබා ගැනීම ඒ තරම් අපහසු කාරණයක් වෙතැයි කල්පනා කරන්න පුළුවන්කමක් නැහැ.

හැම දෙනාම නැතත් ඇතැම් කොටස්වල කඩාකප්පල්කාරි ව්‍යාපාර තිබෙන නිසා රටේ දියුණුවට නොයෙක් විධියේ බාධා ඇති වූ බව කවුරුත් දන්නවා. ඒ නිසා රජයේ ඇතැම් දෙපාර්තමේන්තුවලින් ඉෂ්ට කර ගත යුතුව තුබූ ඇතැම් කටයුතු බලාපොරොත්තු වූ තරම් උසස් ලෙස ඉෂ්ට කර ගන්න බැරි වී තිබෙනවා. ඇතැම් කාර්යාලයවලින් යම් යම් කාර්යයන් කරවා ගන්න ගියත් ඇතැම්විට මාස ගණන් ගත වෙනවා. මුදල් රෙගුලාසි හෙවත් Financial Regulations නමින් හැඳින්වෙන රෙගුලාසි මාලාවකුත්, General Orders නමින් හැඳින්වෙන තවත් නීති මාලාවකුත් තිබෙනවා. ඔය හැම එකකට ම යටත්ව වැඩ කරගෙන යාමට සිදු වීම නිසා මොනම කටයුත්තක්වත් වුවමනා වෙලාවට වුවමනා අන්දමට නිලධාරීන් ලවා කරවා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ඒ අතිනුත් තවත් අමාරුකම් තිබෙනවා. මේ නිසා සේවකයන් තුළත්, රාජ්‍ය පාලකයන් තුළත්, මහජනයා තුළත් එක්තරා විධියක නොසන්සුන්තාවක් පවතින බව කියන්න පුළුවනි. ඒ තත්ත්වයත් අපේ රටේ දියුණුවට ලොකු බාධාවක් හැටියට මා කල්පනා කරනවා.

පසුගිය කාලය තුළ ආහාර වගාව ගැන සෑහෙන තරම් සැලකිල්ලක් අපේ රටේ නොතිබුණු බව අප පිළිගන්න ඕනෑ. මීට දහ අවුරුද්දකට පමණ කලින් අපේ ආහාර වගාව දියුණු කරන්න පටන් ගත්තා නම්—මේ රටට වුවමනා සහල් ටිකවත් මේ රටේම උපදවා ගන්න උත්සාහයක් අවංකවම දැරුවා නම්—අද රටේ පවතින උග්‍ර ප්‍රශ්න ගණනාවක් ඉබේම විසඳෙන තැනට කටයුතු සැලසෙන්න තිබුණා. විදේශ විනිමයත් ආරක්ෂා කරගෙන වෙනත් සංවර්ධන කටයුතුවලට මුදල් යොදන්න පුළුවන් තත්ත්වයක් අපට ඇති වෙන්න තිබුණා.

ඒ වාගේම, කථානායකතුමනි, අපේ රටේ වී ගොවිතැන සම්බන්ධයෙන් කල්පනා කර බලන විට අපේ ගොවි මහත්වරුන් තවම අර පරණ පුරුදු තාලෙටම ගොවිතැන් කිරීමට ලැහැස්ති වී සිටිනවා මිසක් නවීන ක්‍රම හා උපක්‍රම යොදා ගෙන එය දියුණු කිරීමට වැඩි උනන්දුවක් දක්වන්නෙ නැති බව පැහැදිලිවම පෙනී යන කාරණයක්. ඒ කාරණාව නිසාත් අපේ වී ගොවිතැනට ලොකු පාඩුවක් සිදු වී තිබෙනවා.

තවත් කාරණයක් නම්, නොයෙක් පළාත් වල වර්ෂා තත්ත්වය අනුව, පස්වල තත්ත්වය අනුව, ඉතා සාර්ථක ලෙස කළ හැකි වගාවන් පිළිබඳව නොයෙක් විධියේ පර්යේෂණ පවත්වන නමුත්, ඒ පර්යේෂණවල ප්‍රතිඵල කඩදාසියට පමණක් සීමා කර තබනවා මිස ගොවීන් අතර නිසි ලෙස ප්‍රචාරය කර නොහරින නිසාත් වී ගොවිතැන ඒ තරම් සාරවත් අන්දමින් කර ගැනීමට බැරි වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවිතැන සම්බන්ධයෙන් අපේ බාල පරම්පරාව තුළ කුඩා කල පටන්ම හැඟීමක් ඇති කළ යුතුව තිබෙනව. ඒ නිසා සෑම පාසලකම සිටින සෑම දරුවකුටම ගොවිතැන සම්බන්ධයෙන් කුඩා කල සිටම හැඟීමක් දිය යුතුයි. ඒ පිළිබඳ උනන්දුවක් ඔවුන් තුළ ඇති වන ආකාරයේ අධ්‍යාපනයක් ඔවුන්ට ලබා දෙන්න ඕනැ. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒ පිළිබඳව සිත යොමු කර උනන්දුවෙන් ක්‍රියා කරනවා දැකීමට ලැබීම සතුටට කාරණයක්. අපේ අධ්‍යාපන ක්‍රමයෙන් අපි මුල පටන්ම අපේ බාල පරම්පරාව ආහාර වගාව කෙරෙහි යොමු කළා නම් ඔවුන් වැඩි වියට පත් වී විභාගවලින් සමර්ථ වූ විට, රැකීරක්ෂා සොයාගෙන පිට පළාත්වලට යන්නෙ නැතිව, ගොවිතැන පිළිබඳව තමන් ලත් ඒ අධ්‍යාපනය උපයෝගි කර ගනිමින් තම ගම් ප්‍රදේශය තුළම ආහාර වගාව පිළිබඳ කටයුතුවල ඉතාමත් සන්තෝෂයෙන් හා උනන්දුවෙන් යෙදෙන්න පටන් ගන්නවාට කිසිම අනුමානයක් නැහැ. නමුත් එවැනි අධ්‍යාපන ක්‍රමයක් මෙතෙක් තිබුණෙ නැහැ. වෙනත් වෙනත් රැකීරක්ෂා සඳහා අවශ්‍ය නොයෙක් භාෂා ශාස්ත්‍ර අතින් අපේ බාල පරපුරට අධ්‍යාපනය ලබා දුන් නමුත්, ඒ රැකීරක්ෂා ලබා ගන්නා ක්‍රමයක් සලස්වා දුන්නෙ නැහැ ; රටේ සංවර්ධනයක් ඇති වන ක්‍රමයක් සැලැස්සුවෙ නැහැ. ඒ අඩුපාඩුව නිසා, එසේ ඉගෙන ගත් අපේ බාල පරම්පරාවට රැකීරක්ෂා සොයා ගැනීමට පුළුවන්කමක් නැති වී තිබෙනව. ඒ හේතුකොටගෙන මහත් කරදරයකට මුහුණ පෑමට ඔවුන්ටත් රටටත් සිදු වී තිබෙනව.

වී ගොවිතැන සම්බන්ධයෙන් අපට බොහෝ විට දකින්නට ලැබෙන තවත් අඩුපාඩුවක් නම්, ඒ ඒ පළාත්වලට සුදුසු අන්දමේ බිත්තර වී සහ පෝර යනාදිය තවමත් හරි හැටි නොලැබෙන බවයි. සමහර අයට හොඳ බිත්තර වී සහ පෝර ආදිය ලැබුණත්, ඔවුන් ඒවා විකුණා ඒ මුදල් ඔවුන්ගේ වෙනත් වෙනත් වැඩවලට යොදවා ඒ වෙලාවට සුළු වශයෙන් මොනවා හෝ කර ගොවිතැන් කිරීම නිසා ඔවුන්ට ලැබෙන අස්වැන්න ඉතාමත් අල්ප වී තිබෙනව.

කුඹුරු පනත ක්‍රියාත්මක කිරීම සඳහා සෑම ගමකම වාගේ ගොවි කාරක සභා පත් කර තිබෙන නමුත් අවාසනාවකට වාගේ මේ ගොවි කාරක සභා දේශපාලන පක්ෂ භජනයෙන් නොයෙක් විධියට සකස් වී තිබෙන නිසා ඒ මගින් ගොවීන්ට ඉටු විය යුතු නියම සේවය ඉටු වෙන්නෙ නැහැ. මෙය ගොවීන්ට ලොකු හිරිහැරයක් සහ කරදරයක් වී තිබෙනවි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අස්වැන්න සම්බන්ධයෙන් විශාල පාඩුවක් ඇති වී තිබෙනව. ඒ වාගේම, හොරකම්, වංචාවන්, වංකකම් ආදී කාරණා නිසා අපේ ආහාර නිෂ්පාදනය හරි හැටි කර ගැනීමට බැරි වී තිබෙනව. ඔය කාරණා මග හරවා ගැනීම එතරම් අපහසු කාරණයක් නොවෙයි. බොහෝම කලක් තිස්සෙ පරණ ක්‍රමයකටම වැඩ කරන්න පුරුදු වී සිටින ගොවි ජනතාව නැගිටුවා නවීන ක්‍රම අනුව ආහාර නිෂ්පාදනය සකස් කර නොගත හොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට තව කොපමණ අවුරුදු ගණනක් ගත වේවිද කියා අපට කියන්න බැහැ.

ඔය කරුණු අනුව කල්පනා කරන විට, අද මේ ප්‍රශ්නය ඉතාමත් බරපතළ වී තිබෙන බව පෙනෙනවා. අපේ ආහාර නිෂ්පාදන කටයුතු අප පරණ විධියටම ගෙන යනවා නම් අපේ රට කවදා ස්වයංපෝෂිත වේවිද කියන ප්‍රශ්නය මතු වෙනව. මේ තත්ත්වය තව දුරටත් පැවතුණ හොත් මම හිතන්නේ නැහැ අපි බලාපොරොත්තු වන අන්දමට ආහාර නිෂ්පාදනය සඵල කර ගැනීමට පුළුවන් වේවිය කියා. එහෙත් යම් කිසි විධියකින් මේ මේ තරම් ප්‍රමාණයක් ගොවිතැන් කළ යුතුය, මේ මේ තරම් ප්‍රමාණයක් අස්වැන්න ලබා ගත යුතුය, නැත්නම් මේ මේ විධියේ දඬුවම් පමුණුවනවාය කියා නියම කර ආණ්ඩුවෙන් බලකිරීම් ඇති කළොත්, එය අපේ ආහාර නිෂ්පාදනයේ විශාල විපර්‍යාසයක් ඇති වීමට හේතුවක් වෙන්න පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල]

අපි පළමුවෙන්ම පිළිගන්න ඕනෑ, අපේ ආහාර ද්‍රව්‍ය අපේ රටේම නිපදවා ගැනීම නම් ඔය පරණ ක්‍රමයට නුපුළුවන් බව. දැනට රජය මගින් විශාල ඉඩම් ප්‍රමාණයක් ගොවීන්ට බෙදා දෙමින් ඔවුන්ට නොයෙක් උපදෙස් ලබා දෙමින් ගොවිතැන දියුණු කරන්ට උත්සාහ දරණ නමුත් එයින් අපට ලැබෙන ප්‍රයෝජනය ඉතා සුළු බව පෙනී යනව. අපේ රටට අවුරුද්දකට හාල් ටොන් 11,20,000 ක් පමණ වුවමනා කරනව. මේ රටේ වී වගාවෙන් 1964 අවුරුද්දෙ අපට ලැබී තිබෙනව වී බුසල් කෝටි 5 ක පමණ ප්‍රමාණයක්. 1965 දි ලැබී තිබෙන්නෙ වී බුසල් කෝටි 3½ යි. 1966 අවුරුද්දෙ වී බුසල් කෝටි 3½ කටත් 4 කටත් අතර ප්‍රමාණයක් බලාපොරොත්තු වෙනව. ඒ වගේම 1964 දි ලංකාවට පිටරටින් ගෙන්වා තිබෙනව, හාල් ටොන් 5,47,000 ක ප්‍රමාණයක්. 1965 අවුරුද්දෙ ගෙන්වා තිබෙනව, හාල් ටොන් 6,42,000 ක ප්‍රමාණයක්. 1966 අවුරුද්දෙදි හාල් ටොන් ලක්ෂ 7 ක් පිටරටින් ගෙන්වන්නට සිදු වේයයි ගණන් බලා තිබෙනව. හාල් ටොන් ලක්ෂ 7 ක් පිටරටින් ගෙන්වීමට සිදුවන වියදම දෙස බැලුවාම එය ඉතා විශාල මුදලක් බව පෙනී යනව. මේ රටේ ධනයෙන් වැඩි හරියක් පිටරට ඇදී යන්නෙ සහල් වැනි ආහාර ද්‍රව්‍ය මේ රටට ගෙන්වීමටයි.

ප්‍රශ්නය, මේ රටට අවශ්‍ය සහල් ප්‍රමාණය මේ රටේම නිපදවා ගන්ට බැරිද කියන එකයි. බැරි නැහැ, පුළුවනි. බුරුමය වැනි රටවල් තම රටට වුවමනා සහල් ප්‍රමාණය පමණක් නොව අපේ රටටත්, ඉන්දියාව ආදි වෙනත් රටවලටත් යවන්ට තරම් සෑහෙන සහල් ප්‍රමාණයක් නිපදවනව. එදා අපේ රටේ ඒ විධියේ කටයුත්තක් කළා නම් අද කරන්ට බැරි ඇයි කියන ප්‍රශ්නය අප අපෙන්ම ඇසිය යුතුයි. ඔය අන්දමට බලාගෙන යන විට මේ රටේ අපි නිපදවන්නෙ මේ රටට අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 40 ක 45 ක තරම ප්‍රමාණයක් බව පෙනෙනව. මීට වැඩි ප්‍රමාණයක් නිපදවන්ට නම් අපේ අබලන් වී ඇති වැව් පොකුණු ආදිය ප්‍රතිසංස්කරණය කර ඒවායේ වතුර රඳවා ගන්ට පුළුවන් වන අන්දමට ඒවා සකස් කර ගන්ට ඕනෑ. වැව් පොකුණු දහස් ගණනක් අද වල් බිහිව තිබෙනව. ඒවා අපේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිසංස්කරණය කරවා ගන්ට බලාපොරොත්තු වෙනව නම් එය මේ පරම්පරාවේ නොවෙයි, ලබන පරම්පරාවෙදිවත් කරවා ගන්ට ලැබෙන එකක් නැහැ කියන එකයි, මගේ කල්පනාව. එම නිසා අපේ ගොවීන් ලවා පරණ තාලයට ඒ වැඩ කරවා ගන්නවාද, නැත්නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ගොළුබෙලි ගමණින් ඒවා සකස් කරවා ගන්න බලාපොරොත්තු වෙනවද?

ආහාර හිඟය බලවත් වී තිබෙනව. පිටරටින් ගෙන්වනු ලබන ආහාර ද්‍රව්‍යවලට වැඩි මිළක් ගෙවන්ටත් අපට සිදුවී තිබෙනව. යම් විධියකින් හාල් නිපදවන පිටරටක ඉඩෝරයකුත් ඇති වුණොත් අපට බඩගින්නෙ ඉන්ට සිදු වෙනව. මේ ආණ්ඩුව, මේ රජය නැත්නම් මේ පාලක මණ්ඩලය, මේ රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිපදවන්ට මාර්ග නොයොදා බලා සිටිනවාද? ආසියාතික රටවල් අතුරින් ඉතාමත්ම ලස්සණ හොඳ සරු රටක් හැටියට ලංකාව කවුරුත් වගේ පිළිගෙන තිබෙනව. මේ රටේ සාරයෙන් අපි ප්‍රයෝජන ගන්ට ඕනෑ. මා කලින් සඳහන් කළා වගේ අද ඉඩම් අක්කර ලක්‍ෂ ගණනක් වල් බිහිව තිබෙනව. ඒවා ගොවිතැනට සකස් කර ගන්ට පුළුවන් නම් මේ කිසිම ප්‍රශ්නයක් පැන නගී යයි මා හිතන්නෙ නැහ. ඊට අපට වුවමනා කරන පිරිසත් නැහැ. අවශ්‍ය උපකරණත් නැහැ. අද ලෝකයේ අනිකුත් රටවල් දෙස බලන විට පෙනී යනව, නවීන ක්‍රම බොහොමයක් යොදා ඉතා ඉක්මණින් ඇතැම් රටවල ආහාර වගාව ශීඝ්‍රයෙන් සිදු කරගෙන යන බව. ඒ රටවල් නොයෙක් පර්යේෂණ පවත්වල, අළුත් පෝර වර්ග සහ නොයෙකුත් යන්ත්‍රසූත්‍ර උපයෝගි කරගෙන ආහාර වගාව දියුණු කරගෙන තිබෙනව. අපේ රටේ වී ගොවිතැන දිහා බැලූ විට පෙනෙන්නෙ, අක්කරයකට ලැබෙන වී බුසල් ප්‍රමාණය 30 ක් නැත්නම් 40 ක් පමණක් බවයි. ඊට වඩා බුසල් ප්‍රමාණයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලබාගන්ට බැරි වී තිබෙනව. ලබාගෙන ඇතොත්, ඒ තැන් අතලොස්සක පමණයි. ජපානය සහ තවත් නොයෙකුත් රටවල් නවීන ක්‍රම මඟින් අක්කරයකින් ලැබෙන අස්වැන්න ප්‍රමාණය බුසල් 120 ක් දක්වා වැඩි කරගෙන තිබෙනව. ඉතින් එවැනි රටවලින් උපදෙස් ලබාගෙන, ඒ පිළිබඳ විශේෂඥයන් ඒ රටවලින් ගෙන්වා ගෙන, අපේ කුඹුරු ප්‍රමාණය වැඩි කර ඒවායින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට උත්සාහ නොකරන්නෙ මන්දැයි මම අහනව. ඒ වගේම අප්‍රිකාව ආදි රටවල පවා නොයෙකුත් නවීන ක්‍රම යොදා ආහාර වගාව දියුණු කරගෙන තිබෙන බව අපි කල්පනා කරන්ට ඕනෑ.

දිනෙන් දින මුළු ලෝකයේම ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වේගන යනව අපේ රටෙත් දවසකට 350 කින් පමණ ජනගහනය වැඩි වේගන යනව. වැඩි වන ඒ ජනගහනයටත් ආහාර සපයන්නට සිදු වී තිබෙන බව කල්පනා කර බලන විට මේ ප්‍රශ්නය ඉතා භයානක බව පෙනී යනව. ඉතින් තත්ත්වය ඔය විදිය නම් අපි ඇයි බලාගෙන ඉන්නෙ? ඇයි අළුත් පර්යේෂණ වලින් ප්‍රයෝජන ගන්නෙ නැත්තෙ? ඇයි වෙනත් රටවල් වගේ පස් පර්යේෂණ ආදිය පවත්වා, අළුත් පෝර වර්ග හා නවීන ක්‍රම යොදා මේ රටෙත් දියුණුවක් ඇති කරන්නෙ නැත්තෙ? සමහර විට කියන්ට පුළුවන්, කලට වේලාවට වර්‍ෂාව ලැබෙන්නෙ නැති නිසා අස්වැන්න අඩුය කියල. කලට වේලාවට වර්‍ෂාව නැති බව ඇත්ත. වර්‍ෂාව ලැබුණත් එයින් ලැබෙන ජලය රඳවාගන්ට වැව් නියම විධියට සකස් කර නැහැ. ඒ නිසා වැව් සකස් කිරීම ඉතාමත් උනන්දුවෙන් කළ යුතු දෙයක්.

පායන කාලෙට වැහි වතුර ලබා ගන්ට බැරි නිසා සමහර රටවල් පොළව හාරල පොළව යටින් වතුර අරගෙන ඒ කාලෙට ගොවිතැන් කිරීමට ක්‍රමයක් සලසාගෙන තිබෙනව. ඊශ්‍රායලය මෑතකදී අඩි 1,000 ක් 1,500 ක් පොළව යටින් වතුර සපයාගෙන ගොවිතැන් කිරීමට ඉතාමත් හොඳ පිළිවෙලක් යොදාගෙන තිබෙන බව අපට දැන ගන්නට ලැබී තිබෙනව.

අපටත් ඔය විධියට කටයුතු කරන්ට නම් සෑහෙන වත්කමක් තිබෙන්ට ඕනෑ. දැන් එවැනි වත්කමක් අප සතුව නැහැ. ඒ වගේම ඒ සඳහා නියම උපකරණ ඕනෑ. එයත් අපට නැහැ. ඒ නිසයි, මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ ප්‍රශ්නය වහාම විසඳන්නට අපට වුවමනාව තිබෙනව. ඇයි, දිනෙන් දිනම අපේ ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වෙනව. ඒ හේතුවෙන්ම මේ ප්‍රශ්නය දිනෙන් දින උග්‍ර වෙනව. මහජනයා වෙනුවෙන් මේ ප්‍රශ්නය විසඳීම සඳහා අපට විශාල වග කීමක් පැවරී තිබෙනව. අපි මේ ප්‍රශ්නය විසඳුවෙ නැත්නම් වැරදිකාරයො වෙනව. ඒ නිසා විදේශීය රටවල් මේ ප්‍රශ්නය විසඳීම සඳහා කටයුතු කරන ආකාරය දිහා බලා, ඔවුන් දියුණුවන අන්දම කල්පනා කර, ඔවුන් අනුගමනය කරන නවීන ක්‍රමත් ආධාර උපකාරත් ඔවුන් ගෙන් ලබාගෙන මේ බැරෑරුම් ප්‍රශ්නය විසඳීම සඳහා අපි කටයුතු නොකරන්නෙ ඇයි කියා මම අහන්ට කැමතියි. මහජන ඡන්දයෙන් යම් රජයක් පත්ව එන්නෙ අවුරුදු 5 ක කාල සීමාවකටයි. කුමන රජයක වුවත් යුතුකම වන්නෙ එම සුළු කාලය තුළ හැකි තරම් හොඳින් රට සශ්‍රීක කිරීමයි, ස්වයංපෝෂිත කිරීමයි. එම නිසා අප රට සංවර්ධනය කිරීමට අදාල වන මෙම යෝජනාව කවුරුන් විසිනුත් පිළි ගනීවිය කියා මා විශ්වාස කරනව. අප රට සංවර්ධනය කිරීමට උපයෝගි කර ගැනීම සඳහා මෙතෙක් සම්මත කරගෙන තිබෙන යෝජනා අතරට මෙම යෝජනාවද ඇතුළත් කර ගෙන කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනව. විශාල වශයෙන් කෙරෙන ගොවිතැන් භාරගෙන කටයුතු කිරීමට කැමති ශක්ති සම්පන්න ආයතන මේ රටේ තිබෙනව නම් ඒවායේ උපකාර ලබා ගෙන හෝ පිටරටවල උදව් ලබා ගෙන හෝ අප රටේ සංවර්ධනය කිරීමෙහිලා උනන්දු වුණොත් එය විශාල යහපතක් සලසා දෙන කාරණයක් වෙනව.

1966-70 අතර කරන්ට අදහස් කරන කෘෂිකර්ම සංවර්ධන කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනව. එම වාර්තාවෙ 8 වන පිටුවෙ සඳහන් වෙනව 1966 සිට 1970 දක්වා වගා කිරීමට බලාපොරොත්තු වන අක්කර ප්‍රමාණය 2 ලක්‍ෂ 37 දහස් 160 ක් බව. මේ අක්කර ප්‍රමාණය සුළු ගණනක් නොවෙයි. එම බලාපොරොත්තුව ඉටු කර ගන්ට නම් එම අක්කර සීමාවට ළඟා වෙන්ට නම් මීට වඩා ටිකක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය රත්නපාල මයා.]
වේගයෙන් කටයුතු කරන්ට වෙනව. මේ අක්කර ප්‍රමාණයෙන් අක්කර 50 දහසක් වත් විදේශ ආයතනයකට පවරන ලෙස මා යෝජනා කරනව. කොන්ත්‍රාත්තුවක් වශයෙන් එය පවරන්න පුළුවනි. මෙන්න මේ කාල සීමාව ඇතුළත මෙම බිම් ප්‍රමාණය වගා කොට අපට වුවමනා කරන සහල් ටික සපයා දෙන්ටය කියා එවැනි කොටස කට පවරන්න පුළුවනි. එසේ වූ විට වැඩි කලක් යන්ට මත්තෙන් අපට නියම ප්‍රති ඵල පෙන්වනව ඇති. එක් වරක් සාර්ථක ප්‍රතිඵල ලැබුවාට පසු නැවත වරක් ඒ ආකාරයට කටයුතු කරන්ට හැකි වෙනව ඇති. එම නිසා මා ඉදිරිපත් කළ යෝජනාව පිළිගෙන ඉදිරි අවුරුදු කීපය ඇතුළතදී අපට වුවමනා කරන සහල් සියල්ලම නූනත් ටික තරමක්වත් ලබා ගන්න කටයුතු කරනවා ඇතැයි කියා මා විශ්වාස කරනව.

අ. භා. 2.47

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන (අම්බලංගොඩ)**
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*
(Dr. M. H. Saddhasena—Ambalangoda)

මා මිත්‍ර පත් කළ මන්ත්‍රී වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල විසින් ඉදිරිපත් කරන්ට යෙදුණු යෝජනාව ඉතා ප්‍රීතියෙන් ස්ථිර කරන අතර ඒ පිළිබඳව වචන ස්වල්පයක් කතා කිරීමට අදහස් කරනව. අද අපේ රට විශාල ආර්ථික පරිහානියකට මුහුණ දී තිබෙනව. අප රටට වුවමනා කරන දේවලින් වැඩි හරියක් පිටරටින් ලැබෙන තුරු බලා සිටීමෙ පුරුද්දක් අපේ අය අතර පවතිනව. අපේ දෛනික ආහාරයක් වන සහල් ටික පවා පිටරටවලට ගොස් සිඟා ගෙන එන්න යන තත්ත්වයක් පැන නැඟී තිබෙනව. පුරාතනයේ අපේ ශ්‍රී ලංකාවීපය ධාන්‍යාගාරයක්ව පැවති බව අප දන්නා කාරණයක්. මේ රටේ නිපදවන සහල් ආදී ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් පිටරටවලට පවා යැවූ බව අසන්ට තිබෙනව. නමුත් අද අපේ රටේ තත්ත්වය කුමක්ද? අද අපේ රටට නැවක් නාවොත් හෙට අපි බඩගින්නෙ.

අපේ රටේ ජනගහනය ඉතාමත් සීඝ්‍ර යෙන් වැඩි වෙනව. ඒ වාගේම ජනතාව දවසින් දවස උදාසීන තත්ත්වයට පත් වෙනව. නමුත් නිසි අන්දමට තම ශක්තිය යොදවා වැඩ කටයුතු කරනවා නම් අද මේ රටේ වල්බිහිවී තිබෙන අක්කර ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් වගා කිරීමට හැකි වීමෙන්, සහල් පමණක් නොවෙයි වෙනත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මේ රටේම නිපදවා ගැනීමට කිසිම අමාරුවක්, අපහසුවක් වෙන්නෙ නැහැ. අද රැකී රක්ෂා ප්‍රශ්නය උග්‍ර වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයෙ ආණ්ඩුව ඇති කළාවූ නිදහස් අධ්‍යාපනය කරන කොට ගෙන සෑම කෙනෙකුටම පාහේ අධ්‍යාපනය ලබා ගැනීමට වරප්‍රසාද ලැබී ඇතත් පැරණි යල් පැනපු අධ්‍යාපන ක්‍රමය කරන කොට ගෙන මෙවැනි තත්ත්ව යක් ඇති වී තිබෙනව. එසේ වුණත් මෙසේ ලැබෙන අධ්‍යාපනයෙන් නියම ප්‍රයෝජන යක් ගැනීමට පුළුවන්ද, ප්‍රයෝජනයක් ගන්නවාද කියන ප්‍රශ්නය අද මතු වී තිබෙනව. මගේ වැටහීමේ හැටියටත්, මා හිතන හැටියටත් ඒ දුන්නාවූ අධ්‍යාපන ක්‍රම යෙන් නියම ප්‍රයෝජන අපේ ලංකා වාසී ජනතාව ලබා ගන්නෙ නැහැ.

කොළඹ සිට තිස්සමහාරාමයට හෝ කතරගම දිහාවට යනවිට, එසේ නැතිනම් අනුරාධපුරය හෝ යාපනය දිහාවට වන්නිය මැදින් යනවිට, හම්බන්තොට ආදී ප්‍රදේශවලට යනවිට වලවේ ආදී ප්‍රදේශ වලට යන විට තමුන්නාන්සේලාට පෙනී යාවි, ඉතාමත් සශ්‍රීකව ගොවිතැන් කළ ප්‍රදේශ අද වල්බිහිවී ගොස් තිබෙන හැටි. අපේ පැරණි රජදරුවන්ගේ කාලයේදී වාරිමාර්ග ක්‍රම, වැව් අමුණු ආදිය ඉතාමත් උසස් අන්දමින් දක්ෂ අන්දමින් සකස් කරගෙන ගොවිතැන ඉතාමත් දියුණු තත්ත්වයට පත් කර තිබුණා. පොළොවට වැටෙන සෑම වැසි බිඳක්ම අපතේ නොයවා ඒ සෑම වතුර බිඳකින්ම ප්‍රයෝජනය ලබාගැනීමට සමත් ඉංජිනේරුවන් ඒ අවදියේ සිටි බව මතක් කරන්න කැම තියි. කාලයාගේ ඇවෑමෙන් සහ විදේශීය ආධිපත්‍යයට යටත් වීමෙන් ඒ සියල්ලම නැති නාස්ති වී ගොස් ඇති බව පෙනී යනවා. විදේශීයයන්ගේ පැමිණීමත් සමග ඔවුන්ගේ ධනය යොදා යම්කිසි ප්‍රයෝජන යක් ලබාගැනීම පිණිස ඔවුන් තේ, රබර්, කොකෝවා වැනි වගාවන් ආරම්භ කිරීම නිසා ඒ වාරිමාර්ග ක්‍රමවලින් සමහරක් නටබුන් වී යන්නට ඇති. ඒ කෙසේ වුණත් දේශපාලන මතභේද වලින් තොරව අද අප කාටත් මුහුණ දිය යුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උග්‍ර ප්‍රශ්නය වී තිබෙන්නෙ, අපේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මේ රටින්ම ලබා ගැනීමේ ප්‍රශ්නයයි.

උපදින සෑම තැනැත්තකුටම පළමුවෙන් ඇති වෙන්නේ බඩගින්නයි. ඒ බඩගින්න නිවා ගැනීමට වුවමනා කරන නිසා කෙසේ හෝ වේවා, කවර විධියකින් හෝ වේවා ආහාර ද්‍රව්‍ය ලබාගැනීම ඉතාමත් අවශ්‍යයි. නමුත් අපට අද කුමක්ද සිද්ධ වී තිබෙන්නෙ? අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියා මාර්ගවලට යට වුවාවූ අපි කම්මැලි මිනිසුන් කොටසක් වශයෙන් අද සියල්ලම පිට රටින් හෝ ආණ්ඩුවෙන් හෝ ලැබෙනතුරු බලා සිටීමට පුරුදුවී ඇත්තෙමු. මේ රජය රටේ පාලනය භාර ගන්නා විට භාණ්ඩාගාරය හිස්ව තිබුණු නිසා, දින කීපයකට ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට තරම්වත් මුදලක් ඉතුරුව තිබුණෙ නැහැ. එදා ජාතියේ පියා නමින් කවුරුත් පිළිගන්නා, විරුදාවලි දරන ශ්‍රීමත් ඩී. එස්. සේනානායක මැතිතුමා, ගල්ඔය, මිනිපේ, මින්නේරිය ආදී වන සතුන්ගෙන් ගහන, මැලේරියාවෙන් ගහන ප්‍රදේශ එසේ නැතිනම් කැලෑ සම්පූර්ණයෙන්ම එළිකරවා, එම ප්‍රදේශවල විශේෂයෙන්ම සිංහල මහජනතාව ගෙන ගොස් ඔවුන්ට අවශ්‍ය නිවාසස්ථාන සහ වෙනත් පහසුකම් සපයා දී වාරිමාර්ග ක්‍රම ඇති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද ලංකාවාසී ජනතාවට අඩු වශයෙන් සියයට 45 ක පමණවත් තමන්ගේ ප්‍රධාන ආහාරය වන සහල් මේ රටේම නිපදවා ගැනීමේ වරප්‍රසාදය ලැබී තිබෙනව. මා කියන්න සතුටුයි. එදා ඉතා දිළිඳු තත්ත්වයක සිටියාවූ, පැල්පත්වල වාසය කළාවූ දුප්පත් ගොවි ජනතාව අද ඉතා යහපත් අන්දමින් ගල් ඔය, මිනිපේ, හිඟුරක්ගොඩ, පොළොන්නරුව ආදී ප්‍රදේශවල වාසය කරන බව. සමහර විට අපේ මිනිපේ මන්ත්‍රීතුමා මේ කාරණා අසන්න සතුටු වෙනවා ඇති. වෙන දෙයක් නිසා නොවෙයි, අපේ අති ගරු ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ව්‍යාපාරයන් කරන කොට ගෙන ඒ ප්‍රදේශ අද සශ්‍රීක වුණු බව පිළිගන්න ඕනැ. [බාධා කිරීමක්] සමහර විට ඒ ගරු මන්ත්‍රීවරයා වල්බිහිවී ඇති ප්‍රදේශ වගා කිරීමට කොම්පැනිවලට දීම ගැන විරුද්ධත්වය දක්වනවා ඇති. නමුත්, පිදුරු ගොඩේ සිටින බල්ලා පිදුරු කන්නෙත් නැත, කන ගොනාට කන්න දෙන්නෙත් නැතැයි යන කීමේ ගැබ්ව ඇති අදහසයි සමහර ගරු මන්ත්‍රීන් කරන කථාවලින් අපට පෙනී යන්නෙ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
**(An hon. Member)**

ගොවියන්ට දෙන්නෙ නැහැ.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
**(Dr. Saddhasena)**

ගොවියන්ට ඉඩකඩම් බෙදා දීමෙන් පසුව වගා කළ හැකි බිම් තවත් විශාල ප්‍රමාණයක් අක්කර ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක්—ඉතුරුව තිබෙනවා නම් අපේ රටේ මහ ජනතාවගේ ප්‍රයෝජනය තකා වගාකිරීම පිළිබඳ පළපුරුද්දක් ඇති, වියදම් කිරීමට ධනය ඇති, ඥාණ ශක්තිය ඇති, ස්වදේශීය හෝ විදේශීය සමාගම්වලට වගා කිරීම පිණිස බෙදා දීමෙහි ඇති වරද මොකක්ද කියා තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි. අප විසින් කළ යුත්තේ වගා නොකර වල්බිහි වී තිබෙන ඉඩම් එසේම තිබෙන්නට හැරීමද, එසේ නැතිව යම්කිසි කාලසීමාවකදී ආපසු ලබා ගැනීමේ කොන්දේසිය අනුව විදේශීය හෝ ස්වදේශීය කොම්පැනිවලට ඒවා පවරා දී ඔවුන් ලවා ඒවා වගා කරවා අපේ ජනතාවට වුවමනා කරන අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙහිම නිපදවා ගැනීමද, කියා මා ප්‍රශ්න කරනව. පිට රටවලින් ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට මුදල් නැතිව බඩගින්නේ මැරී යාමට වඩා, නොයෙක් නොයෙක් රටවලට ගොස් ණය අරගෙන අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට වඩා, විදේශීය කොම්පැනි මාර්ගයෙන් වත් මේ රටේ වල්බිහි වී තිබෙන ඉඩම් වගා කරවා ගෙන—වාරිමාර්ග ක්‍රම ආදිය ඇති කරවා ගෙන—වීවලින් මෙන්ම අල, ළූණු, මිරිස් ආදියෙන් ද රට ස්වයංපෝෂිත කිරීම නරකද කියා මා අහනව. මේ රටේ වල්බිහි වූ ඉඩම් තිබෙනවා නම්, අපට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වගා කරවා ගැනීම සඳහා ඒවා විදේශික කොම්පැනිවලට තාවකාලිකව බදු දීමේ ඇති වරද මොකක්ද? එවැනි වැඩ පිළිවෙළක් ඇති කර නොගෙන අපි හැමදාමත් පිටරටවලට හිඟමනේ යන්නද? ඒ නිසා බඩගින්න දනෙන, අනුන් ළඟට හිඟමනේ යන්නට කැමති නොවන, කවුරුවත් මෙයට විරුබ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය සද්ධාසේන]

වේ යයි මා හිතන්නේ නැහැ. මේ යෝජනා කරන්නේ විදේශික කොම්පැනිවලට මේ රටේ ඉඩම් සඳහටම දෙන්නට නොවෙයි. තාවකාලික බදු ක්‍රමයක් යටතේ ඔවුන්ට ඉඩම් දී ඒ මගින් අපේ ලාංකික ජනතාවට ප්‍රයෝජනයක් ලබා ගැනීමයි, මේ යෝජනාවෙන් අදහස් කරන්නේ. පසුගිය දිනවල දරුණු මිරිස් හිඟයක් තිබුණු බව තමුන්නාන්සේත් දන්නවා ඇති. එහෙත්, මේ රටේ මිරිස්, ළූණු, අර්තාපල් ආදිය වගා කරන්නට බැරිද?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

ගරු මන්ත්‍රීතුමා කථා කරන්නේ ප්‍රශ්නයෙන් පිටස්තරවයි.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
**(Dr. Saddhasena)**

අපට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙහිම වගා කර ගැනීමට වුවමනා කරනවා. විශේෂයෙන්ම අපේ ප්‍රධාන ආහාරය වන වී ගොවිතැන දියුණු කර ගැනීමට වුවමනා කරනවා. රැකීරක්ෂා නැති අය ලංකාවේ කොපමණ හිටියත්, ඔවුන් ඒ කාර්යයෙහි යෙදෙන්නේ නැත්නම්, එමෙන්ම ගොවීන්ට වුවමනා කරන මිළ මුදල් හා උපකරණ ආදිය ඔවුන්ට නැත්නම්, රසායනික පොහොර යොදා අස්වැන්න වැඩි කර ගැනීමට ක්‍රමයක් ලංකාවේ අයට නැත්නම්, අපි ආහාර අතින් ස්වයංපෝෂිත වන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, අපේ කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා ඒ කරුණු සම්බන්ධව දැඩි උනන්දුවකින් හා උත්සාහයකින් කටයුතු කර තිබෙන බව මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමා විසින් නොයෙකුත් ප්‍රදේශවල දුප්පත් ගොවි ජනතාව වෙනුවෙන් පොහොර ගබඩා ආදිය පිහිටුවා ගෙන යනවා. ගොවිකම් නිලධාරීන් ඒ ඒ ප්‍රදේශවලට ගොස් වල් නෙලීම, පැළ සිටුවීම ආදී දේ පිළිබඳව කරුණු කියා දී ගෙන යනවා.

අප විසින් තීරණය කළ යුත්තේ මෙයයි: අපි අපේ ඉඩම් වල්බිහි වී තිබෙන්නට ඉඩ හරිනවාද, එසේ නැතිව විදේශිකයින් හෝ ස්වදේශිකයින් හෝ ලවා ඒ ඉඩම් ප්‍රයෝජනයට ගෙන මේ රටේ ජනතාවට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙහිම වගා කරවා ගන්නවාද? කවුරුන් ලවා හෝ අපේ ඉඩම්වල ආහාර ද්‍රව්‍ය වගා කරවීම කාලෝචිත නොවන්නේ ද කියා මා අහනවා.

අපේ මහජනයාගෙන් ආදායම් බදු ආදී ක්‍රමවලින් ලබා ගන්නා මුදලින් විශාල ප්‍රමාණයක් අපට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීම සඳහා වියදම් වෙනවා. මේ යෝජනාව අනුව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළොත්, එසේ වියදම් වන මුදලින් අපේ රටේ කර්මාන්ත ආදිය දියුණු කර ගෙන යන්නමින් හෝ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට අපට අවස්ථාවක් ලැබෙනවා. මෙය කාටත් හොඳහැටි පැහැදිලි කරුණක් නිසා වැඩිදුර කථා කිරීම අනවශ්‍යයයි මා හිතනවා. අපට අවශ්‍ය කරන හාල් ටික මෙන්ම අල, ළූණු, මිරිස්, පිටි ආදී දේත් පිටරටින්ම එනතුරු බලා ඉන්නට අපට සිදු වී තිබෙනවා. එහෙත්, ලංකාව ඉතාම පුදුම බිමක් ඇති රටක්. අනික් රටවලටත් වඩා සාරවත් පසක් ලංකාවේ තිබෙනවා. අපේ වරද එය ප්‍රයෝජනයට නොගැනීමයි. මේ රටේ ඉතා හොඳින් ජල පහසුකම් තිබෙනවා. එසේ නොමැති දුෂ්කර පළාත්වල පොම්ප මගින් ජලය ලබා ගන්න පුළුවන් වන අන්දමේ නවීන ක්‍රමානුකූල පිළිවෙළවල් යොදා තිබෙනවා. ඒව තව තවත් දියුණු කිරීමටත් ඒවයින් නියම ප්‍රයෝජන ගැනීමටත් අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වීමට අපට විදේශ විනිමය නැතිනම් ඊට නිසි පිළියම් අප විසින් යොදාගත යුතුව තිබෙනවා. කුඹුරු සෑම ආදී කටයුතු සඳහා යෙදවූ මීහරකුන් වෙනුවට අද ට්‍රැක්ටර් යොදනවා. එයින් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්නත් පුළුවන් වී තිබෙනවා. නමුත්, ට්‍රැක්ටර් යන්ත්‍රත් ඒවට වුවමනා කරන වෙනත් යන්ත්‍රෝපකරණත් පිටරටවලින් ගෙන්වා ගැනීමට අපට විදේශ විනිමය නැත්නම්, ඒවා සඳහා වියපැහැදම් කිරීමට අපට ශක්තියක් නැත්නම්, ඒ සඳහා ධනය යෙදවිය හැකි විදේශීය කොම්පැනිවල හෝ ස්වදේශීය කොම්පැනිවල හෝ ආධාරය ලබාගෙන, ඒ මගින් මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නයත් විසඳාගෙන, මෙහි නොයෙක් විධියෙ වගාවන් ඇති කොට අපට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙහිම නිපදවා ගැනීමට කටයුතු කිරීම ඉතාමත් ප්‍රයෝජනවත් නේදැයි මම සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතාමත් කරුණාවෙන් ප්‍රශ්න කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙය දේශපාලන මත භේද අනුව සලකා බැලිය යුතු ප්‍රශ්නයක් නොවන නිසා මුළු මහත් රටවැසියාගේම ප්‍රශ්නයක් හැටියට සැලකෙන මේ ඉතා වැදගත් යෝජනාවට සියලුදෙනාගේම කැමැත්ත ප්‍රකාශ කරන ලෙස මම ඉතා ඕනෑකමින් ඉල්ලනවා. මේ අපේ රටය, මෙහි සිටින්නේ අපේ මිනිසුන්ය, මේ අපේ ජාතියය, අප කාටත් එකසේ කුස ගිනි ඇති වෙනවය, එය නිවා ගැනීමට වුවමනා කරන ආහාර ද්‍රව්‍යයන් මෙහිම නිපදවා ගැනීමට අප කවුරුනුත් දේශපාලන මත භේද වලින් තොරව කටයුතු කළ යුතුය යන අදහස හැමදෙනා විසින්ම ඇති කරගෙන, මේ රට සංවර්ධනය කිරීමට, ස්වයංපෝෂිත කිරීමට, ගන්නා මේ පියවරට සැම දෙනාගේම සහයෝගය දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

මේ රටේ ගොවි ජනතාව විසින් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණයන් ඔවුන්ට බෙදා දී, ඉතිරි ඉඩම් විදේශීය කොම්පැණි මගින් හෝ වේවා, ස්වදේශීය කොම්පැනි මගින් හෝ වේවා වගා කර ගැනීම ඉතාමත් කාලෝචිත බව ප්‍රකාශ කරමින් මෙම යෝජනාව ඉතා සතුටින් ස්ථිර කරනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

***Question proposed.***

අ. භා. 3.01

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
**(Mr. F. R. Dias Bandaranaike)**

ගරු කථානායකතුමනි, අප කවුරුනුත් දේශපාලන මත භේදවලින් තොරව කුස ගින්න නිවා ගැනීම පිණිස කටයුතු කළ යුතුය යන අදහස අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය සද්ධාසේන මයා.) ඉතාමත් අවංක හිතින් ප්‍රකාශ කළ බව එතුමගෙ කථාවට සවන් දීගෙන සිටින විට මට හැඟී ගියා. ඇත්ත වශයෙන්ම ඒ අදහස ඉතාමත් වැදගත් බව මමත් ප්‍රකාශ කරනවා. ඒ අදහසට අප කවුරුනුත් එකඟ වුණත්, කුස ගින්න නිවා ගැනීමට අප කාටත් ඕනෑකම තිබුණත්, ඒ සඳහා ඉදිරිපත් කර තිබෙන මේ යෝජිත මාර්ගය කුමක් ද යන කරුණ අප විසින් සොයා බලා ගත යුතුව තිබෙනවා.

අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථිර කරමින් ඉතා වේගවත්ව කථා කළ නිසා, මේ අවස්ථාවෙදි ආණ්ඩුවට කා වදින හැටියට මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ විශෙෂ ඕනෑකමක් එතුමාට තිබෙන බව අපි කවුරුත් පිළිගන්නවා. නමුත් අවාසනාවකට වගේ මොකද වුණේ? ඉස්සරහ පෙළේ ඇමතිවරුන් කවුරුවත්ම නෑ. වර්ජනය කරනවද දන්නෙ නෑ. එක් කෙනෙක්වත් පේන්න නෑ. ඉන්නෙ ප්‍රධාන අගමැති වෙල්වනායගම් මහත්මය පමණයි. රජයට වැදගත් අදහසක් තෝරා දෙන්න අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා කොපමණ උත්සාහ කළත් එතුමගෙ අදහස හරි යන්නෙ නෑ, ඇමතිවරු එක් කෙනෙක්වත් මෙහි නැති නිසා. එතුමා කියා සිටියා දැන් මී හරක් වෙනුවට ට්‍රැක්ටර් තිබෙනවාය කියා. ඇත්ත වශයෙන්ම දැන් ඇමතිවරුන් වෙනුවට මී හරක් ද? එහෙම කල්පනා කර බැලුවොත් අපට යම් අදහසක් තෝරා ගන්නයි වෙන්නෙ. හරි හෝ වැරදි හෝ යම් අදහසක් තෝරා ගන්නයි වෙන්නෙ. ඇත්ත වශයෙන්ම මේ යෝජනාවේ තිබෙන අදහස් රටේ තත්ත්වයේ හැටියට රටට නොගැළපෙන බවයි මගේ අදහස. වෛද්‍යාචාර්ය රත්නපාල පත් කළ මන්ත්‍රීතුමාගේ අදහස් උඩ මේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කළ හැකිය කියා මා පිළිගන්නෙ නැහැ. ඊට හේතු මා තෝරා දෙන්නම්. කෘෂිකර්මය ගැන කිසියම් පළපුරුද්දක් තිබෙන කෙනෙකු දැන් මේ අවස්ථාවේදී සභා ගර්භය තුළ සිටිනවා නම් ඒ මමයි. කෘෂිකර්ම ඇමති හැටියට කෙටි කාලයක් තුළ වුවත් මා වැඩ කළ නිසයි එහෙම කියන්නෙ. මේ රජයේ ඇමතිවරුන් හෝ හිටපු ඇමතිවරුන් හෝ අපේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනාවලට ඇහුම්කන් දීමට අද දින මේ ගරු සභාවට නොපැමිණ සිටීම ගැන මා කනගාටු වෙනවා. [බාධා කිරීමක්] අසනීපයකින්ලු. අසනීපය අපි දන්නවා. ඔය අපනීපෙට "රිෂ්පල්" බෙහෙත තමයි ඔක්කොටම තියෙන්නෙ. බලන්නකො මුහුණ දිහා. නමුත් ඔය "රිෂ්පල්" බෙහෙතෙන් නම් රටේ ලෙඩ සුව වෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ගැන අපි මොහොතකට කල්පනා කර බලමු. වෛද්‍යාචාර්ය රත්නපාල පත් කළ මන්ත්‍රීතුමා පළමුවෙන් තම කථාවේදී කියා සිටියා —ඒක ඉතින් හැමදාම ගහන පදේ—අපේ රටේ මේ වැරදි සියල්ලම වුණේ අවුරුදු නවයක් තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රට පාලනය කළ නිසාය කියා. ඒ අවුරුදු නවය තුළදිලු වැඩේ කැවෙ. ඒක තමයි හැමදාම ගහන තැටිය. ඒ කථාව ගැන අපි මේ අවස්ථාවේදී ටිකක් කල්පනා කර බලමු. ඒ අවුරුදු නවය තුළ මොකක්ද සිදු වුණේ? 1956 සිට 1963 දක්වා කෘෂිකර්මය භාරව තිබුණේ බොහොම ලක්ෂණ යුවලකටයි. ගරු සී. පී. ද සිල්වා සහ ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන තමයි ඒ යුවළ. පත් කළ ගරු මන්ත්‍රීතුමා කියන අන්දමට ඒ කාලසීමාව තුළ ඒ දෙදෙනා තමයි රටේ කෘෂිකර්මය කැවෙ. කරුණා කර ටිකක් කල්පනා කර බලන්න මා කියන දේ ඇත්තද නැද්ද කියා. ඒ දෙදෙනා රට විනාශ කර දැමුවා නම් ඇයි තමුන්නාන්සේලා තවත් බලා ගෙන ඉන්නෙ? ඒ අවුරුදු නවය තුළ වැඩේ වැරදුණාය කියනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැඩේ නරක් කළාය කිය නවා නම්, ඇයි තමුන්නාන්සෙල තවත් බලාගෙන ඉන්නෙ? ඒකයි මා පළමු වෙන්ම අහන ප්‍රශ්නය. ඊළඟට 1963 න් පසු ගරු සී. පී. ද සිල්වායි මමයි ඒ අමාත්‍යාංශ භාරව සිටිය. අවුරුදු දෙකකට කිට්ටු කාලයක් තුළ මම ආහාර හා කෘෂි කර්ම ඇමති හැටියට සේවය කළා. ගරු සී. පී. ද සිල්වා ඉඩම් අමාත්‍යාංශය භාරව සිටියා. හොඳයි, ඒ කාල සීමාව තුළ මගෙන් වරදක් සිදු වුණා නම් පළමු වෙන්ම ඒ වැරදි පෙන්වා දෙන්නෙ වර්තමාන කෘෂිකර්ම ඇමතිතුමා වන ගරු එම්. ඩී. බණ්ඩා මහත්මයයි. නමුත් ඒ ඇමතිතුමා නැගිට මේ ගරු සභාවේදී කියන්නෙ කුමක් ද? මේ රටේ කෘෂිකර්මයට යම්කිසි යහපතක් සිද්ධ වුණා නම් සිද්ධ වුණේ එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහත්මයා යටතේ ඒ අමාත්‍යාංශය තිබුණු කාලයේදීය, ඒ මහත්මයාගේ ප්‍රතිපත්ති මමත් අනුගමනය කරනවාය, ඒ ප්‍රතිපත්ති මා වෙනස් කරන්නෙ ඉතාම සුලු වශයෙන්ය, එතුමා කළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංවිධානයත් සියල්ලම සියයට සියයක්ම මමත් අනුමත කරනවාය යන්නයි වර්තමාන කෘෂිකර්ම සහ ආහාර ඇමතිතුමා ප්‍රසිද්ධියේ මේ ගරු සභාවේදී කියන්නෙ. එසේ නම් අපි මේ මොනවද කථා කරන්නෙ? එම නිසා පසු ගිය අවුරුදු නවය ගැන කථා කරන විට නැවත වරක් ටිකක් කල්පනා කර කථා කරන මෙන් මා ඒ පත් කළ ගරු මන්ත්‍රීතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

පත් කළ ගරු මන්ත්‍රීතුමා අපේ මුතුන් මිත්තන් ගැන මේ යෝජනාවෙ සඳහන් කර තිබෙනව. මම හිතන්නෙ අපේ මුතුන් මිත්තන් ෆේඩරල් කාරයො නොවේය කියා එතුමා පිළිගන්නවා ඇති. අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (වෛද්‍යාචාර්ය සද්ධාසේන) එය පිළිගන්නවා ඇති. හරි. මමත් එය පිළිගන්නව. ඒවගෙම අපේ මුතුන් මිත්තන් සමාගම් කාරයොත් නොවෙයි. එසේ නම්, අපේ මුතුන් මිත්තන් කවුද කියා සොයා බැලුවොත් සුලු ගොවි මහතුන්ගේ පරම්පරාවකින් අප වැඩි දෙනෙකුම මේ රටට බිහිවී තිබෙන බව පෙනෙනවා ඇති. අපේ මුතුන් මිත්තන් ගැන කථා කරනවා නම් අපි කථා කරන්නෙ මේ රටේ ගොවි ජනතාව ගැනයි. අපේ මුතුන් මිත්තන්ගේ කාලය ගැන පත් කළ ගරු මන්ත්‍රීතුමා මොකක්ද කියන්නෙ? ඒ දවස්වල රට ආහාරවලින් ස්වයංපෝෂිතය යන්නයි වෛද්‍යාචාර්ය රත්නපාල පත් කළ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාවෙන් කියන්නෙ. ගොවි මහතුන්ට ඉඩම් තිබුණු දවස්වල මේ රට කොතරම් ලස්සනට ස්වයංපෝෂිත වී තිබුණාද? අහේතුවකට වගේ ඒ යුගය නැතිව ගියා. මේ ඉඩම් කැලෑවට යට වී තිබීමෙන් කිසිම ප්‍රයෝජනයක් නැහැ. මේ ඉඩම් නැවත වරක් වගා කර ගන්නට අප කවුරුනුත් උත්සාහ කළ යුතුයි. අපේ ස්වයංපෝෂිත යුගය අපට නැතිව ගියේ ඇයි? උතුරෙන් ද්‍රවිඩයන් පැමිණ මේ රට කාල දැම්මා නේද? එළාර දුටුගැමුණු රජ වරුන්ගේ යුද්ධ ගැන කල්පනා කර බලන්න. අනුරාධපුර පොළොන්නරුව වැනි පළාත් සිංහලයන්ට නැතිව ගියේ ඒ කාලයේදි නේද? වී ගබඩාවක් හැටියට තිබුණු පළාත් අපට නැතිව ගියේ ඒ කාලයේදී නේද? මේකට වග කිවයුත්තේ එළාරලා නේද? අපේ මුතුන්මිත්තන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙඩරල්කාරයන් නොවන බවත්, පෙඩ රල්කාරයන්ගේ මුතුන්මිත්තන් එළාරලා බවත් අප කල්පනාවට ගත යුතුයි. එළාර රජු තමයි, ප්‍රථමයෙන්ම මේ රට බෙදන්නට උත්සාහ කෙළේ. අපේ මුතුන්මිත්තුන්ගේ කාලයේදී පැවැති තත්ත්වය නැවත වරක් මේ රටෙහි ඇති කරන්නට උත්සාහ කරන විට අප අපේ මුතුන්මිත්තන්ගෙන් පාඩමක් ඉගෙන ගත යුතුයි.

පත් කරන ලද මන්ත්‍රීතුමාගේ යෝජනාවෙන් කියැවෙන්නේ මොකක්ද? "අනේ අපේ මුතුන්මිත්තන් වූ ගොවි මහතුන්ට මේ වැඩේ කරන්නට පුළුවන් වුණා; නමුත් අපට නම් බෑ. අපේ ගොවි මහතුන් කෙරෙහි විශ්වාසයක් තබන්නට බෑ. මේ වැඩේ භාර දිය යුත්තේ විදේශික කොම්පැනිකාරයන්ටයි. ඒ අයට පමණයි, මේක කරන්නට පුළුවන් වන්නේ" යන විධියේ අදහසක් නේද ඒ යෝජනාවෙන් කියැවෙන්නේ? [බාධා කිරීමක්] ඔව්, මම ඒ යෝජනාව කියවා පෙන්වන්නම්. මේ වැඩේ කරන්නට හුරු පුරුද්දක් ඇත්තේ ඒ අයට පමණක් බවයි, ඒ යෝජනාවෙන් කියවෙන්නේ. ට්‍රැක්ටර් ආදී යන්ත්‍ර සූත්‍ර තිබෙන්නේ ඒ අයටයි. ඒ නිසා මේ වැඩේ අපේ සුළු ගොවි මහතුන්ට බෑ. අපේ මුතුන්මිත්තන් කළ දේ දැන් අපට බරිලු. අපේ මුතුන්මිත්තන් පෙඩරල් කාරයන් හෝ කොම්පැනිකාරයන් හෝ නොවන බව පත් කරන ලද ගරු මන්ත්‍රීතුමා පිළිගන්නවා. අපේ මුතුන්මිත්තන්ගේ දේ පරම්පරාවෙන් පරම්පරාවට දීම නොව විදේශීය කොම්පැනිකාරයන්ට දීමටයි, එතුමා බලාපොරොත්තු වන්නේ. මේ වගේ පහත් අදහස් උඩ රටක් දියුණු කරන්නට බෑ. කාටත් කැක්කුමක් තිබෙන බව නම් අප පිළිගන්නවා. නමුත් ඇමතිවරුන්ට නම් මේ වගේ යෝජනාව කට මුහුණ දෙන්නට බැරි බව පෙනෙනවා. පත් කරන ලද මන්ත්‍රීවරුන් තබා ගන්නට වුවමනාවක් නැත යන අදහසකුත් අපට මෙම ගරු සභාවේදී ඇසී තිබෙනවා. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන විට පත් කරන ලද මන්ත්‍රීවරුන් ඉවත් කළ යුතු බවට අදහසක් තිබෙනවා.

මේ ආණ්ඩුවේ ඇමති මණ්ඩලය නම් එය සියයට සියයක්ම පිළිගන්න බව, පත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට සලකන හැටියෙන්ම පේනවා නේද?

ඇත්ත වශයෙන්ම අපේ රට දියුණු කළ යුතු නම් ඒ කටයුත්ත භාර දිය යුත්තේ ගොවි මහතුන්ටයි. ඒ කටයුත්ත කොම්පැනිවලට භාර දීමෙන් කිසිම යහපතක් වන්නේ නැහැ. ඒ වගේම ෆෙඩරල් පක්ෂයට යට වී කටයුතු කිරීමෙන් කිසිම යහපතක් වන්නේ නැහැ. ගොවි මහතුන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබා වැඩ කරන්නට ලෑස්ති නම් පමණයි, අපට ඒ කටයුත්ත සාර්ථක කර ගන්නට පුළුවන් වන්නේ. මෙය කරන්නට බැරි දෙයක් නොවෙයි. එහෙත් මේ ආණ්ඩුව දුප්පත් ගොවියන්ගේ අයිතිවාසිකම් රකිනවා වෙනුවට සෑම අවස්ථාවකදීම උත්සාහ කරන්නේ ධනපති කොම්පැනිකාරයන්ට ෆෙඩරල් කාරයන්ට වාසිය දෙන්නටයි. [බාධා කිරීමක්] ගොවියන්ට සෙතක් සලසනවා නම් අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථිර කෙළේ ඇයි? අපේ මුතුන් මිත්තන්ගේ කාලයේ තිබුණු තත්ත්වය යළිත් ලබා ගැනීම සඳහා නේද මේ යෝජනාව ඉදිරිපත් කෙළේ? [බාධා කිරීමක්] මා ඒ ගරු මන්ත්‍රීතුමාගේ කථාවට ඇහුම්කන් දුන්නා වාගේම මගේ කථාවටත් ටිකක් ඇහුම්කන් දෙන ලෙස ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. ටිකක් රිදුණාට කරන්නට දෙයක් නැහැ. මුතුන් මිත්තන්ගේ කාලය ආපසු ගෙනෙන්නට යන මන්ත්‍රීවරුන් කොතරම් උනන්දුවක් දැක්වුවත් මේ අන්දමට නම් ඒ කටයුත්ත සාර්ථක කර ගන්නට ලැබෙන එකක් නැහැ. පියාගේ හා පුතාගේ ලේ පිළිබඳ ප්‍රශ්නයත් මෙහිදී සිහිවෙනවා. අපට ඇත්තේ අපේ මුතුන්මිත්තන්ගේ ලේ නම් අප විසින් කළ යුත්තේ මේ කටයුත්ත විදේශීය කොම්පැනිකාරයන්ට භාර දීම නොවෙයි. අප පැවත එන්නේ කොම්පැනිකාරයන්ගෙන් හෝ ෆෙඩරල් කාරයන්ගෙන් හෝ නොව අපේ පැරණි සිංහල මුතුන්මිත්තන්ගෙනුයි. පියාගෙයි, පුතාගෙයි ප්‍රශ්නය තමයි, අපට තවමත් තියෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

අපි දැන් මොහොතකට මේ යෝජනාව ගැන කල්පනා කර බලමු. විශාල ඉඩම් යායවල්, කැලෑ යායවල් නැවත වරක් ගොවිතැන් කිරීම සඳහා ආණ්ඩුවෙන් විදේශීය කොම්පැනිවලට ආරාධනයක් කළ යුතුලු. ඒ ඇයි? ඒ ගොල්ලන්ට ඒ සම්බන්ධයෙන් විශේෂ පුළුවන්කමක්, විශේෂ හුරුවක් තිබෙන නිසා. එහෙම නම් බලමු, ඒ කොම්පැනිවලට තිබෙන පුළුවන්කම, හුරුව මොකක්ද කියා.

කාසන් කම්බර්බැච් කොම්පැනියට මිනිපේ, මයියංගනය කිට්ටුව අක්කර 1,000 ක් දී තිබෙනවා, ගොවිතැන් කරන්න. ඉඩම් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමත්, මිනිපේ ගරු මන්ත්‍රීතුමත් (එච්. එම්. නවරත්න මයා.) මේ ගැන හොඳට දන්නවා. මොකක්ද කරන ගොවිතැන? කොම්පැනිය එතැනට ගොස් සෝදිසි කර බලා කැලේ කපා තිබෙනවා. මහ ලොකුවට මේ ඉඩම් දුන්නෙ මිරිස්, අර්තාපල්, ලූනු ආදි අතිරේක ආහාර ද්‍රව්‍ය නිපදවීමටයි. නමුත් මොකද වුනේ? ඒ කොම්පැනිය භාරව ඕ ග්ලැන්විල් නමැති ඉංග්‍රීසිකාර මහත්මයෙක් ඉන්නවා. මට බොරු කියන්න වුවමනාවක් නැහැ, පුද්ගලයෙක් හැටියට ඒ මහත්මයා නරක කෙනෙක් නොවෙයි. අපි ඉස්සෙල්ලම කී කරුණක් දැන් ඒ ගොල්ලන්ට අවබෝධ වෙලා තියෙනවා. කොච්චර යන්ත්‍ර උපකරණ තිබුනත් මිනිසුන් නැතිව ගොවිතැන් කරන්න බැරි බව දැනුයි, ඒ ගොල්ලන්ට අවබෝධ වෙලා තියෙන්නෙ. අපට කොයි තරම් ඉඩම් දුන්නත්, විදේශ විනිමය දුන්නත්, උපකරණ දුන්නත් මිනිසුන් නැතිව කොහොමද ගොවිතැන් කරන්නෙ කියා දැන් ග්ලැන්විල් මහත්මයා අහනවා. වහලුන් වගේ වැඩ කරන කම්කරුවන්—තේ වතුවල වැඩ කරන පිරිස වගේ අය—මිනිපේ, මහියංගනය පැත්තෙ නැහැ. මිනිසුන් නැතිව ගොවිතැන් කරන්නට කොයි තරම් උත්සාහ කළත් ඒක හරියන්නෙ නැහැ. දැන් ඒ ග්ලැන්විල් මහත්මයා කියා සිටිනවා, මේ ඉඩම් දුන්නට මදි, කුලියට කම්කරුවන් ලබා ගැනීමට ක්‍රමයක් ආණ්ඩුව මගින් යොදා දෙන්න ඕනෑය, එසේ නැතිව මේක කරන්න බැරිය කියා. මේවා ලේබර් ඉන්ටෙන්සිව් ක්‍රොප්ස්, (labour intensive crops) ලේබර් (labour) නැතිව කරන්නෙ කොහොමද කියා ග්ලැන්විල් මහත්මයා දැන් අහනවා. ලේබර් කියන්නේ වැඩ කරන ජනතාවයි—කම්කරු ජනතාවයි. අපේ මුතුන් මිත්තන්ගේ කාලයේදී විදේශිකයන්ට වහල් වෙලා නොවෙයි, අපේ මුතුන් මිත්තන් කටයුතු කළේ. මේ රටේ සිංහලයන් හැටියටයි, ඒ අය ජීවිතය ගෙනිච්චෙ. එළාර රජතුමාගේ ද්‍රවිඩයන්ට විරුද්ධව ඒ අය සටන් කළේ ඒ නිදහස ආරක්ෂා කර ගන්නයි. ඒ නිදහස ආරක්ෂා කර ගන්නයි, දැනටත් අපි ඒ සටන ගෙන යන්නෙ. ඒ සටනට එන්න ලෑස්ති තවත් යෝධයො ඉන්නවා.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය සහ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, and Minister of Planning & Economic Affairs)

තමුන්නාන්සෙගෙ සටන ගැන මම දන්නවා. [බාධා කිරීමක්]

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*

(Mr. F. R. Dias Bandaranaike)

ඔය තර්ක මහජනයා පිළිගන්නෙ නැහැ. පියාගෙ ලොකුකමවත් මහජනයා පිළිගන්නෙ නැහැ. මහජනතාවගේ පිළිගැනීම උඩයි, ඒවා කරන්න තියෙන්නෙ. මම ගරු අගමැතිතුමාට පෞද්ගලිකව හුඟක් ආදරෙයි. නමුත් සමහරවිට ඉදිරිපත් කරන තර්ක නුවනට හුරු නැති බවයි, කියන්නෙ. ආර්ථික ප්‍රශ්නය උඩ පැරදුනාය කියනවා. බඩු මිළ ප්‍රශ්නය අපේ කාලයෙත් තිබුනා. නමුත් අතුරු මැතිවරණ අපි එකින් එකටම දිනුවා. කුණු කරවල තියෙද්දී අපට කොච්චර බැණුම් අහන්න සිදු වුනාද? ඔය ප්‍රශ්නය නිසා නොවෙයි, වැඩේ වැරදුනේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රට ස්වයංපෝෂිත කරන්න වුවමනා නම් කොම්පැනි කාරයන්ට ඉඩම් දුන්නට වැඩක් වෙන්නෙ නැහැ. ඒ දවස්වල ඉංග්‍රීසි කාරයෝ නුවරඑළියේ, වලපනේ ආදි පළාත්වල තේ වතු ලක්ෂණට හැදුව. කොහොමද කළේ? ආණ්ඩුවෙන් විශේෂ ආධාරයක් ලැබුනා. වහල් ජනතා වක් වශයෙන් වැඩ කිරීමට සිංහල ජන තාව ලැස්ති නැහැ. එදා ඒ තේ වතුවල වැඩ කිරීමට මදුරාසියෙන් පිරිසක් ගෙන් වාගෙන ඔවුන් මෙහි පදිංචි කරවා ගත්ත. ඉතාමත් සුළු මුදලකට ඔවුන්ගෙන් වැඩ ගත්ත. ඒ දවස්වල ට්‍රැක්ටර් තිබු නෙ නැහැ. එදා කඳුකරයේ සම්පූර්ණ යෙන් තේ වගා කර ගත්තෙ ඒ කම් කරු ජනතාව වහලුන් වගේ වැඩ කරන් න ලැස්තිව සිටි නිසයි. නමුත් අද මේ කුඩා ලංකාවේ ඒ වගේ තත්ත්වයක් තියෙනවද? ඉඩම් දෙනවය, උපකරණ දෙනවය කියා කොම්පැනි කාරයන්ට ආරාධනා කළාම ඒ අය ඉස්සෙල්ලා වැඩේ භාර ගත්ත. නමුත් භාර අරගෙන කිව්වෙ මොකක්ද? අපි භාර ගන්නම්, නමුත් අපට පාඩුවක් තිබෙනව නම් ඒක "ටැක්ස් ලොස්" එකක් හැටියට සලකා ආදායම් බදු දෙපාර්තමේන්තුවට පාඩුව පෙන්වා ඒ පාඩුව අනික් ලාභවලින් අඩු කර ගන්නට ඉඩ දෙන්න ඕනෑය කිව්ව. එහෙම දුන්නම ඒකෙන් කිසි පාඩුවක් නැහැ. ඒ විධියටයි, වැඩේ භාර ගත්තෙ.

මුසාජී කොම්පැනියත් ගත්තා, තවත් ඉඩම් කෑබෙල්ලක්. ඒ අයටත් අක්කර දාහක් පමණ දී තිබෙන බවයි දැන ගන් න තිබෙන්නෙ. කාසන් කම්බබැච් කොම් පැනියට වඩා ටිකක්වත් මුසාජී කොම්පැ නිය හොඳයි කියන්න පුළුවනි. ඊටත් වඩා ටිකක් දැනටමත් එලි කර පිරිසිදු කර තිබෙනව. ඒ කොයි හැටි වෙතත්, අද දක්වා යමක් නිෂ්පාදනය කර තිබෙ නවද? දැනටමත් අවුරුද්දක් තරම් ගත වී තිබෙනව. එහෙත් තත්ත්වය ඔය ආකාරයටයි තිබෙන්නෙ. ගම්බද ගොවි මහත්මයෙකුට හේන් කොටන්න දුන් නත් අවුරුද්දකින්—පළමුවන අවුරුද්දෙ දිම—යම්කිසි ප්‍රතිඵලයක් ලැබෙනව. එහෙත් මේ උදවියට කිසිම දෙයක් පෙන්වන්න තිබෙනවද? එකක් නම් කියන්න පුළුවනි. පිටරටවලින් ගෙන්වා ගත් "කෝටා" එක—පංගුව—වැඩි කරවා ගත්තා මිස එහි අඩුවක් නම් නොවූ බව ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණි ස පෙන්වා දෙන්න කැමතියි.

මොකක්ද මේ කොම්පැනි දැන් කියන්නෙ? අප භාර ගත් පරිදි සුළු ආහාර ද්‍රව්‍ය වර්ග නිෂ්පාදනය කරන තුරු වෙන යම්කිසි කෘෂිකාර්මික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්න සූදානම් විය යුතුයි. ඒ විධියටයි කියන්නෙ. විශේෂයෙන්ම දැන් කුකුළන් ඇති කරන්න උත්සාහ යක් දරනව. "ඕප්—ලිටර්" ඇති කරනව. කුකුළු කූඩු හදනව. බිත්තර නිෂ්පාදනය කරනව. දැන් කියනව එළ හරක් ඇති කරන්න ඕනෑය කියා. බටර් හදමු, චීස් හදමු ආදි වශයෙන් කියනව. දැන් මී හරකුන් ගෙන්වන්නත් යනව. තවත් දාහක් ගෙන්වන්න බලාපොරොත්තු වෙනවය කියනව. ගරු ආහාර ඇමතිතුමා ඉන්දියාවෙන් හරකුන් දහක් ගෙන් වන්න යනවා ඇති. ඒ සඳහාද මේ ඉඩම් දෙන්නෙ? නැහැ, සුළු ආහාර ද්‍රව්‍ය නිෂ් පාදනය කරන්නයි දෙන්නෙ. එහෙත් මෙතෙක් ඒ සම්බන්ධයෙන් කර තිබෙන්නෙ මොනවද? අද දක්වා ඒ කිසිවක් නිෂ්පාදනය කර නැති බවයි අපට කියන්න තිබෙන්නෙ. මේ ගැන මීට පෙර ප්‍රසිද්ධියේම ආණ්ඩුවට අප කියා තිබෙනව. මේ ආණ්ඩුවේ පළමුවැනි රාජාසන කථා විවාදයේදී ප්‍රසිද්ධියේම මේ ගැන කියා තිබෙනව. මේවා මීට පෙර අප නොකී කරුණු නොවෙයි. අවුරුද් දෙන් අවුරුද්ද මේ ගැන අප කියා සිටි නව. මේ කාර්යය සාර්ථක ප්‍රතිඵල ලැබෙ න ආකාරයට කරන්න ලැබෙන්නෙ ඔය ක්‍රමයට නොවන බව අප විසින් වරින් වර මතක් කර දී තිබෙනව. ගොවි මහත් වරුන් කෙරෙහි නියම විශ්වාසයක් තබා ක්වයුතු කිරීමෙන් පමණයි මේ රට හදන්න පුළුවන් වන්නෙ, යන අදහස මීට පෙර නොයෙක් වර අප විසින් පැහැ දිලි ලෙස ප්‍රකාශ කර තිබෙනව. මේ ගැන අප එදත් කිව්වා, අදත් කියනවා වගේම ඉදිරියටත් කියන්න සිදු වේවි. මේ ආණ් ඩුව තිබෙන තුරු පමණක් ඔය වැඩ පිළිවෙළ කරගෙන යනු ඇතැයි කියන්න පුළුවනි. එහෙත් ආණ්ඩුව වෙනස් වන දවසක දැන් ඔය කොම්පැනිවලට අවුරුදු විසි පහේ බද්දට දී තිබෙන ඉඩම් අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

විසින් ආපසු ගන්න බවත් ඔය තත්ත්වය වෙනස් කරන බවත් ප්‍රසිද්ධියේම කියන්න කැමතියි. කොම්පැනිවල දැන ගැනීම සඳහා ඒ කාරණය ප්‍රසිද්ධවම කියන්න ඕනෑ. අප බලයට පත් වූ පසු එක මොහොතකටවත් ඔය කොම්පැනිවලට ඔය ඉඩම් තබා ගැනීමට ඉඩ දෙන්නෙ නැහැ. කිසිම වන්දියක් නොගෙවා ඒවා ආපසු ගන්නටයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අදහස් කරන්නෙ. මෙවැනි ව්‍යාපාර මේ රටට හානිකර බව අපේ පිළිගැනීමයි. මේ කොම්පැනිවලට මේ ඉඩම්වල මාර්ගයෙන් නොයෙක් විධියට සූරා ගැනීමට ඉඩ ලැබෙන්නෙ මේ ආණ්ඩුව පවතින කාල සීමාව තුළ පමණයි. ඒ බව දැනගෙන ක්‍රියා කරන්නයි කියන්නෙ. මේ ආණ්ඩුව තවත් අවුරුදු විසි පහක් ගත වනතුරු පවතිනු ඇතැයි යන විශ්වාසයක් තබාගෙන සුදුවක යෙදෙන්නාක් මෙන් ක්‍රියා කිරීම අනතුරුදායකයි. කොම්පැනිකාරයන් මේ සම්බන්ධයෙන් තබන බලාපොරොත්තුව සුදුවකදී ඔට්ටු අල්ලන්නාක් වැනි දෙයක් බව කියන්න ඕනෑ. 1965 අයවැය විවාදයේදීත් මේ කාරණය කී බව මතක් කරන්න කැමතියි. මෙය අමුතුවෙන් දැන් කියන දෙයක් නොවෙයි.

පත් කරන ලද ගරු මන්ත්‍රීවර රත්නපාල දෙස්තර මහත්මයා නවීන ක්‍රම ගැන සඳහන් කළා. ජපානය, ෆෝර්මෝසාව සහ වෙනත් රටවල නවීන ක්‍රම ගැන එතුමා කියා සිටියා. උන්නැහේ හිටපු අග්‍ර විනිශ්චයකාර බස්නායක මහත්මයාගේ ගෝළයෙකැයි මා හිතනව. බස්නායක උන්නැහේ බිත්තර වී තොගයක් ලබා ගෙන "දවස" පත්‍රය මගින් බෙදා ගෙන යනව, ගොවි මහත්වරුන් අතරේ. උන්නැහේ හොඳ සපත්තු දෙකක් එහෙම දමාගෙන බොහොම ප්‍රයෝජනවත් ලෙස වැඩ කරගෙන යන බව අහන්න ලැබීම ගැන ඇත්ත වශයෙන්ම අප සතුටුයි.

කෘෂිකර්මය ගැන මට ටිකක්වත් කරුණු දැන ගන්න ලැබුණේ ඒ අමාත්‍යාංශයේ වැඩ කටයුතු භාර ගැනීමෙන් පසුයි. මා ඒ කාලයේදී ඕනෑකමින් සෝදිසි කර කරුණු ඉගෙන ගත්තා. මා දන්න හැටියට වෙන රටවල බිත්තර වී වලින් ලංකාවේ හරියාකාර වී නිෂ්පාදනය කරන්න බැරි බව කියන්න පුළුවනි. මට දැන ගන්න ලැබුණේ එහෙමයි. මා විශේෂඥයකු නොවන නිසා අනුන් ගෙනුයි ඒ කරුණු අසා දැන ගන්න මට සිදු වුණේ. ආහාර හා කෘෂිකර්ම සංවිධානයක් තිබෙනව, එක්සත් ජාතීන්ගේ සංගමයට අයිති. ඒ මගින් ජපානයෙන් විශේෂඥයන් ස්වල්ප දෙනකු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දී තිබෙනව, ආධාරයක් වශයෙන්. ඒ අය දැන් අවුරුදු ගණනාවක් පේරාදෙනියේ වැඩ කරගෙන යනව. 1963-64 අවුරුද්දෙත් පේරාදෙනියෙයි ඒ අය සිටියෙ. පත් කරන ලද ගරු මන්ත්‍රීවර රත්නපාල දොස්තර මහත්මයාගේ දැන ගැනීමටයි මා මෙය කියන්නෙ. බුසලකින් බුසල් 80 ක් 90 ක් ලබා ගන්න ජපන් රටේදී පුළුවන් නම් ඇයි ලංකාවේ අපට බැරි? මට ඒ සම්බන්ධයෙන් ඉතාමත් පැහැදිලි පිළිතුරු ලැබුණා. ජපන් රටේ නිෂ්පාදනය කරන බිත්තර වී හුරු වී තිබෙන්නේ එක්තරා ක්‍රමයකටයි. දවල් කාලයත් රාත්‍රි කාලයත් එක හා සමානව ඇති වෙනවා නම් ඒ බිත්තර වී නිෂ්පාදන ක්‍රමයට ඒ තත්ත්වය සුදුසු නැහැ. එය සුදුසු වන්නෙ වාරයෙන් වාරයට දිවා රාත්‍රි කාල සීමාව දීර්ඝ වන හා කෙටි වන ක්‍රමයේ හැටියටයි. ජපන් රටේ ජූනි ජූලි මාසවල ඉර පායන්නෙ පාන්දර තුනට පමණ වෙලාවටයි. ඉර බහින්නෙ හැන්දෑ ජාමයේ 10 ට පමණ වෙලාවටයි. ඒ අනුව පෙනී යනවා දවල් කාලය දීර්ඝ බව. රාත්‍රි කාලය හුඟක් කෙටියි. දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාල සීමාව තුළ රාත්‍රි කාලය බොහෝම දීර්ඝ වෙනව. ඒ වාගේම දවල් කාලය බොහෝම කෙටි වෙනව. ඒ රටේ තත්ත්වය එහෙමයි. නමුත් අපේ කුඩා ලංකාවෙ එහෙම තත්ත්වයක් නැහැ. පැය $11\frac{1}{2}$ ක් 12 ක් පමණ දිවා රාත්‍රි කාල සීමාව එක හා සමාන වෙනව. ඒ ක්‍රමය පැහැදිලිව සිංහලෙන් කියන්න මට අපහසුයි. එයට ඉංග්‍රීසියෙන් කියන්නෙ Photo-synthetic Element කියලයි. ඇත්ත වශයෙන්ම ඒ හේතුව උඩ තමයි යල් කන්නයට පමණක් ලංකාවෙ බොම්බයි ලූනු නිෂ්පාදනය කරන්න පුළුවන් වී තිබෙන්නෙ. මාස් කන්නයට බැහැ. ඒ කියන්නෙ අර වැඩි පුර පැශ භාගයක් අව්ව ලැබෙන නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම නිසා, කථානායකතුමනි, ඔන්න ඔය කරුණු ගැන හරි හැටි බලන්න ඕනෑ. ජපන් රටේ බුසලකට අසූවක අස්වැන්න ගන්න පුළුවන් නම් අපේ රටේ බැරි මොකද කියා නිකම්ම කථා කළාටවත්, බස්නායක මහත්මයා "දවස" පත්‍ර මාර්ගයෙන් නොමිලේ බිත්තර වී බෙදා දුන්නාටවත්, ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ඒකෙන් සිද්ධ වෙන්නෙ ගොවි මහත්වරුන් තව දුරටත් විනාශ වීම පමණයි. පුළුවන්කමක් තිබෙනව නම් එයින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත්තට අපි විරුද්ධ නැහැ. අපේ රටේ කුඹුරුවල අස්වැන්න වැඩි කර ගන්නවට කවුද විරුද්ධ වෙන්නෙ? අපි බොහෝම කැමතියි.

අපේ අගමැතිතුමා 1965 දි කිව්ව— උන්නැහෙගෙ පියාගෙ කාලෙදිවත් කල්පනා කළේ නැහැ සහල්වලින් රට ස්වයංපෝෂිත කරන්න පුළුවන් වේවිය කියා— නමුත් අගමැතිතුමා 1965 අයවැය සාකච්ඡා වන අවස්ථාවෙදි කිව්ව, "නවීන ක්‍රම උපයෝගී කර ගැනීමෙන් අවුරුදු ස්වල්පයක් ඇතුළත අපේ රට සහල්වලින් ස්වයංපෝෂිත කර ගැනීමට පුළුවන් බව මට විශ්වාසයි" කියා. ඒ අදහස ඉතාමත් වැදගත් අදහසක් හැටියට අපි භාර ගන්නව. එය අද ඉතාමත්ව අවශ්‍ය දෙයක්. එය ක්‍රියාත්මක කරන්න පුළුවන්නම් මුළු රටම එතුමාට ණයගැති වෙනවා ඇති. නමුත් මොකක්ද තත්ත්වය? තවම එක්සත් ජාතික පක්ෂය කථා කරන්නෙ අපේ වැරදි ගැනයි. දැන් අවුරුදු දෙකක් ගත වී ඇති නමුත් තවමත් කිසිම වැඩිදියුණුවක් නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
දෙකක්වත් නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
එහෙනම් දෙකක් ගත වුණා නම් ඊටත් වඩා නරක තත්ත්වයක් ඇති වේවි.

බලන්න තමුන්නාන්සේලාගේ මුදල් තත්ත්වය දෙස. ණයත් අරගෙන ඒවත් කා දමා දැන් කිසිම ඉතුරුවක් වී නැහැ. භාණ්ඩාගාරය හිස්. ඒ පිළිබඳව තමුන්නාන්සේලාට පිළිතුරු රටෙන් ලැබේවි. දැනටත් ලැබී තිබෙනව. අතුරු මැතිවරණ තව ඉදිරියටත් තිබෙන නිසා එය දැනගැනීමට තවත් අවස්ථාව ලැබේවි. අපි මේක ලොකු ජයග්‍රහණයක් හැටියට ගණන් ගන්නෙ නැහැ. අපේ සිංහලකම නැති කර ගත්නවත් අපේ මුතුන් මිත්තන්ගෙ අයිතිවාසිකම් නැති කරගන්නවත් අප කාටවත් වුවමනාවක් නැහැ. ඒ අනුව අපේ වෛද්‍යාචාර්ය රත්නපාල මන්ත්‍රීතුමාට මම බොහෝම ස්තුතිවන්ත වෙනව මේ අවස්ථාවෙදි මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන.

වෛද්‍යාචාර්ය රත්නපාල මන්ත්‍රීතුමාගෙ කථාවෙන් අප කාටත් අවබෝධ වුණා, පසුගිය අවුරුදු හය හත ඇතුළත කිසිම දෙයක් ආහාර නිෂ්පාදනය අතින් මේ රටේ සිදු වී නැත කියා. මම පිළිගන්නව යම් යම් දුර්වලකම් තිබුණ බව. මම පළමුකොටම ඒ ගැන කිව්ව, ධීවර ඇමති පිලිප් ගුණවර්ධන මැතිතුමාත්, ඉඩම් ඇමති සී. පී. ද සිල්වා මැතිතුමාත් අතර පවතින තත්ත්වය අනුව සමහර විට අපේ අගමැතිතුමාට "රිෆ්පල්" එකක් මදි වේවි ඒ ලෙඩේට. හොඳයි, ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ ඇමතිවරුන් දෙන්න ඒ කාලෙදිත් කොටා ගත්ත. අද තවමත් කොටා ගන්නව. සමහර විට කැබිනට් මණ්ඩලයෙදි ගහගන්නව. අද තත්ත්වය ඒකයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම එකක් කැබිනට් මණ්ඩලයෙ නැහැ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
මම දන්නව. ඊට පහුවෙනිද අසනීප වුණා. මොකක්ද කාරණය? ඉන්දියාවට විදුලි බලය විකිණීම ගැනයි. අගමැතිතුමාට මතක නැද්ද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම සාකච්ඡාවක්වත් තිබුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ධීවර ඇමතිතුමත් ඉඩම් ඇමතිතුමාත් අතරෙ ඇති වුණා. අගමැතිතුමා එදා හිටියෙ නැද්ද? කොපමණ රහසෙ තබාගත්තත් ඔව ගැන අපටත් ඔත්තු ලැබෙනව.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

යෝජනාවට අදාළ කාරණා ගැන මිසක් ඉන් පිටස්තර කරුණු ගැන කථා කිරීමට මෙය අවස්ථාවක් නොවන බවත්, එවැනි කරුණු ගැන කථා කිරීමෙන් වැළකී සිටිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමාට මතක් කරනව.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

මම ඒ ගැන විස්තර කියන්නෙ නැහැ. මම මතක් කෙළේ කථානායකතුමනි, මේ තත්ත්වය පිළිබඳව ඒ කාලයෙදී වූ පටන් ගැනීම පමණයි. එදා තත්ත්වය ගැන පමණයි මම කථා කරන්නෙ. එදා එතුමා මොකක්ද කිව්වෙ? පිලිප් ගුණවර්ධන මන්ත්‍රීතුමා අවිස්සාවේල්ල මන්ත්‍රීතුමා හැටියට දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කැබිනට් මණ්ඩලයේ සිටියදී කියා සිටියා, මේ රට කෘෂිකර්මය අතින් කවදාවත් දියුණු කරන්නට බැරිය, සී. පී. ද සිල්වා වැනි පුද්ගලයන් ඉඩම් ඇමති අංශය භාරව සිටින තුරු කියා. වතුර නොදෙනවා නම් කොහොමද කෘෂිකර්ම කටයුතු කරන්නෙ? කුඹුරු පනතට විරුද්ධ වුණු ප්‍රධාන පුද්ගලයා සී. පී. ද සිල්වා ඇමතිතුමා බවයි එදා කීවෙ. එතකොට සී. පී. ද සිල්වා, උන්නැහැට මොකද කිව්වෙ? එදා පාවිච්චි කළ වචන මම හිතන හැටියට පාර්ලිමේන්තු වරප්‍රසාද යටතෙවත් පාවිච්චි කරන්න බැහැ. ලොම්බ, පොච්චය වාගේ වචන පාවිච්චි කළ බව මට මතකයි. ඔන්න ඔය විධියෙ තත්ත්වයක් යටතෙයි ඒ කාලයෙදි කෘෂිකර්මය දියුණු වුණෙ. නමුත් ඇත්ත වශයෙන්ම ඒ කාලයෙදි මොකක්ද සිද්ධ වුණේ?

ගරු කථානායකතුමනි, ඒ කාලයෙදි අක්කර තිස් දහසකට වැඩි බිම් ප්‍රමාණයකට වාරිමාර්ග පහසුකම් සැපයීමේ වශකීම පැවරී තිබුණෙ සී. පී. ද සිල්වා ඇමතිතුමාගෙ අමාත්‍යාංශයටයි. පිලිප් ගුණවර්ධන මහතා ඇමතිවරයා වශයෙන් සිටිද්දී රසායනික පෝර යෙදීමෙන් කුඹුරු අස්වැනු ප්‍රමාණය අක්කරයකට බුසල බැගින් අවුරුද්දෙන් අවුරුද්ද වැඩි කරගෙන යාමට හැකි වුණු බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි. ඒ ඇමතිතුමාගෙ වැඩ පිළිවෙළ උඩයි එසේ වැඩි කරගෙන යාමට හැකි වුණේ. සාමාන්‍යයෙන් මේ අවුරුදු 7 තුළ අක්කරයකින් ලැබුණු අස්වැනු ප්‍රමාණය දළ වශයෙන් වී බුසල් හයකින් හෝ හතකින් වැඩි වී තිබෙන බව මම ආඩම්බරයෙන් ප්‍රකාශ කරනව.

කොහොමද මෙසේ වැඩි කර ගත්තෙ කියන කාරණය සොයා බැලීම වැදගත්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ සිටිනව වීරත්න නමැති කෘෂිකර්ම උපදේශක මහත්මයෙක්. මේ මහත්මය කෘෂිකර්මය පිළිබඳව විදේශික රටකින් පුහුණුවක් ලැබූ හෝ විදේශීය රටක පර්යේෂණ පැවැත්වූ මහත්මයෙක් නොවෙයි. මහඉලුප්පලමෙ ගොවිපලේ කෘෂිකර්මය පිළිබඳව පුහුණුව ලබාගත් මහත්මයෙක්. මොහු වයඹ පළාතේයි විශේෂයෙන්ම කෘෂිකර්ම කටයුතු කළේ. එසේ වැඩ කරද්දී එතුමාට පුළුවන් වුණා එච්. ඕ. නමැති අලුත් බිත්තර වී වර්ගයක් නිෂ්පාදනය කරන්න. මෙය විදේශයකින් ගෙන්වා ඉගෙන ගත් අලුත් දෙයක් නොවෙයි. වීරත්න මහත්මයා උසස් නිලධාරියෙක් හෝ විදේශික රටකින් උපාධියක් ලබාගත් කෙනෙක් නොවෙයි. කෙසේ වුණත් ඒ මහත්මය කළ පර්යේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් සොයා ගත් එච්. ඕ. නමැති බිත්තර වී වර්ගය නිසා තමයි ඒ යුගයේදී වැඩි තරමක් කෘෂිකර්මය අතින් දියුණුවක් ලබාගත හැකි වුණේ.

ගරු කථානායකතුමනි, වෛද්‍යාචාර්ය රත්නපාල පත්කළ මන්ත්‍රීතුමා විශේෂයෙන්ම රසායනික පෝර ගැන, අලුත් රසායනික පෝර වර්ගයන් ගැන සඳහන් කළා. රසායනික පෝරවල වෙනස්කම් ගැන කථා කළත් මා දන්නා හැටියට ලෝකයේ ඕනෑම රටක ඕනෑම කුඹුරකට රසායනික පෝර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යොදනවා නම් වර්ග තුනක් මිශ්‍ර කිරීමෙනු යි ඒ පෝර වර්ගය සාදා ගන්නෙ. එම වර්ග තුන නම් පොටෑසියම්, නයිට්‍රජන් සහ පොස්පරස් යන වර්ග තුනයි. ඔය තුන් වර්ගය මිශ්‍ර කර තමයි පෝර සාදා ගන්නෙ. මේ වර්ග තුන නොයෙක් නොයෙක් ආකාරයෙන් නොයෙක් නොයෙක් ක්‍රම වලින් ලබාගන්නවා. කොයි අන්දමින් ලබා ගත්තත් ඔය වර්ග තුන තමයි රසායනික පෝර වශයෙන් යොදන්නෙ. සමහරු යූරියා ගැන, සමහරු ඇමෝනියම් නයිට්‍රේට් ගැන, තවත් සමහරු ඇමෝනියම් සල්පේට් ගැන සඳහන් කරනව, ඒ වර්ග පාවිච්චි කිරීම ගැන කථා කරනව. මොනවා පාවිච්චි කළත් මොන නම් යෙදුවත් මුල් වන්නෙ මම කලින් සඳහන් කළ වර්ග තුනයි.

අපි කවුරුත් පිළිගන්නවා අපේ රටේ ප්‍රයෝජනයට ගන්නා පෝර ප්‍රමාණය මදි බව. ඒ වාගේම අපි කවුරුත් පිළිගන්නව, පිටරටවලින් ආධාර ලබාගත හැකි නම්, රසායනික පෝර වැඩි වැඩියෙන් ලබාගත හැකි නම් අපේ ගොවිතැන මෙයට වඩා සාර්ථක වන බව. නමුත් රසායනික පෝර වැඩි වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීමෙන්, ඒ මාර්ගයෙන් අපේ රට විදේශිකයන්ට විකිණීම යුතුද? ඇත්ත වශයෙන් මෙය අපේ රට විදේශිකයන්ට විකිණීමක් හා සමානයි. පෝර ලබාගැනීමේ නියාවෙන් අප විදේශිකයන්ට, විදේශික රටවලට ණය ගැති වනවා නම්, මේ ක්‍රමයට ඔවුන්ගෙන් ආධාර ගලා එනවා නම්, ආධාර දෙනවා නම් ඒ අන්දමින් අපේ වස්තුව, අපේ මුතුන් මිත්තන්ගේ වස්තුව නැති නාස්ති කර දැමීමෙන් නින්දගම් ක්‍රමය නැතිකරන්න කථා කරන අය කරන්නෙ අලුතෙන් නින්ද ගම් ක්‍රමයක් බෝ කිරීමක් නොවේද කියා ප්‍රශ්න කරන්න කැමතියි. මේ ක්‍රමයට ඉඩ සැලසීමෙන් සිඬ වන්නෙ මොකක්ද? ඒ දිනවල තිබුණු නින්දගම් ක්‍රමයටත් වඩා අන්ත නින්දගම් යුගයක් ඇති වීම නොවේද? අනාගතයේදී, අපේ සිංහල ජනතාව කම්කරු ජනතාවක් වශයෙන් අනුන්ට යටත්වී වැඩ කරන්න සිඬ වෙනවා නොවේද? එම නිසා තමයි මා කියා සිටින්නෙ, මෙවැනි අදහස් ඉදිරිපත් කරන කොට මේ අදහස් පිළිගැනීමෙන් ලෙඩේ සුව වෙනවාද නැද්ද කියා පළමුවෙන්ම කල්පනා කළ යුතු බව.

ගරු කථානායකතුමනි, පසුගිය අය වැය විවාදයෙදී—1966 අය වැය විවාදයෙදී— ලෝක බැංකුවේ වාර්තාවක් මා මේ ගරු සභාවෙදි ප්‍රසිද්ධියේ කියවන්ට යෙදුණා. එය මා එදා කියවූ අවස්ථාවෙදි ගරු අග මැතිතුමා පිළිගත්ත, ඒ විධියේ වාර්තාවක් තිබෙන බව. එහෙත්, ඊට පසු එතුමා වහාම නැගිට ගියා මිසක් ඒ ගැන එතුමා යමක් කිව්වෙ නැහැ. මම එය කියෙව්වෙ 1966 අගෝස්තු මාසයෙදියි. ඉන්පසුව ඒ ගැන අපට ඔක්තෝබර් මාසය වන තුරු යමක් අහන්ට ලැබුණෙ නැහැ. අතුරු මැතිවරණ යෙන් ටිකක් පසුව ඒ වාර්තාවේ කොටස් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල වැටෙන්ට පටන් ගත්ත. ගරු කථානායකතුමනි, එය කියවා බලන්න, එක්සත් ජාතික පක්ෂය නිසාද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසාද ආර්ථික අතින් රට විනාශ වී තිබෙන්නෙ කියා. මොකක්ද හේතුව? තේ රබර් පොල් මිල බැසීම තමයි. බැහැල තිබෙන එක ඇත්තයි. ඇයි ඒවායේ මිළ ක්‍රම ක්‍රමයෙන් බහින්නෙ? බහින්ට එක හේතුවක් තිබෙනව. බටහිර රටවලින් විදේශාධාර බලාපොරොත්තු වෙන් සමාජවාදී රටවල් සමග වෙළඳාම අතින් හෝ වේවා ආධාර අතින් හෝ වේවා සම්බන්ධකම් ඇති කර නොගැනීමෙන් මේ ප්‍රතිඵල ලැබෙන බව කරුණාවෙන් පිළිගන්න.

මේ අවුරුද්දෙ මුල හරියෙදි කර්මාන්ත ඇමතිතුමා රුසියාවට ගියා නේද? සෝවියට් රුසියාව වැනි ලොකු රටක් දිහා බලා කර්මාන්ත ඇමතිතුමාට කල්පනා වුණේ නැහැ, ඒ රටෙන් ලංකාවට යම්කිසි විධියක ආධාරයක් ලබාගන්න. බාග වෙලාවට නියෝග ලැබෙන්ට ඇති එවැනි ඉල්ලීමක් කරන්න එපාය කියා. උන්නැහේ රුසියාවෙන් එකම ඉල්ලීමක්වත් කළේ නැහැ. ගිහින් ඉල්ලීමක් කර එය නොලැබුණා නම් අපිට ඇමතිවරයාට දොස් කියන්ට බැහැ. ඉල්ලීමක් කිරීමෙන් පසු සෝවියට් රාජ්‍යයේ ඇමතිවරුන් හෝ ඒ රටේ නිලධාරීන් කිව්ව නම්, "කනගාටුයි, තමුන්නාන්සේට යමක් දෙන්ට අපට ක්‍රම යක් නැහැ" කියා, අපේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා නම්, ආණ්ඩුවටවත්, ඇමතිවරයාට වත් දොස් කියන්ට අපට පුළුවන්කමක් නැහැ. මොකක්ද සිද්ධ වුණේ? ඇමතිවරයා රුසියාවට ගිහින් ලොකුවට කිව්ව, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

ගත් හැටි. රුසියාවෙ ඇමති මණ්ඩලයේ උදවිය ඊට ඇහුම්කන් දීල කිව්ව, "බොහොම සතුටුයි, ලංකා ජනතාවගේ කැමැත්ත අනුව තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බල යට පත්වීම ගැන" කියා. එතැනින් සංග්‍රහ කරල සංචාරය කෙළවර කළා.

අපට ඒ රටවලින් කරන්න ඉල්ලීමක් නැද්ද? අපි එතරම් පොහොසත් රටක්ද? අමෙරිකාව, එංගලන්තය වැනි රටවලින් අපට ආධාර ලබාගන්න හොඳයි. මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කරනව නම් අපට වාසිවන යමක් ඒ රටවලින් ලබා ගන්න පුළුවනි. මේ ආණ්ඩුව දන්නවද, අපේ උතුරෙන් පිහිටා තිබෙන ඉන්දියාවෙන්—දඹදිවින්—තේ රාත්තල් කෝටි 6 ක් පමණ රුසියාව මිළයට ගන්න බව? ලංකාවෙන් මිළයට ගන්නෙ එක කෝටියක් පමණයි. ලංකාවෙන් එක කෝටියයි; ඉන්දියාවෙන් හය කෝටියයි. අපෙන් තේ රාත්තල් කෝටි 3 ක් වත් ගන්ට කියා රුසියාවෙන් ඉල්ලීමක් කරන්ට රජයට බැරිද? එහෙම ඉල්ලීමක් කරල එය ඉටු කර ගන්ට බැරි වුණොත් පාර්ලිමේන්තුවට ඇවිත් කියන්ට පුළුවන්, "රුසියාව අපට විරුද්ධයි, අපට යමක් දෙන්නේ නැහැ" කියා. මධ්‍යස්ථ ප්‍රතිපත්තිය උඩ අමෙරිකාවෙන් පමණක් ආධාර ලබාගන්න හොඳයි. ගන්ට පුළුවන් මිනිහගෙන් ගන්ට ලැහැස්ති නැහැ. ඒකයි, ලෙඩේ. ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ පාලනය යටතේ මේ රට ආර්ථික අතින් අන්ත ප්‍රපාතයට බැස තිබෙන්නෙ මේ රජය මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන නිසා බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි ප්‍රසිද්ධියේ කියනව. ඇයි, බැරි සමාජවාදී රටවලින් ආධාර ලබාගන්න? ඇත්ත තමයි, රුසියාවට අපේ යම් ද්‍රව්‍යයක් විකුණ ගන්ට වුවමනා නම්, අපිත් රුසියාවෙන් යම්කිසි ද්‍රව්‍ය කොටසක් මිළයට ගන්න ඕනෑ. එක පැත්තකින් පමණක් වෙළඳාමක් කරන්ට බෑ. ඒ කියන්නෙ, ට්‍රැක්ටර් යන්ත්‍ර හෝ වේවා, රසායනික පොර හෝ වේවා, ඕනෑම දෙයක් අමෙරිකාවෙන්, එහෙම නැත්නම් එංගලන්තයෙන් පමණක් ගන්ට බලාපොරොත්තු වෙනව නම් ඒ ක්‍රමයට වෙළඳාම් කරන්ට බෑ.

මොකක්ද අද සිද්ධ වී තිබෙන්නෙ? ගාල්ල පළාතෙ, බද්දේගම පළාතෙ, බෙන්තර-ඇල්පිටිය පළාතෙ වැවෙන තේ අපි ප්‍රධාන වශයෙන් වෙළඳාම් කරන්නේ එක්සත් අරාබි ජන රජයට හා ඒ කිට්ටුවෙන් තිබෙන අනික් රටවලටයි. ඒ වෙනුවට අපි ඒ රටවලින් සිමෙන්ති ගන්නව, තෙල් ගන්නව, රෙදි විවීමට නූල් ගන්නව. ළඟකදී මොකක් ද කළේ? වෙළඳ ඇමතිතුමාට කල්පනා වුණා වැඩි ලාභයට ගන්ට පුළුවන්, නූල් ටික නැගෙනහිර අප්‍රිකාවෙන් ගත්තොත් කියා. නැගෙනහිර අප්‍රිකාව තමයි, තේ වෙළඳාම සම්බන්ධයෙන් අප සමඟ තරඟයට කිට්ටුවෙන්ම යන්නෙ. ඉතින් අපි ඒ හතුරගෙන් බඩු ගත්ත, මිතුරගෙන් ගත්තෙ නැහැ. ඕකයි, තත්ත්වය.

රුමේනියාවෙන් සිමෙන්ති ගත්ත. ඊට වඩා අඩු මිළකට එක්සත් අරාබි ජන රජයෙන් සිමෙන්ති ගන්ට තිබුණා. නමුත් ගත්තේ නැහැ, ප්‍රතික්ෂේප කළා. අපේ වෙළඳ අමාත්‍යාංශයෙ මහදැනමුත්තො කියා සිටිය "ඒක නරකයි. සතයකවත් ලාභයක් ඉතුරු කර ගන්ට පුළුවන් නම් මේක වඩා වාසියි" කියල.

මොකක්ද, සිද්ධ වුණේ? තේ දළු වෙළඳාම සම්පූර්ණයෙන්ම කපෝති වුණා. එහි විපාක වින්දෙ කවු ද? සුළු තේ වතු හිමියොයි, කම්කරුවොයි, ඒ පළාත්වල වෙසෙන අයයි. බෙන්තර-ඇල්පිටියෙන්, බලංගොඩින් ඊට පිළිතුරු දුන්න.

මේව අපි කියන්නෙ වාසියක් ලබා ගැනීමට පමණක් නොවෙයි. අපේ මන්ත්‍රීතුමන්ල මේ අදහස් ඉදිරිපත් කරන්නෙ ආණ්ඩුවට තර්ජනයක් වශයෙන් නොවෙයි. මේ ඉල්ලීම් කරන්නෙ ඇහුම්කන් දෙන ඇමතිවරුන්ගෙ සැලකිල්ලට භාජන කරන්නයි. මේ තත්ත්වය වෙනස් කර, අපේ සාමාන්‍ය ජනතාවට සෙතක් කරනු පිණිසයි, මේ ඉල්ලීම් කරන්නෙ.

අපි දන්නව, මේ ප්‍රජාතන්ත්‍රවාදි යුගයෙ උදා වෙලා තිබෙන තත්ත්වය. අවුරුදු ගණනක් සඳහා ආණ්ඩුවක් පත් කරනව. අපි කවුරුත් බලාපොරොත්තු වෙන්නෙ ඒ ආණ්ඩුවෙ දක්ෂතා උඩ රටට ප්‍රයෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනයක් ලැබේය කියලයි. කවුරුවත් බලා පොරොත්තු වෙන්නෙ නැහැ, අකාලයෙ ඒ ආණ්ඩුව පෙරළන්න. එවැනි ප්‍රශ්න යක් නැහැ. එහෙත් මහජනතාව නොයෙක් අවස්ථාවල් තෝරාගන්නවා, ආණ්ඩුව යන ගමන හොඳද නැද්ද යන්න පෙන්වන්ට. දැන් සිදු වී තිබෙන්නෙ ඒකයි. ආණ්ඩුව දැන් භයෙන් වෙව්ලනවා. දැන් සී. අයි. ඩී. ය මිනිස්සු පස්සෙ එළවනවා. පෙඩරල් පක්ෂයට විරුද්ධව යමක් කිව්වොත් ඒක ජාතිවාදි කෝලාහලයක්ය කියනවා. සී. අයි. ඩී. කාරයො එච්චට අපි අපේ කථාවල් නවත්වන්නෙ නැහැ. අපි කවදාවත් යෝජනා කරන්නෙ නැහැ, අපේ රටේ මිනීමැරුම් ඇති කරන්ට. අපට කලකෝලාහල වුවමනා නැහැ. පෙඩරල් පක්ෂය සමඟ ඇති කර ගෙන තිබෙන ගිවිසුම අපේ රටට විනාශයක් සිද්ධ කරන දෙයක් හැටියට පිළිගෙන ඊට විරුද්ධව අපි සදාකාලික සටනක් ගෙන යන බව මේ ගරු සභාවේදී ප්‍රසිද්ධියේ කියන්ට කැමතියි. අපේ රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමාත් ඒ සටනට සහභාගි වන්ට ලෑස්තියි. ඇත්ත වශයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා මුළු මුස්ලිම් ජනතාවම අපේ සටනට අනාගතයෙදි සහභාගි වේය කියල. අපේ අගමැතිතුමත් කියනවා, උන්නැහෙ ලෑස්තියි, පියාගේ පරමාර්ථය ඉටු කිරීම සඳහා කටයුතු කරන්ට. කොච්චර හොඳද ?

අනෙකුත් දේශපාලන ප්‍රශ්න සියල්ලක්ම අමතක කර අපි සිංහලකම උඩ එක්සත් වුණොත් මේ රටට මීට වඩා විශාල යහපතක් අනාගතයෙදි සිදුවන බව මම විශ්වාස කරනවා. අපි එකිනෙකා ඇන කොටා ගන්නවා. සිංහල මිනිසුන් හැටියට අපට තිබෙන දේත් නැති කරගන්ටද, අපි මේ දේශපාලනය ගෙන යන්නෙ ? නෑ. අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිගන්නවා මේ රටට සමාජවාදි ගමනක් අවශ්‍ය බව. එය අවශ්‍ය දෙයක් පමණක් නොවෙයි, ඉබේම වන දෙයක් හැටියටත් අපි පිළිගන්නවා. අපේ දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා පෙන්වා දුන් මාර්ගය ඔස්සේ මේ රටේ සමාජවාදි ගමන ඉබේම වෙනවා. කාටවත් එය වළක්වන්ට බෑ. ධනේශ්වර පක්ෂයකට හෝ වේවා, විදේශීය බලපෑම්වලට හෝ වේවා, මේ කුඩා ලංකාව නැවත වරක් කවදාවත් යටත් කරගන්ට බෑ. අපි සිංහලයන් හැටියට වැඩ කරන්න ලෑස්ති නොවෙනවා නම් අපි අප අතර ඇති භේද උඩ ඇත්ත වශයෙන් ම අද රට පාලනය කරන අගමැතිවරයා වන චෙල්වනායගම් මහතාට රටින් එක්තරා පළාතක් යටත් කරවන්න බලාපොරොත්තු වෙනවා නම්, කිසිම ඇවිස්සීමක් නැතුව කවදාහරි මේ ලංකාවෙ ජාති බේද කෝලාහල ඇති වෙනවාය කියන ඒකාන්ත විශ්වාසය අප තුළ පවතින බව මෙම අවස්ථාවේදී කනගාටුවෙන් නමුත් ප්‍රකාශ කරන්ට සිදු වී තිබෙනවා.

මා කතා කරමින් සිටියෙ වෛද්‍යාචාර්ය රත්නපාල පත් කළ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති, මේ රටේ කෘෂිකර්ම කටයුතු දියුණු කිරීමට අදාළ වන බව කියන යෝජනාව සම්බන්ධයෙනුයි. ඒ මන්ත්‍රීතුමාගෙන් මා අහනවා ප්‍රශ්නයක්. එතුම කියා සිටින්නෙ විශාල ඉඩම් යායවල් ගොවිතැන් කටයුතු වලට යෙදවිය යුතු බවයි. ඊට "large-scale farming" යනුවෙන් ඉංග්‍රීසියෙන් කියනවා. මේ රටේ තිබෙන ඉඩම් කැබෙලිවලට කඩා ඒවා කොටස් වශයෙන් ගොවීන්ට දෙනවට වඩා හොඳ බව කියනවා විශාල ඉඩම් යායවල් වගා කරන්ට කොම්පැනිවලට භාර දීම ; බදු දීම. [බාධා කිරීම්] ඕනෑ වචනයක් පාවිච්චි කරන්ට පුළුවනි. විදේශීය කොම්පැනිවලට පූජා කළත් වෙනසක් නැහැ.

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

එහෙම කීවෙ නැහැ. ගොවීන්ට දීල ඉතිරි වන ඉඩම්.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ඒ මන්ත්‍රීතුමා අදහස් කරන්නෙ මේ රටේ ඉඩම් නොමැති ගොවීන් සියලු දෙනාටම ඉඩම් බෙදා දුන්නායින් පසු ඉතිරි වන ඉඩම් කොටස් කොම්පැනිවලට භාර දීම වෙන්ට පුළුවනි. අපේ කොට්ඨාශවල ඉඩම් නොමැති සැම දෙනාටම ඉඩම් බෙදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

දුන්නාට පසු ඉතිරි වන ප්‍රමාණය වෙල්වනායගම් මහතාට භාර දුන්නත් අපි විරුද්ධ වන්නෙ නැහැ. අපි කතා කරන්නෙ අපේ රටේ ඉඩම් නොමැතිකමින් කෑ ගහන දුක් විඳින, ජනතාව වෙනුවෙනුයි. අපේ ඡන්දදායක කොට්ඨාශවල ඉඩම් නොමැතිකමින් දුක් විඳින ජනතාවට ඉඩම් බෙදා දී ඉතිරි වන ප්‍රමාණය කොම්පැනිවලට දෙන්න කියනව නම් මම ඇත්ත වශයෙන්ම කියා සිටිනව "කොම්පැනිවලට දෙන්ට එපා ; ෆෙඩරල් කාරයන්ට දෙන්න" යනුවෙන්. මට ඒකෙ වෙනසක් නැහැ. අපි බලාපොරොත්තු වෙන්නෙ ලංකාවෙ ඉඩම් ප්‍රමාණය ආරක්ෂා කර ගැනීමටයි.

මා දැන් කතා කරගෙන ගියෙ large-scale farming කියන වචන ගැනයි. රජය ප්‍රතිපත්තියක් වශයෙන් අක්කර සිය ගණන්, දහස් ගණන් සංවර්ධනය කළ යුතුයි. මේ රට ස්වයංපෝෂිත කිරීමට. මා ප්‍රථමයෙන්ම ප්‍රශ්න කර සිටිනව large-scale farming පවත්වාගෙන යන්න රජයට බැරි මොකද කියා. රජය කරන අයට විදේශීන්ට වඩා මේ රට ගැන කැක්කුමක් නැද්ද? විදේශීන්ට අපේ රට ගැන කැක්කුමක් තිබෙනවද කියා අපි දන්නෙත් නැහැ. මේ ආණ්ඩුවට—එක්සත් ජාතික පක්ෂයෙ ආණ්ඩුවට—ආසාවක් නැද්ද, අපේ රට කෘෂිකර්මය අතින් දියුණු කිරීමට? ඒ අයට රට ගැන කැක්කුමක් නැද්ද?

ඉස්සර තිබුණ එක්තරා තර්කයක්. ආණ්ඩුවෙ ගොවිපොළවලින් කවදාවත් ලාබ උපදවන්න බැරිය කියන තර්කය ඉස්සර තිබුණ. ආණ්ඩුවෙ ගොවිපොළවල සැමදාම සිදු වන්නෙ වැරදි. ඒවායින් දිගටම සිදු වන්නෙ පාඩුමයි. එක අවුරුද්දකින්වත් ලාබයක් ලැබුණෙ නැහැ. ඒකයි ඉස්සර තිබුණු තර්කය. අවුරුදු 13 ක් තුළ කෝටි 4 ක් පමණ අපේ රජය පාඩු වින්ද බව කියනව, ගොවිපොළවලින්. ඒ ගොවිපොළ ක්‍රමය පටන් ගත්තෙ. ඩී. එස්. සේනානායක අගමැතිතුමාගෙ කාලෙදියි. මේක 1963 දක්වා කෙරීගෙන ආවා. මම මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් වචනයක් ප්‍රකාශ කරන්ට කැමතියි. මේ ගැන තමුන්නාන්සෙල ටිකක් සෝදිසි කර බලන්න. මේ ගැන අසා බලන්න තමුන්නාන්සෙලගෙ ආහාර ඇමතිතුමාගෙන්. මේ රටේ තිබෙන රජයේ ගොවිපොළවල දිගටම කෙරුණු පාඩු ලාබ බවට පරිවර්තනය කළේ මමයි. ඒක කොහොමද කළේ? සමහරු කීව, අපට කම්කරු පිරිස් වැඩි බව. ආණ්ඩුවෙන් වේතන ලබන අය වැඩිය සිටින විට ලාබ පෙන්වන්න බැරි බව කීව. අපි මොකද කළේ? සෝදිසි කර බලන්න, ගරු අගමැතිතුමාගෙ ආසනයෙ තිබෙන අඹේපුස්ස ගොවිපොළ ගැන. එහි ප්‍රමාණය අක්කර 182 යි.

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திருமதி விமலா கன்னங்கரா—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

වැහැව්ව.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

අඹේපුස්ස ගොවිපොළ වැහැව්ව? සෝදිසි කර බලන්න. ඒක තියෙන්නෙ ගලිගමුව කිට්ටුවෙන්. ඒ ගැන නොදන්නව නම් රුපියල් 2,500 ක් වියදම් කරල කරුණාකර අහස් යාත්‍රාවක් අරගෙන ගිහින් බලන්න. ඒ ගැන දන්නෙ නැති නම් රජයේ මුදල්වත් වියදම් කරල ගිහින් සෝදිසි කර බලන්න. [බාධා කිරීම්] අඹේපුස්ස ගොවිපොළ ගැන නොදන්නව නම් දන්න මිනිහෙකුටවත් කතා කරන්න ඉඩ දෙන්න. හෙලිකොප්ටර් එකක්වත් අරගෙන යන්න. එහෙම බැරි නම් කපුටෙක්වත් අරගෙන යන්න. අපි මෙතැනට පැමිණ සිටින්නේ මෙවැනි පුහු තර්කවලට ඇහුම්කන් දෙන්න නොවෙයි. මා පමණක් නොවෙයි එය කියන්නෙ. ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගෙනුත් අහල බලන්න. රජයේ ගොවිපොළවලින් ලැබූ පාඩුව ලාභයකට පරිවර්තනය කළේ මා විසින්ය කියන එක අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී එතුමා ප්‍රසිද්ධියේ කිව්ව. දන්නෙ නැත්නම් හැන්සාඩ් වාර්තාව අරගෙන කියවා බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අත්හදා බලා අපට කරන්න පුළුවන්ය කියා ඔප්පු කළාට පසුව දැන් අපි විදේශිකයන්ට බාර දෙන්නේ මොකටද? එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට රට ගැන කැක්කුමක් තිබෙනවා නම්, ආහාර අතින් රට ස්වයංපෝෂිත කරන්නට ලාංකිකයන්ට පුළුවන්කම තිබෙනවා නම්, ඒ කටයුත්ත අපි විදේශිකයන්ට දෙන්නෙ මොකටද? ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේදී රජයේ ගොවිපොලවලින් පාඩු තිබුණු බව මා පිළිගන්නව. ඩඩ්ලි සේනානායක මහත්මයා කෘෂිකර්ම ඇමති වශයෙන් සිටි කාලයේදීත් පාඩු තිබුණා. ජේ. ආර්. ජයවර්ධන කෘෂිකර්ම ඇමතිතුමාගේ කාලයේත් පාඩු තිබුණා. සී. පී. ද සිල්වා කෘෂිකර්ම ඇමතිතුමාගේ කාලයේදීත් පාඩු තිබුණා. පිලිප් ගුණවර්ධන කෘෂිකර්ම ඇමතිතුමාගේ කාලයේදීත් පාඩු තිබුණා. මා ඒක හරිගස්සා දුන්න. මා විසින් හදා දුන් ඒ තත්ත්වය නම් අද වනතුරු ආපසු පල්ලම් බැස නැති බව කියන්න ආඩම්බරයි. ඒ තත්ත්වය ආරක්ෂා කර ගැනීම ගැන ගෞරවය හිමි වන්නේ ගරු එම්. ඩී. බණ්ඩා ඇමතිතුමාටයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
හරිගැස්සුවෙ මාස කීයකින්ද?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
අවුරුදු එක හමාරකින් පමණ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)
මාස 18 යි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ඕක හරිගස්සන්නට මාස 18ක් පමණ ගත වුණා. තවත් ටික කලක් මට ඒ අමාත්‍යාංශය ලැබුණා නම් ඕකත් එක සාර්ථක ප්‍රතිඵල පෙන්වන්නට තිබුණා. මා විසින් කරන ලද වැඩ කටයුතුවල ප්‍රතිඵල තවමත් තිබීම ගැන මා ආඩම්බර වෙනව. එහෙත්, එක ගොවිපොලක් පමණක් හදන්නට මට බැරි වුණා. ඒ හිඟුරක්ගොඩ ගොවිපොලයි. එය හදන්නට බැරි වුණේ පෞද්ගලික හේතුවක් නිසයි. එය පාලනය කරගෙන ගියේ එක්තරා ඇමතිවරයකුට අයිති ගොවිපොලක් හැටියට මිස රජයේ ගොවිපලක් හැටියට නොවෙයි. එයට ඇඟිලි ගහන්න ආණ්ඩුව කොතරම් උත්සාහ කළත් එය බැරි වුණා. ඒ ගැන මා කනගාටු වෙනව. මේ රජයටවත් එය සාර්ථක ලෙස කරගෙන යන්නට පුළුවන් වේවායි මා ප්‍රාර්ථනා කරනව.

හිඟුරක්ගොඩ අක්කර දහස් ගණනක් පාලනය කරන්න අපට පුළුවන්කම තිබෙනවා නම්, තිස්සමහාරාමය හා හම්බන්තොට පැත්තේ තිබෙන ආණ්ඩුවේ ගොවිපොලවල් පාලනය කරන්න අපට පුළුවන්කම තිබෙනවා නම්, මින් ඉදිරියට විශාල ගොවිපොලවල් ආරම්භ කරන විට ඒවා විදේශිකයන්ට බාරදිය යුතුයි කියා තමුන්නාන්සේලා අදහස් කරන්නේ මොන හේතුවක් උඩද? ආහාර අතින් රට ස්වයංපොෂිත කිරීමේ අදහසට අපි විරුද්ධ නැහැ.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddahasena)
පිළිතුරු දෙන්නද?

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
ඔව්. පිළිතුරු දෙන්න. මම වාඩි වෙන්නම්.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddahasena)
රජයෙන් කරගෙන යන්න බැරි තරම් ඉඩම් තිබෙනවා නම් අන්න ඒවයි දෙන්න කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ඇයි බැරි? අපේ මුතුන්මිත්තන්ට පුළුවන් වුණානේ? අවුරුදු ගණනාවකට පෙර අපේ මුතුන්මිත්තන් එය කළාය කියා තමුන්නාන්සේලාම කිව්ව. මුතුන්මිත්තන්ට ට්‍රැක්ටර් තිබුණෙත් නැහැ; නවීන ක්‍රම තිබුණෙත් නැහැ. එහෙත්, එය කරන්නට අපේ මුතුන්මිත්තන්ට පුළුවන් වුණා. ඒ අයට ඔය පෙඩරල් කරදර නම් තිබුණේ නැහැ. තිබුණා නම් කෙලින්ම මුහුණට මුහුණ ලා සටන් කළා. ඒ අයගේ සිංහලකම තිබුණේ ඒ විධියටයි. පෙඩරල් කාරයින්ගේ ඔය ඉල්ලීම්වලට මුතුන්මිත්තන් ඉඩ දුන්නෙ නැහැ. වෙන විධියකට කියනවා නම්, උතුරු නැගෙනහිර පළාත් වල සිංහල භාෂාව තැන්පත් කිරීමට අපේ මුතුන්මිත්තන් පෙඩරල් අයගේ පිහිට සෙව්වේ නැහැ. මුස්ලිම් අයට සිංහල ඉගැන්වීමට ඒ අය පෙඩරල්කාරයින්ගේ පිහිට පැතුවේ නැහැ. අන්න ඒකයි වෙනස. අපි ඉල්ලන්නේ මේකයි. අපිත් මේ අවස්ථාවේ අපේ මුතුන්මිත්තන් මතක් කරමු. ගරු අගමැතිතුමාට එතුමාගේ පියා මතක් වූ පිළිවෙළට, පියාගේ ලේ ගැන මතක් වූ පිළිවෙළට, අපිත් අපේ මුතුන්මිත්තන් ගැන ඔවුන්ගේ ලේ ගැන කල්පනා කර ගනිමු. අන්න එසේ කරන ලෙස මං තමුන්නාන්සේලා සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. මුතුන්මිත්තන්ගේ ලේ ගැන මතක් කර ගෙන, ඒ ලේ උරුමය අනුව කටයුතු කරන්නට අපිත් සූදානම් වුණොත්, මේ රට ආහාර අතින් **ස්වයංපෝෂිත කිරීමට** පමණක් නොවෙයි, රටේ ආර්ථික ප්‍රශ්න සියල්ලක්ම විසඳා ගැනීමටත් අපට ශක්තිය තිබෙන බව මං කියනව. අපේ සිංහලකම උඩ, පෞද්ගලික දේශපාලන ප්‍රශ්න පැත්තකින් තබා කටයුතු කරන ලෙස මං විශේෂයෙන්ම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ අන්න ඒ නිසයි. අද තිබෙන දේශපාලන තත්වය අනුව මූලිකත්වය දිය යුත්තේ යූ. එන්. පී. ශ්‍රී ලංකා, සමසමාජ ආදී නම් වශයෙන් තිබෙන දේශපාලන පක්ෂවලට නොවෙයි. අපේ රටේ ජාතික ප්‍රශ්නත් ආර්ථික ප්‍රශ්නත් හරියාකාර විසඳා ගන්න අපට වුවමනාවක් තියෙනව නම් ඒ සඳහා පළමුවෙන්ම අපි අපේ සිංහලකම උඩ එක්සත් වී සිටින්නට ඕන. ඇත්ත වශයෙන්ම අප අවංකව කථා කර කෙලින් කටයුතු කරමින් අපේ සිංහළ උරුමය ආරක්ෂා කර ගන්න උත්සාහ ගත්තොත් පමණයි, අපේ ප්‍රශ්න නියම විධියට විසඳා ගන්න පුළුවන්කමක් ඇති වන්නෙ. මෙන්න මේ අදහස ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 3.54

**කා. පො. ඉරත්තිනම් මයා.** (කිලිනොච්චි)
*(திரு. கா. பொ. இரத்தினம்—கிளிநொச்சி)*
(Mr. K. P. Ratnam—Kilinochchi)

*கௌரவ சபாநாயகரவர்களே, இந்தப் பிரேரணையைப்பற்றிப் பேச வேண்டுமென்று நான் எண்ணியிருக்கவில்லை. ஆனால் எனக்கு முன்பு பேசிய கௌரவ தொம்பே பிரதிநிதி (திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க) அவர்கள் தமிழரசுக் கட்சியைப்பற்றியும் அதன் தலைவர்களைப்பற்றியும் இங்கே குறிப்பிட்டார்கள்; எனவே இந்தப் பிரேரணையின் தொடர்பில் அவர் கூறியவற்றுக்கு மறுமொழி கொடுக்காவிட்டால் எனது கடமையிலிருந்து—தமிழ் மக்களின் பிரதிநிதி என்ற முறையில்—தவறிவிடுவேனென்ற எண்ணத்திலேதான் நான் இங்கே சில கூறக் கடமைப் பட்டிருக்கின்றேன்.*

*பொதுத் தேர்தல்கள் முடிந்த காலத்தில் தமிழரசுக் கட்சி, ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியுடன்—கூட்டு ஆட்சியுடன்—சேரவில்லை என்பதற்காகத் தமிழரசுக் கட்சியை, தமிழர்களை அவர்கள் திட்டியும் வைதுகொண்டும் வந்தார்கள்—வடை என்றும் தோசை என்றும் நல்லெண்ணெய் என்றும் இன்னும் பல இழிவான பெயர்களையெல்லாம் சொல்லிக் கொண்டும் வந்தார்கள். நாங்கள் அவர்களுடைய சினத்துக்கு உரிய காரணத்தை அறிவோம். உதவியை நாட முயன்றார்கள்; உதவி கிடைக்கவில்லை. அதனால் எங்களை வைகின்றார்கள், திட்டுகின்றார்கள். ஒருவாறு அவர்களுடைய ஆத்திரம் குறைந்து பின்னர் இடைத்தேர்தல்கள் மூன்று நிகழ்ந்தன. இவ்விடைத்தேர்தல்களிலே மீண்டும் இந்நாட்டிலே வகுப்புவாதத்தைக் கிளப்பி, இவ்விலங்கையையே வகுப்புவாதச் சேற்றுக்குள்ளே புதைக்கின்ற நிலைமையிலே அவர்கள்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தங்களுடைய பிரசாரங்களைச் செய்து தேர்தலி லும் வெற்றிபெற்றுவிட்டார்கள். இது தேர் தல் காலச் சூருவளி; அது தேர்தலோடு நின்றுவிடும் என்று எண்ணினேம். அந்தத் தேர்தலிலே கக்கிய விஷத்தை மீண்டும் மீண்டும் இந்தப் பொறுப்புவாய்ந்த சபை யிலே, அதுவும் ஒரு பொறுப்புவாய்ந்த முன் ளுள் அமைச்சரொருவர் கக்கியது உண்மை யிலே மனிதப்பண்பற்ற ஒரு செயல் என்று தான் நாங்கள் கருதவேண்டியிருக்கிறது.

இந்நாட்டிலே எல்லாரும் வாழவேண்டும். இன்று உலகம் ஒன்றே. சிங்கள மக்களென் றும் தமிழ் மக்களென்றும் முஸ்லிம் மக்க ளென்றும் அல்லது ருஷ்ய மக்கள் சீன மக் கள் என்றும் வேறுபட்டிராது இன்று ஓர் உலகமாக ஒற்றுமைப்பாட்டுடன் வாழ வேண்டுமென்ற கொள்கை உலகத்திலே இருக் கின்ற நாளிலே, இந்த இலங்கையில் நாங்கள் இன்றும் பிரிந்து பேசுவது மிகவும் அவ மானமான செயலாகும். இது மனிதப் பண் புக்கு மாறுபட்டதாகும் என்பதை நான் கூற விரும்புகிறேன். அவர்களுக்கு ஆத்திர மிருக்கின்றது. இந்தப் பொதுத் தேர்தலிலே மூன்று இடங்களை நாங்கள் வென்று விட் விட்டோம். இந்தத் தமிழரசுக் கட்சி எங்க ளோடு சேர்ந்திருந்தால் நாங்கள் இன்று ஆட்சிபீடத்திலே இருந்திருப்போமே என்ற ஆத்திரத்தில் அவர்கள் தமிழரசுக் கட்சியை நிந்தித்துக்கொண்டும் திட்டிக்கொண்டும் வரு கின்ருர்கள். அவர்களுடைய ஆத்திரத்துக்குக் காரணம் அதுதான். அதை நாம் மறுக்க வில்லை. ஆனல் ஆத்திரத்தால் மதியிழந்து, தங் களுடைய நிலையிழந்து எங்களையே எப்பொழு தும் தூற்றுவதுதான் தங்களுடைய கொள்கை யாக இருந்தால் இது பௌத்த தருமத்துக்கு, மனித பண்புக்குப் பொருத்தமற்றதென்பதை எடுத்துக்கூறவேண்டியது என்னுடைய கடமையாகும்.

சிங்கள மக்கள் நல்லாக வாழட்டும்; அவர் கள் தங்களுடைய மூதாதையர்களைப்பின்பற்றி வாழட்டும். ஆனல் தாங்கள் போற்றுகின்ற புத்தபகவானின் கருணையையும் அன்பையும் முன்வைத்து வாழட்டும் என்று நாங்கள் அந் தக் கருணையின், அன்பின் அடிப்படையிலே கேட்டுக்கொள்ளுகிருேம். நாங்கள், படித்தவர் கள், பண்புள்ளவர்கள். ஒருவரை ஒருவர் விளங்கிக்கொள்ளாமல், அரசியல் தருமம் என்ன என்று தெரியாமல் நாங்கள் ஒருவரை யொருவர் இப்படி வைதால் வெளியிலேயிருக் கின்ற மக்கள் என்ன எண்ணுவார்கள்? இந் தத் தேர்தல்களிலேயெல்லாம் தங்கள் சட் டைப் பைகளுக்குள்ளேயிருந்த இரண்டு ரூபாய்த் தாள்களை எடுத்துக் காட்டி, அவற் றிலே நல்லெண்ணெய் மணக்கிறது என்று பொது மக்கள் மத்தியிலே பேசுகின்ற அள வுக்கு தேர்தல் பிரசாரம் நடந்ததென்ருல் அஃது எவ்வளவு வெட்கப்படக்கூடிய ஒரு காரியமாகும். உலகத்துக்கு அன்பையும் கருணையையும் போதிக்க வேண்டிய ஒரு மதத்தைப் பின்பற்றிக் கொண்டு தம்மோடு வாழுகின்ற ஓர் இனத்தை—தம்முடைய சகோதர இனத்தை—தம்மோடு இரண்டா யிரம் மூவாயிரம் ஆண்டுகளாக வாழுகின்ற ஓர் இனத்தை நாள்தோறும் பகைத்துக் கொண்டும் திட்டிக்கொண்டும் வருவது என் றும் மன்னிக்க முடியாத ஒரு குற்றமாகும்.

தமிழிலே ஒரு பழமொழி சொல்லுவார்கள் "நாய்க்கு எங்கே அடித்தாலும் காலைத் தான் தூக்கும்" என்று. அதுபோல எங்கே எதைப் பேசி வந்தாலும் தமிழரசுக் கட்சியையும் தமிழர்களையும் இழிவான முறையில் இழித் துக் கூறுவதுதான் அவர்களது வேலை. இது ஒரு வெட்கப்படக்கூடிய காரியமாகும். எனவே இங்கே பேசப்படும் இந்த விடயத்துக் கும் தமிழரசுக் கட்சிக்கும் ஒருவிதமான தொடர்பும் இல்லையென்று நான் கௌரவ சபாநாயகரவர்களுக்கு கூற விரும்புகிறேன். அதை நீங்கள் ஏற்றுக்கொள்வீர்களென்று நான் நம்புகின்றேன். எந்த நேரத்திலும் எங் களை வைதுகொள்வதன் மூலம் தமிழர்களு டைய உண்மையான பற்றை எங்களுடைய தோம்பே பிரதிநிதி போன்றவர்கள் பெற முடியாதென்பதை நான் கூறவிரும்புகிறேன். ஓர் இனத்தின் நட்புறவை நட்புறவால் தான் பெறமுடியும். அன்பைக் கொடுத்துத்தான் அன்பைப் பெறமுடியும். இம்முறையிலேதான் எங்களுடைய பிரதமர் அவர்கள் இந்த நாட் டிலே இன ஒற்றுமையை ஏற்படுத்தியிருக்கி ருர்கள் என்பதை இச்சபையிலே நான் குறிப் பிட விரும்புகிறேன்.

முன்னர் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி, தமிழரசுக் கட்சியுடன் செய்து கொண்ட உடன்படிக்கைகளை முறியடிப்பதற்கும் ஸ்ரீ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉරත්තිනම් මයා.]

லங்கா சுதந்திரக் கட்சியின் தலைவி திருமதி பண்டாரநாயக்கா அவர்கள் செய்ய முன் வந்த நற்பணிகளைத் தடுத்து வைப்பதற்கும் பொறுப்பானவர்கள் இரண்டு டயஸ்கள்தாம் என்று நான் கூறியிருக்கின்றேன். அந்தக் கூற்றை மீண்டும் வலியுறுத்தி அவ்விருவரில் ஒருவர் இன்று இந்தச் சபையில் விஷத்தைக் கக்கியதைப் பார்க்கும்போது மிகவும் மனம் வருந்த வேண்டியிருக்கின்றது.

நான் இந்தச் சபைக்கு வெளியேயுள்ள சிங் கள மக்களுக்கு ஒன்று கூறுகின்றேன்: இந்த நாட்டிலே சிங்கள மக்களும் தமிழ் மக்களும் இரண்டாயிரம், மூவாயிரம் ஆண்டு களாக வாழ்ந்து வந்திருக்கிறார்கள். பழைய வரலாற்றிலே அவர்கள் அன்பாக, இணைந்து வாழ்ந்திருக்கிறார்கள். அதேபோன்று இனி மேலும் ஒன்றாக இந்நாடு முன்னேற நாம் ஒத் துழைப்போம். அவ்வித ஒத்துழைப்பை எந்தத் தலைவர்களுக்கும் நல்கத் தமிழ் மக் கள் என்றும் ஆயத்தமாக இருக்கிறார்கள் என் பதைக் கூறி எனது உரையை முடித்துக் கொள்கிறேன்.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

It is now nearly 4 o'clock. I suspend the Sitting till 4.30 P.M. On resumption, Mr. Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායක තැන්පත් සී. එස්. ෂර්ලි කොරයා මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி, அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று. உப சபா நாயகர் [திரு. சீ. எஸ். ஷேர்லி கொறயா] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *in the Chair.*

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව පිළිබඳව වචනයක් දෙකක් කථා කරන්න මටත් අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනව. මේ යෝජ නාව ආණ්ඩු පක්ෂයෙ ගරු මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කිරීම ගැන මේ අවස්ථා වේදී මම මගේ සන්තෝෂය ප්‍රකාශ කරන්න ඕනෑ. මා එසේ සතුටු වන්නෙ මේ යෝජනාවට මම එකඟ වන නිසා නො වෙයි. ඇත්ත වශයෙන්ම මම මීට විරුද් ධයි. මා එකඟ නොවන, මා එකහෙලාම විරුද්ධ වන යෝජනාවක් ආණ්ඩු පක්ෂ යෙ මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කිරීම ගැන මම සන්තෝෂ වන්නෙ, ඒ ප්‍රශ් නය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය ගන්නා පියවර පිළිබඳව පැහැදිලි අවබෝ ධයක් කිසිම සැකයක් නැතිව මහජනයා තුළ ඇති කරන්න පුළුවන් වන නිසයි.

ආණ්ඩු පක්ෂයෙ පළමුවැනි පේළියෙ වාඩි වී සිටින ගරු ඇමතිවරුන් මේ ගරු සභාවට යෝජනා ඉදිරිපත් කරන්නෙත් ඒව ගැන කථා කරන්නෙත් බොහොම පරෙස්සමෙන්. තමන්ගෙ යටි හිතේ තිබෙන අදහස්, මහජනයට කෙලින්ම එළි කරන්න අකැමැති අදහස්, එළියට නේන අන්දමටයි ගරු ඇමතිවරුන් මෙහිදී කථා කරන්නෙ. නමුත් ඒ ගරු ඇමතිවරුන්ට පිටුපස්සෙන් සිටින ආණ්ඩු පක්ෂයේ අවශේෂ මන්ත්‍රීවරුන් ඇමතිවරුන් තරම් දක්ෂ අයවත් දැනුමක් ඇති අයවත් නො වන නිසා, ඇමතිවරුන්ට කෙළින්ම එළි කරන්න බැරි අදහස් ඒ ගරු මන්ත්‍රී වරුන්ගෙන් එළි වීම පුදුමයක් නොවෙයි. අද මේ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් සිදු වී තිබෙන්නෙත් එවැනි දෙයක්. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු විසින් මේ යෝජනාව ඉදිරිපත් කිරීම නිසා, රට දැන ගත යුතු ඉතා වැදගත් අදහස් දෙක තුනක් ඉතා පැහැදිලිව මෙයින් ප්‍රකාශ වී තිබෙනව.

අපේ කැලෑ ඉඩම් විදේශික කොම්පැනි වලට බාර දෙන්න ඕනෑ බව මේ යෝජ නාව ඉදිරිපත් කළ, පත්කළ ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

තුමා (වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල) මෙ සින් බොහොම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. මේ සම්බන්ධව මට පෙර කථා කළ දෙම්පෙ ගරු මන්ත්‍රීතුමා (ඒෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) එතුමගෙ අදහස් ප්‍රකාශ කරද්දී, පත් කළ ගරු මන්ත්‍රී රත්නපාල මහතා හෝ අම්බලන් ගොඩ ගරු මන්ත්‍රීතුමා හෝ—දෙපොළ ගෙන් එක්කෙනෙක්—නැගිට "ගොවීන්ට ඉඩම් දෙනවට අපි විරුද්ධ නෑ, ගොවීන් ටත් ඉඩම් දිය යුතුයි" යනුවෙන් ප්‍රකාශ කළා. එසේ ප්‍රකාශ කළේ සමහර විට ඉදිරි පත් කර තිබෙන මේ යෝජනාවෙ අඩුපාඩු වක් එතුමට පෙනියාම නිසා වෙන්න පුළුවනි. නමුත්, මේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කිරීම පිණිස පත් කළ ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන්නෙ කුමක් ද යන වග මේ යෝජනාව කියවන විට පැහැදිලිව ප්‍රකාශ වෙනවා. "විශාල යායවල් වශයෙන් පවතින කැලෑ ඉඩම් යනුවෙන් මේ යෝජනාවෙහි සඳහන් වෙනවා. එයින් අදහස් කරන්නෙ සුළු කොටස් හේම නොවෙයි; විශාල යායවල්. එවැනි කැලෑ ඉඩම් රජය විසින් විදේශීය සමාගම්වලට බාර දිය යුතුයයි මෙහි කියා තියෙනවා.

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

එහෙම නෙමෙයි කියා තිබෙන්නෙ. ආයෙත් යෝජනාව කියවා බලන්න.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

එහෙම තමයි කියන්නෙ. නියම අදහස සැඟවීමට යොදා තිබෙන වචන අස් කළ හම, කෙලින්ම බලපාන වචනවලින් ප්‍රකාශ වන අදහස ඒකයි.

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

මා මේ යෝජනාවෙ සඳහන් කර තිබෙන්නෙ "...වෙනත් අවශේෂ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සුදුසු කොන්දේසි යටතේ භාර ගැනීමට රජය සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන ලෙස..." කියායි. ඉඩම් භාර දෙනව නොවෙයි. වැඩ කරවා ගැනීමට——

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

වැඩ කරවා ගැනීමට නම් ඔවුන්ට ඉඩම් භාර දෙන්න ඕනෑය කියනවා.

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

කොන්ත්‍රාත්තුවක් ඇති කර ගන්නවා පමණයි. සම්පූර්ණයෙන් ඉඩම් දෙනවා නොවෙයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

කොයි පිළිවෙළට හෝ වේවා භාර දෙන්නෙ නැතිව ඔවුන් ඒ ඉඩම්වල වැඩ කරන්නෙ කොහොමද ? වැඩේ කෙරෙන්න නම් මේ ඉඩම් භාර දෙන්න ඕනෑ නොවැ. සදහටම නැත්නම් අවුරුදු සියයකට වැඩි කාලයකට දෙනවාය කියා මමත් කියන්නෙ නැහැ. සමහර විට සීමිත අවුරුදු ගණනකට වෙන්න පුළුවන්. මේ ඊනියා ජාතික ආණ්ඩුව දැනට රජයේ ඉඩම් අක්කර 34,000 ක් පමණ මේ අන්දමට භාර දී තිබෙනවා. හැබැයි ඒ විදේශික සමාගම් වලට නොවෙයි. වරප්‍රසාද ලත් විදේශිකයින් නැත්නම් විශිෂ්ඨ පුරවැසිකම් ලත් විදේශිකයින් බොහෝ දෙනෙකුට මේ ඉඩම් දී තිබෙනවා. යම් යම් කොන්දේසි අනුව අවුරුදු ගණනකට මේ ඉඩම් දී තිබෙනවා. නමුත් මේ කොන්දේසි මොනව වුණත් අප එක් කාරණයක් පැහැදිලි කරගන්න ඕනෑ. මේ යෝජනාව ඉදිරිපත් කළ වෛද්‍යාචාර්ය රත්නපාල පත් කළ ගරු මන්ත්‍රීතුමාත් ස්ථිර කළ ගරු මන්ත්‍රීතුමාත් මේ දක්වා ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළේ සිටින ඇමතිවරුන් විසින් හෙළි නොකරන ලද අදහසක් අද හෙළි කර තිබෙනවා. ඒ කියන්නෙ විශාල ඉඩම් යායවල් ආහාර වගා කිරීම සඳහා විදේශීය සමාගම්වලට භාර දිය යුතුය යන්නයි.

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
භාර දෙන්නෙ නැතිව කොහොමද වැඩ කරන්නෙ ?

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)
ඉංග්‍රීසි පරිවර්තනය කියෙව්වොත් තේරෙයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
"undertake on contract with the Government...... in the vast extents of jungle land available,...."

ඉතින් මේ ඉඩම් දෙන්නෙ නැත්නම් මේ මිනිසුන් වැඩ කරන්නෙ කොහොමද? සදහටම ඔප්පුවලින් මේ ඉඩම් ලියා දෙනවාය කියා මමත් කියන්නෙ නැහැ. නමුත් මේ ඉඩම් භාර දෙන්නෙ නැත්නම් ඒ මිනිසුන්ට ඇමතිවරුන් අදහස් කරන දේවල් කරන්න බැහැ නොවැ. හොඳයි, මුලින් දෙනවාය කියා පසුව නොදී ඉන්නද අදහස් කරන්නෙ ?

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)
නැහැ. වැඩ කරවා ගැනීමයි අදහස් කරන්නෙ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
වැඩ කරවා ගැනීමට නම් ඉඩම් භාර දෙන්න වෙනව නොවැ. එහෙම නැත්නම් කොන්ත්‍රාත්තු අත්සන් කළාට පසුව ඒ ඉඩම්වලට ඔවුන්ට යන්න බැරිය කියා නවත්වනවද ? යම්කිසි කාල සීමාවකට වෙන්න පුළුවන් ; නමුත් ඒ කාල සීමාව තුළ වුණත් මේ ඉඩම් ඒ මිනිසුන්ට භාර දෙන්න ඕනැ නොවැ. පලයල්ලා, ගිහින් වගා කරපල්ල කියල මේ ඉඩම් දෙන්න ඕනැ නොවැ. ඒකයි මා කියන්නෙ. ඒ අන්දමට විශාල ඉඩම් යායවල් වශයෙන් පවතින අපේ කැලෑ ඉඩම් මේ විදේශික සමාගම්වලට දෙන්න බලාපොරොත්තු වෙනව. ප්‍රථම වරට තමයි මේ අදහස හෙළි කර තිබෙන්නෙ. සමහර විට අඥානකම නිසා වෙන්න පුළුවනි. මා ඒ ගැන දන්නෙ නැහැ. නමුත් මේ ඉදිරි පෙළේ සිටින ඇමතිවරුන් වුවත් මීට ප්‍රථමයෙන් මේ තරම් පැහැදිලි ලෙස මේ අදහස ඉදිරිපත් කිරීමට අසමර්ථ වුණා. මීට පළමුවෙන් අයවැය ලේඛන කථාවේදී—වී ගොවිතැන ගැන නම් කිව්වේ නැහැ—අමතර ආහාර ද්‍රව්‍ය වගා කිරීම සඳහා ඉඩම් අක්කර විශාල ගණනක් පෞද්ගලික සමාගම්වලට භාර දෙන්න යනවාය කිව්වා. නමුත් ඒ ඉඩම් විදේශීය සමාගම්වලට දෙනවාය කිව්වෙ නැහැ. මේ රටේ සමාගම් ගැන පමණයි සඳහන් කළේ. සමහර විට දැන් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවට මේ රටේ සමාගම්ද අයිති වෙන්න පුළුවන්. නමුත් මේ යෝජනාව අනුව ප්‍රධාන වශයෙන්ම කල්පනා කර තිබෙන්නෙ විදේශීය සමාගම් ගැනයි. ඒ කෙසේ වෙතත්, මේ යෝජනාවෙන් ආණ්ඩුවේ අදහස් අපට පැහැදිලි කිරීම ගැන මා මේ යෝජනාව ඉදිරිපත් කළ පත් කළ ගරු මන්ත්‍රීවරයාට ස්තුති කරනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යාචාර්ය රත්නපාල පත් කළ ගරු මන්ත්‍රීතුමා තම කථාවේදී ගොවීන්ට ඉඩම් දීමෙන් වැඩක් නැත යන වචනත් ප්‍රකාශ කර තිබෙනව. එතුමා ඒ වචන සඳහන් කළේ නැත කියනව නම් මා වාඩි වෙන්නම්.

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)
නැහැ, එහෙම නොවෙයි මා කිව්වෙ. ගොවීන් ලවා බලාපොරොත්තු වන සහල් ප්‍රමාණය ලබා ගැනීමට අමාරුය, එම නිසා මේ ප්‍රශ්නය අප විසඳන්න ඕනැය කියායි මා කිව්වෙ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ගොවීන්ට ඉඩම් දීමේ වැඩ පිළිවෙළෙන් ගොවිතැන දියුණු කර මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කළ නොහැකිය කිව්ව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

නෑ නෑ ගොවීන්ට ඉඩම් දෙනවා. අනික් අයටත් දෙනවා. ගොවීන් ලවා වගා කරවන්නට බැරි ඉඩම් අනික් අයට දෙන්නට ඕනෑ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

එහෙම නම් මේ යෝජනාව වුවමනා වන්නේ නැහැ. දැන්වත් යෝජනාව ඉල්ලා අස්කර ගන්න. ගොවීන්ට ඉඩම් දීමෙන් සහල් අතින් රට ස්වයංපෝෂිත කරන්නට පුළුවන් නම් විදේශික කොම්පැනිවලට ඉඩම් දෙන්නේ මොකටද? ගොවීන්ට මේ වැඩේ කරන්නට පුළුවන් නම් ගොවීන් හා අධිරාජ්‍යවාදීන් අතර මේ සම්බන්ධයෙන් හැප්පීමක් ඇති කර වන්නේ මොකටද?

**වෛද්‍යාචාර්ය රත්නපාල**
*(வைத்திய கலாநிதி ரத்னபால)*
(Dr. Ratnapala)

ගොවීන්ට පමණක් ඉඩම් දීලා ආහාර වලින් රට ස්වයංපෝෂිත කරන්නට බැරි නිසයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

සමහර විට තමාගේ යෝජනාවෙන් අදහස් නොකරන ලද පහරක් ආණ්ඩුවට වැදී ඇති බව තේ පැන් සංග්‍රහ වේලාවේදී පත් කරන ලද මන්ත්‍රීතුමාට (වෛද්‍යාචාර්ය රත්නපාල) ඇති වුණා විය හැකියි. නමුත් අපට ඒකට කරන්නට දෙයක් නැහැ. මා කථා කෙළේ එතුමාගේ යෝජනාවේ අදහස අනුවයි. ඒ මිස මා කථා කෙළේ ඒ යෝජනාවට විරුද්ධව නොවෙයි. තමාගේ යෝජනාව නිවැරදි බව පෙන්වීම සඳහා කථා කළ පත් කරන ලද මන්ත්‍රීතුමා පැහැදිලිවම සඳහන් කෙළේ ගොවීන්ට ඉඩම් දීමෙන් මේ ප්‍රශ්නය විසඳිය නොහැකි බවයි. ඒ නිසා විදේශික කොම්පැනිකාරයන්ට ඉඩම් දිය යුතුලු. ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් ආණ්ඩුවේ නියම අදහස් දැන ගන්නට බැරි වුණත් ප්‍රථම වතාවට පසුපස ආසනයක සිටින අවශේෂ මන්ත්‍රීවරයකුගෙන් මේ අන්දමට ආණ්ඩුවේ අදහස් දැන ගන්නට ලැබීම ගැන අප සතුටු වෙනවා. ඒ පැත්තේ හා මේ පැත්තේ සිටින අපගේ අදහස් විවිධ වන්නට පුළුවනි. ප්‍රජාතන්ත්‍රවාදය අනුව අප අතර විවිධ අදහස් ඇති කර ගන්නට පුළුවනි. ඒවා සම්බන්ධව සාකච්ඡා කොට ඒවා පැහැදිලි වශයෙන් එළි කළ විට නිවැරදි කවුරුන්දැයි දැන ගන්නට මහජනයාට පුළුවනි. අදහස් සඟවාගෙන දේශපාලනය කිරීමෙන් කාටවත් ප්‍රයෝජනයක් ඇති වන්නේ නැහැ. මේ දක්වා බාගෙට කී දෙයක් ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු විසින්ම හරි විධියට පැහැදිලි කර දෙනු ලැබීම ගැන අප බොහොම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරිපත් කර තිබෙන යෝජනාව අනුව පෙනෙන්නේ ගොවියන් ගැන මේ ආණ්ඩුවට විශ්වාසයක් නැති බවයි. ගොවීන්ට ඉඩම් දීමෙන් සහල් අතින් මේ රට ස්වයංපෝෂිත කරන්නට පුළුවන් වෙතැයි ආණ්ඩුව විශ්වාස කරන්නේ නැහැ. අපේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීම සඳහා විශාල කැළෑ ඉඩම් විදේශික කොම්පැනිකාරයන්ට දෙන්නට ඕනෑලු. රාජාසන කථාවේදී හා අයවැය ලේඛන කථාවේදී කීවේ ධනපති කොම්පැනිවලට ඉඩම් දෙන බවයි. නමුත් මේ යෝජනාව අනුව පෙනෙන්නේ විදේශික කොම්පැනිවලට ඉඩම් දෙන බවයි. මේ ආණ්ඩුව කරන්නට යන්නේ කුමක්දැයි දැන් මේ රටටත් අපටත් පැහැදිලියි. එහෙයින් මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මා පත් කරන ලද ගරු මන්ත්‍රීතුමාට (වෛද්‍යාචාර්ය රත්නපාල) කෘතඥ වෙනවා.

ඉඩම් දෙන්නට යන්නේ කුමන විධියේ විදේශික කොම්පැනිවලටද යන්න යෝජනාවේ පැහැදිලි කර තිබෙනවා. විශාල වශයෙන් කරන කෘෂිකාර්මික කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති විදේශික සමාගම්වලටයි, යායවල් වශයෙන් පවතින විශාල කැළෑ ඉඩම් දෙන්නට යන්නේ. කාටද මේ විශාල වශයෙන් කෙරෙන කෘෂිකර්මය ගැන පළපුරුද්දක් ඇත්තෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

කෘෂිකර්මයට දක්ෂ රටවල් කීපයක් තියෙනව. මම දන්නව, ඩෙන්මාර්ක් රට ගැන. ඩෙන්මාර්ක් රටෙත් කෘෂිකර්මය බොහොම උසස් පිළිවෙළට කෙරෙනව. විශේෂයෙන් ඒ රටේ ආහාර ද්‍රව්‍ය වගා කරනව. ඇනිමල් හස්බන්ඩ්‍රි හෙවත් සත්වයන් ඇති කිරීම පිළිබඳවත් ලොකු දියුණුවක් ඒ රටේ තියෙනව. නමුත් ඒ රටේ විශාල වශයෙන් කෘෂිකර්මය කෙරෙන්නෙ නැහැ. සමුපකාර ක්‍රමයට පොඩි පොඩි මිනිස්සු තමයි, ඒ රටේ කෘෂිකර්මය උසස් තත්ත්වයට නංවා තිබෙන්නෙ. ඒ නිසා ඩෙන්මාර්ක් රට නම් මේකෙන් ඉවත් වෙනව. ඒ රටේ සමාගම්වලට මේ වැඩය භාර දෙන්නෙ නැහැ. එහෙම නම් කොයි රටේ සමාගම්වලටද භාර දෙන්නෙ?

ස්විට්සර්ලන්තයත් කෘෂිකර්මය අතින් දියුණු රටක්. නමුත් ඒ රටත් කුඩා රටක්. ඒ නිසා කෘෂිකර්මය විශාල වශයෙන් කෙරෙන්නෙ නැහැ. සමහරවිට එංගලන්තය ගැනද මෙහි සඳහන් කර තිබෙන්නේ කියා මට කල්පනා වුනා. එක අතකින් බලන විට එංගලන්තයේ කෘෂිකර්මය කෙරෙන්නේ පාඩුවටයි. එංගලන්තය ඒ රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය වලින් වැඩි හරියක්—සියයට හැත්තෑ පහක පමණ ප්‍රමාණයක්—පිටරටවලින් තමයි, ගෙන්වා ගන්නෙ. මා හිතන පිළිවෙළට අපේ රට පිටරටින් ගෙන්වා ගන්නවාට වඩා විශාල වශයෙන් එංගලන්තය පිටරටින් ආහාර ගෙන්වා ගන්නවා. ඒ හැරෙන්නට එංගලන්තයේ තිබෙන ගොවි පොළවල් ඒ තරම් විශාල ඒවා නොවෙයි. අපේ රටේ වගේ සුළු ගොවියන් නොවෙයි, ඒවායේ වැඩ කරන්නෙ. යම්කිසි ප්‍රමාණයක ධනපති ගොවි පොළවල් තමයි—fපාම්ස් තමයි—එංගලන්තයේ තියෙන්නෙ. නමුත් ඒ තරම් විශාල ඒවා නොවෙයි. ඒ අනුව විශාල වශයෙන් කෙරෙන කෘෂිකර්මය පිළිබඳව පළපුරුද්දක් ඇත්තෙ, අපට පෙනෙන හැටියට, ඇමෙරිකාවටයි. එහෙම නම් අපට පෙනෙන හැටියට අදහස අපට ගොවිතැන් කරන්න බැරි වී හා අනික් ආහාර ද්‍රව්‍ය මේ රටට ඇවිත් නිෂ්පාදනය කර දෙන්නය කියා ඇමෙරිකාවේ කොම්පැනිවලට ආරාධනය කිරීමයි. අදහස එය නම් මේ යෝජනාවේ ඇමෙරිකානු කොම්පැනිය කියා දැම්මා නම් අදහස වඩාත් පැහැදිලියි. ඒකෙ කිසි වැරුද්දක් ඇත්තෙ නැහැ. මේ රට දෙවැනි වියට්නාමයකට පරිවර්තනය කිරීම හොඳය කියා ඇත්ත වශයෙන්ම සමහරු හිතනව. එසේ හිතුවට මගේ අමනාපයක් නැහැ. අපි නම් ඒකට විරුද්ධයි. විශාල වශයෙන් කෘෂි කර්මය කෙරෙන ඇමෙරිකාව ගැන හිතේ තියාගෙන වෙන්න ඇති, පත් කළ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ඒ. රත්නපාල) මේ යෝජනාව ගෙනෙන්න ඇත්තේ.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)

ඇමෙරිකාව, රුසියාව, චීනය.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

රුසියාවේ විශාල වශයෙන් ගොවිතැන කෙරෙනව. නමුත් එතුමා රුසියාව ගැන හිතුවාය කියා කල්පනා කරන්න අමාරු කොම්පැනි ගැන කියා තිබෙන නිසයි. රුසියාවෙ කොම්පැනි නැහැ. සාමූහික ගොවි පොළවල්, සමුපකාර ගොවි පොළවල් තියෙනව; කොම්පැනි නැහැ. ඊයේ පෙරෙයිදා ඒ මන්ත්‍රීතුමා රුසියාවට ගිහින් කොම්පැනි තියෙන බව දැන ගත්තාද කියා මම දන්නෙ නැහැ. මීට අවුරුදු දෙකකට පෙර—1964 දී—මම රුසියාවට ගියා. ඒ කාලයෙදි නම් කොම්පැනි තිබුනෙ නැහැ. මේ අවුරුදු දෙක ඇතුළත—කෘෂෙප්ගෙන් පස්සෙ—කොම්පැනි ඇති කරල තියෙනවද කියන්න මම දන්නෙ නැහැ. 1964 දී නම් තිබුනෙ නැහැ.

මීටත් වඩා ගැඹුරු ප්‍රශ්නයක් මෙහි ගැබ් වී තිබෙන බව මතක් කරන්නට කැමතියි. මේ සියල්ලක්ම අප කියන්නෙ මොන හේතුවක් නිසාද? අපේ රටේ දැන් විශාල විදේශ විනිමය අර්බුදයක් ඇති වෙලා තියෙනව. ඒ නිසා තමයි, ප්‍රශ්නය විසඳන්නෙ කොහොමද කියා මේ මන්ත්‍රීවරුත්, අර ඇමතිවරුත්, අපිත් කලබල වෙලා ඉන්නෙ. විදේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විනිමය ප්‍රශ්නය නිසා තමයි, මේ ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නෙ. අපේ ඊනියා ජාතික ආණ්ඩුව විදේශ විනිමය ප්‍රශ්නය විසඳීමට මාර්ගයක් ඉදිරිපත් කර තිබෙනව; මීට පෙර පැවති ආණ්ඩුව ඉදිරිපත් කළාට වඩා වෙනස් මාර්ගයක් ඉදිරිපත් කර තිබෙනව. මීට පෙර පැවති ආණ්ඩුව මේ ප්‍රශ්නයට මුහුණ දුන්නෙ කොයි විධියටද? ඒ ආණ්ඩුවෙ හුඟක් අඩුපාඩු තිබුණු බව මමත් පිළිගන්නව. නමුත් ඇත්ත වශයෙන්ම අවංකව මම හිතනව, විදේශ විනිමය ප්‍රශ්නය විසඳීම සඳහා ඒ ආණ්ඩුව අනුගමනය කිරීමට පටන් ගත් මුල් ප්‍රතිපත්තිය හොඳ එකක්ය කියා. මොකක්ද මේ විදේශ විනිමය ප්‍රශ්නය කියන්නෙ? විදේශ විනිමය ප්‍රශ්නය, නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට පමණක් නොවෙයි, මේ ලෝකයේ සියලුම නොදියුණු රටවලට ඇති වී තිබෙන ප්‍රශ්නයක්. මූලික ද්‍රව්‍යවල මිල බසින අතර විශෙෂයෙන්ම කාර්මික භාණ්ඩවල මිල නැගගෙන නැගගෙන යාම නිසයි මේ ප්‍රශ්නය ඇති වෙන්නෙ. ඒ නිසා එවැනි තත්ත්වයකට යම් ප්‍රතිකර්මයක් කළ යුතුය කියා මීට පෙර පැවති ආණ්ඩුව කල්පනා කළා. ඒ සඳහා කරන්නට අදහස් කළ, නැත්නම් කළ යුතු ප්‍රතිකර්මය කුමක්ද? මූලික භාණ්ඩ වූ තේ, පොල් රබර් සහ සමහර කෘෂිකාර්මික ද්‍රව්‍යවල මිල බැහැගෙන යනවා නම් මෙතෙක් අපේ රටේ පැවති ආර්ථික ක්‍රමය යම් කිසි ක්‍රමයකට වෙනස් කර තේ, පොල්, රබර් පිළිබඳ වත්, කෘෂිකාර්මික ද්‍රව්‍ය පිළිබඳවත්, අපේ ආර්ථික ක්‍රමයේ තිබෙන බර අඩු කර අපේ නිෂ්පාදන හැකි තරම් කාර්මික අතට හැරවීමයි කළ යුතුව තිබෙන්නෙ. ඒ මක්නිසාද? කාර්මික භාණ්ඩවල මිලයි ඉහළ නඟින්නෙ. නමුත් වර්තමාන ආණ්ඩුව ඒ අදහස පිළිගන්නෙ නැහැ.

වර්තමාන ආණ්ඩුවෙ ප්‍රතිපත්තිය මොකක්ද? විදේශ විනිමය අර්බුදයක් ඇති වී තිබෙන බව එතුමන්ල පිළිගන්නව. එහෙත් තේ, රබර්, පොල් වැනි කෘෂිකාර්මික ද්‍රව්‍යවල මිල බැසගෙන යන නිසාත්, කාර්මික භාණ්ඩවල මිල නැඟගෙන යන නිසාත්, ඒ සඳහා යෙදිය යුතු ප්‍රතිකර්මය වශයෙන් පිළිගෙන තිබෙන්නේ තව තවත් කෘෂිකාර්මික ද්‍රව්‍ය මේ රටේ නිපදවිය යුතුය කියන එකයි. ඒ නිගමනයටයි දැන් බැසගෙන තිබෙන්නෙ. ඒ සඳහා මම හිතනවා අධිරාජ්‍යවාදි රටවලින් ඔවුන් ආධාර බලාපොරොත්තු වෙනවය කියා. අධිරාජ්‍යවාදී රටවල් එයට බොහොම සතුටු වෙනවා ඇති. කම්මාන්ත විෂයට බසින්නෙ නැතිව, අමතර ආහාර ද්‍රව්‍ය වගා කිරීම පිණිස විශෙෂ උත්සාහයක් දරණවා නම් අමෙරිකාව, බ්‍රිතාන්‍යය වැනි ධනපති රටවලට පුළුවන් වෙනවා ඇති අපේ රටවල් සූරා කෑමේ ව්‍යාපාරය සඳහටම ඉදිරියටත් ගෙන යාමට.

කාර්මික භාණ්ඩ අපේ රටේ නිෂ්පාදනය කරන්නෙ නැතිව, කෘෂිකර්ම ද්‍රව්‍ය නිෂ්පාදනය අතින් අනික් නොදියුණු රටවල් සමග තරඟ කිරීමට දමා කෘෂිකාර්මික ද්‍රව්‍ය පමණක් නිපදවීමට රට පොළඹවා ගැනීමෙදී, රටවල් සූරා කෑමේ ව්‍යාපාරය තව දුරටත් පවත්වාගෙන යාමට ඇමෙරිකාව වැනි රටවලට තව දුරටත් පුළුවන් වෙනව. මේ කාරණා මම මතක් කරන්නෙ මේක ලොකු ප්‍රශ්නයක් නිසයි.

අද ඒ දියුණු රටවල් අපේ රට වැනි නොදියුණු රටවල් සූරා කන්නෙ යුද්ධෙට පෙර සූරා කෑ ක්‍රමයට නොවෙයි. යුද්ධෙට පෙර අපව සූරා කෑවෙ කොහොමද? කොටින් කියතොත් ලංකාව සූරා කෑවෙ තේවලින් ලැබෙන ලාභය පිටරටට අරගෙන යාමෙනුයි. නමුත් අපේ රටට යම් කිසි දේශපාලන බලයක් ලැබුණට පස්සෙ අපි මොකක්ද කෙළේ? අපේ තේ විදේශයට පැටවීමේ බද්ද—export duty—වැඩි කළා. ඒ අනුව අද තේ කොම්පැනි උපයන ලාභවලින් සුළු කොටසක් පමණයි පිට රටට ගෙන යාමට පුළුවන් වී ඇත්තෙ. එය මේ රටේ පමණක් නොවෙයි, නිදහස ලැබූ අනික් නොදියුණු රටවලත් සිදු වී තිබෙනව. ඒ නිසා මේ පශ්චාත් යුද සමයේ අධිරාජ්‍යවාදී රටවල් කල්පනා කර තිබෙනව, කලින් ක්‍රමයට රටවල් සූරා කන්න බැරිය, අලුත් විධියකින් සූරා කන්න ඕනෑය කියා. ඒ අනුව ඒ ගොල්ලන්ගෙ ආර්ථික බලය පාවිච්චි කිරීමෙන් අපේ රටේ කෘෂිකර්ම ද්‍රව්‍යවල මිල අඩු කර ඔවුන්ගේ කාර්මික භාණ්ඩවල මිල වැඩි කර වෙළඳාම අතින් අපව සූරා කෑමට අද ඔවුන්ට පුළුවන්කම ලැබී තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

එම නිසා නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර පැවති ආණ්ඩුවට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ ආණ්ඩුව උත්සාහයක් ගත්ත. ආරම්භයක් ඇති කළා. ඒ මොකක්ද? කෘෂිකාර්මික ද්‍රව්‍ය වල මිල බහින නිසා ඊට කළ යුතු ප්‍රතිකර්මය වශයෙන් කාර්මික භාණ්ඩ නිෂ්පාදනයට බසිමුය කියා ආරම්භයක් ඇති කළා. අපේ රට කෘෂිකාර්මික රටක් නිසා ගොවිතැන අතින් ස්වයංපෝෂිත කිරීමට ඉදිරිපත් වීම ගැන, ඒ අංශයෙහි උනන්දුවීම ගැන අප කාගෙවත් විරුද්ධත්වයක් ඇති වෙන්නෙ නැහැ. නමුත් මෙහිදී මතුවන ප්‍රශ්නය මෙයයි. අමතර ආහාර ද්‍රව්‍ය වගා කිරීම පමණක් අරමුණු කරගෙන කටයුතු කරනවා නම්, කාර්මික අංශය ගැන සැලකිල්ලක් නොදක්වනවා නම් අන්න ඒ කාරණය ගැන අපි වඩාත් සැලකිලිමත්විය යුතුව තිබෙනව. මන්ද? අමතර ආහාර ද්‍රව්‍ය මිල නිතරම පහත බැහැගෙන යනව. අපේ ප්‍රධාන වගාවන් වන තේ, රබර් සහ පොල්වල මිල ක්‍රමයෙන් පහත බසිනව. මේ නිසා අපේ සීමිත ධනය එසේ පහත බැස ගෙන යන නිෂ්පාදනයන් කෙරෙහි යෙදවිය යුතුද නැතිනම් දවසින් දවසට මිල නැගිගෙන යන කාර්මික භාණ්ඩ සෑදීමට තැන්පත් කළ යුතුද, යෙදිය යුතුද කියන ප්‍රශ්නය අප නිරාකරණය කර ගත යුතුව තිබෙනව. ඇත්ත වශයෙන්ම අධිරාජ්‍යවාදීන් සතුටු වනවා අපේ ධනය කෘෂිකර්මය කෙරෙහි පමණක් සීමා කරනවා නම්. මට පෙනී යන හැටියට, මට වැටහෙන හැටියට අපේ වර්තමාන ආණ්ඩුව, අධිරාජ්‍යවාදීන්ගෙන් ලැබෙන ණය මුදල් උඩ ජීවත්වන්න කල්පනා කරන නිසා, ඔවුන්ගේ ණය මුදල් උඩ ජීවත්වන්න සිද්ධ වී තිබෙන නිසා, ඒ බලවත් ධනපති අධිරාජ්‍යවාදී රටවල් අසතුටු නොකිරීම සඳහා ඔවුන් සමග කාර්මික අතින් තරඟ කරන්නෙ නැතුව ඔවුන්ගෙන් ලැබෙන ධනය කෘෂිකර්මයට පමණක් සීමා කරන්නටයි උත්සාහ දරන්නෙ. එම නිසා, ගරු මන්ත්‍රීවරයා ඉදිරිපත් කර ඇති යෝජනාව, සම්පූර්ණයෙන්ම වර්තමාන ආණ්ඩුවේ එම ප්‍රතිපත්තිය උඩ ගෙනෙන ලද යෝජනාවක් වශයෙනුයි හඳුන්වා දිය යුත්තෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශීය කොම්පැනිවලට ඉඩම් ලබාදීමෙන් සෑහෙන ප්‍රමාණයකින් ආහාර ද්‍රව්‍ය වගා කරන්න පුළුවන් බව ඇත්ත. නමුත් අපට වුවමනා කරන්නෙ කෘෂිකර්මය අතින් මෙන්ම කාර්මික අතින්ද නිෂ්පාදන වැඩි දියුණු කිරීම බව අමතක කරන්න නරකයි. කොයි ලෙස වුණත් නිකම් සිටිනවාට වඩා කෘෂිකර්මය අතින් හෝ දියුණු කරනවා නම් අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මෙහිදී ඇත්තවශයෙන්ම මේ වගාවන් කෙරෙනවාද කියන සැකයක් අප කා තුළත් ඇති වෙනව. මේ දක්වා විදේශික නොවූවත්, ස්වදේශික කොම්පැනිවලට අක්කර 34 දහසක පමණ බිම් ප්‍රමාණයක් අමතර ආහාර ද්‍රව්‍ය වගා කරන්න භාර දී ඇතත් මේවා කොතරම් දුරට වගා කර තිබෙනවාද කියා අහන්න කැමතියි. එපමණක් නොවෙයි, මේ අක්කර 34 දහසක ප්‍රමාණයෙන් කොයි තරම් ප්‍රමාණයක වටිනා දුව දඬු විකුණා තිබෙනවාද කියාත් ප්‍රශ්න කරන්න කැමතියි. මේ කාරණය ගැන පත් කළ ගරු මන්ත්‍රීතුමාගේත්, අම්බලන්ගොඩ ගරු මන්ත්‍රීවරයාගේත් අවධානය මා විශෙෂයෙන්ම යොමු කරනව. සුදුසු කොන්දේසි ඇතිව වගා කිරීමට භාර දීම පිළිබඳ යෝජනාව වැඩි ඡන්ද සංඛ්‍යාවක් ඇති නිසා සම්මත කර ගත්තත්, අක්කර 34 දහසක ප්‍රමාණයක් කොම්පැනිවලට වගා කිරීමට භාර දීමේදී ඉදිරිපත් කරන ලද කොන්දේසි අනුවම් දුන්නත්—

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

ගස් පෙරළන—

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

ගස් පෙරළන කොන්දේසි ඇතුව දුන්නත් මේ කටයුත්ත කෙරේවිද කියා අපට ලොකු සැකයක් තිබෙනව. මන්ද? මේ ආණ්ඩුව නොයෙකුත් බලාපොරොත්තු කීපයක් ඇතුව වැඩ කටයුතු ආරම්භ කළා. නමුත් එක බලාපොරොත්තුවක්වත් ඉටු වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. අප විදේශීය රටවලින් ආධාර ලැබෙන තුරු කට ඇරගෙන බලා සිටින්න ඕනෑ. සමහර විට කල්පනා කරනවා ඇති චීනයට බනින විට ඇමෙරිකන් ආධාර ලැබේවිය කියා. ඔය කොයි කාගෙන්වත් ලේසියෙන් ආධාර ලැබෙන්නෙ නැහැ. ආධාර සුළු වශයෙන් ලැබී තිබෙන බව ඇත්ත; ඒත් බලාපොරොත්තු වූ ප්‍රමාණයෙන් නොවෙයි. එයින් තවත් ප්‍රශ්නය උග්‍ර වීම පමණයි සිදු වී තිබෙන්නෙ. ඊයෙ පෙරේදා රජයේ ආර්ථික විශේෂඥයා වන ගාමිනි කොරයා මහතා ප්‍රකාශයක් කර තිබෙනවා, විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නය ගිය අවුරුද්දටත් වඩා මේ අවුරුද්දේදී වඩාත් බලවත් එකක් වී තිබෙන බව; වඩාත් උග්‍ර තත්ත්වයකට පත් වී තිබෙන බව. අපේ අපනයන භාණ්ඩ වන තේ, රබර් සහ පොල් ආදිය පිටරට යැවීමෙන් පසුගිය අවුරුද්දේ අපට යම්කිසි විදේශ විනිමයක් ලැබුණා නම් මේ අවුරුද්දෙදි ලැබෙන විනිමය ප්‍රමාණය රුපියල් කෝටි දහසයකින් අඩුවෙලා තිබෙනවය කියනව. ඒ කියන්නෙ රුපියල් ලක්ෂ 1,600කින් මේ අවුරුද්දෙදී අඩුවෙලා තිබෙන බවයි. ඒ නිසා මෙය විශාල ප්‍රශ්නයක් හැටියට සලකන්න වුවමනා කරනව. මේ රටට විදේශ ආධාර ලැබෙනවය කියන බලාපොරොත්තුව උඩ අධිරාජ්‍යවාදීන්ගේ සිත් සතුටු කරන්න කල්පනා කරගෙන ඒ ආකාරයට වැඩ කළත් අන්තිමේදී අපට පාඩු සිදු වන අතර අපට අප බලාපොරොත්තු වන ආධාර ලැබෙන්නෙත් නැහැ. ඒ ප්‍රශ්නය ගැන මා විශේෂයෙන් කථා කළේ අප අතර තිබෙන දේශපාලන මය වෙනස්කම් ඉතාමත් අවංක ලෙස පැහැදිලි කර ගත යුතු නිසයි. වෙනත් මාර්ග තිබෙනවා වෙන්න පුළුවනි. ඒ ගැන අප විරුද්ධ නැහැ. එය වෙනම දෙයක්. එහෙත් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නෙ මෙයයි: විදේශ ආධාර ලැබෙනැයි කල්පනා කරමින් වැරදි මාර්ග යේ ගමන් කිරීම අපේ රටට පාඩුවක් බව කල්පනා කරන්න ඕනෑ. එය අපට වැඩදායක නොවන බව කල්පනා කරගෙන හරි මාර්ගයේ ගමන් කරන්න ඕනෑ. අධිරාජ්‍යවාදීන් සතුටු කිරීම සඳහා මේ ආණ්ඩුව මොන මොන ක්‍රියා මාර්ගයන් අනුගමනය කළත් අඩු ගණනේ මේ ඉඩම් ටික භාර දෙන විට ඒ ගැන ටිකක් පරීක්ෂා කරන්න ඕනෑ. අක්කර 34,000ක් පමණ වූ හොඳ කැලෑ ඉඩම්වල තිබෙන කැලෑගස්—වටිනා ගස්—කපා දමා විනාශ කර, කාබාසිනියා කර, නොදමා ඒවා ආරක්ෂා වන අන්දමට යම්කිසි කොන්දේසි ඇති කරන ලෙස මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිමින් මගේ වචන සවල්පය අවසන් කරනව.

අ. භා. 5.02

**එම්. එම්. මුස්තාfපා මයා. (සමාජ සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எம். முஸ்தபா—சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)

Mr. Deputy Speaker, the Motion before us seeks to achieve self-sufficiency in the production of food, particularly rice. There can be no two opinions about the wisdom of this Motion, but with regard to the method by which the hon. Member is proposing to achieve this goal, I must say that I beg to differ from him.

The Motion, read as it is, says that we should enlist the services of foreign companies to engage in paddy cultivation in this country which obviously means that land must be made available to these companies for them to produce food.

In fact this is not a novel idea. It has been tried out very much earlier. I remember, in the Gal-Oya Valley somewhere in 1952 or 1953, a company was specially floated with the aim of producing paddy. I think a thousand acres of land very suitable for paddy cultivation were made available to this company. The newly formed company enlisted the services of a foreigner, an Englishman, as the manager of this paddy farm. They tried for two years and in spite of the fact that a thousand acres of improved land, that is land already brought under cultivation, was made available to them, they failed miserably. Paddy is not something that can be grown anywhere and everywhere and by everybody. It is a specialized job, and something in which our peasants, the peasants in Ceylon, excel.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුස්තාෆා මයා.]

In fact the hon. Member for Dompe confessed that he learnt a little of agriculture when he was in charge of the portfolio of Agriculture. I speak not as one who has merely studied this subject or only because I am a Member of Parliament. I speak on this subject with knowledge because the very blood that runs in my veins is the blood of a farmer and because I happen to come from the Amparai District which is almost one hundred per cent. agricultural, a district which produces paddy.

We must not only aim at self-sufficiency in rice but also at exporting rice at a future date. In fact if already we have not reached self-sufficiency in rice in this country it is entirely due to our own fault. We cannot blame anybody else. We have got the land—land suitable for paddy cultivation; we have got a climate ideally suited for paddy cultivation; we have got sufficient sunshine and we have got sufficient rainfall. What is lacking is effort on our part—successive Governments have failed to set on foot a planned programme of paddy production.

There are in Ceylon today five districts where paddy cultivation can be done successfully. As I said earlier, paddy cannot be grown anywhere and everywhere, for instance, in Nuwara Eliya or in such places. Paddy can be grown in districts like the Amparai District, the Anuradhapura District, the Kegalla District, the Hambantota District, the Kurunegala District and the Batticaloa District. These are the districts we must concentrate on for the production of paddy. Whether it is the United National Party Government or the Sri Lanka Freedom Party Government, if they want to make a success of this job, they must concentrate on these districts. It may be populated with Muslims, it may be populated with Tamils, or it may be populated with Sinhalese; but those considerations must be completely shut from the mind of the Minister concerned.

I have already pointed out that foreign companies have tried large-scale cultivation and have miserably failed.

I agree with the hon. Member for Dompe that the vast acres of paddy fields that we have today were not brought under cultivation by foreign companies. While agreeing with him on that point, I am sorry that he dragged the Federal Party and the question of federalism into an otherwise nice and useful speech. I do not remember the Member for Dompe making any speech recently without dragging in the Federal Party.

Be that as it may, he was quite correct when he said that the thousands and thousands of acres of paddy land that have been brought under cultivation are the result of the work of our peasant ancestors. I, too, see no reason why we should deviate from that traditional method.

In fact when you consider the districts I mentioned, the districts where paddy can be grown, you will find that there is more jungle in those areas than paddy land. I am not in a position to speak of Anuradhapura because I do not know what has been done or what has not been done there. But I certainly can speak of the Amparai District from which I come.

Even the Prime Minister was telling me that when he first visited the Amparai District in the company of his father, when he was Minister of Agriculture and Lands in 1937, he began to develop a love for that place because of the vast stretches of paddy fields. It is because of those vast stretches of paddy fields that the late Mr. D. S. Senanayake thought of the Gal-oya Scheme.

But I regret to say that, while certainly thousands of acres were brought under the plough earlier, a number of acres have been rendered uncultivable, particularly during the last nine years, due to a lack of planning.

Proper drainage has not been provided. Certain lands were developed in the higher reaches and as a result of there being no proper drainage the

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

lower reaches get inundated and consequently become uncultivable. That is the problem that we are facing today, and that is due to a lack of planning.

I think what the Motion we are now discussing seeks to emphasize is the need to bring more land under paddy cultivation.

In 1959, 7,500 acres of land were given to the peasants in the Amparai District, but up to now no access roads have been provided and no drinking-water facilities have been provided. So how do you expect these peasants to go to these jungle areas, clear the jungle and bring the land under cultivation ?

In fact the provision of these facilities may not cost more than one lakh of rupees. But because the land is given to the peasants under some permit the Ministry of Lands thereafter takes it for granted that the land is improved, and that appears as such in the annual reports put out by the Ministry. Year in and year out we find reports being issued by the Ministry of Lands to the effect that so many thousands of acres have been brought under cultivation. After so many years of such reports this country of ours must be one large paddy field !

What really happens is that certain extents of land are made available to the peasants on paper. Thereafter the whole thing is just forgotten. They are not provided with access roads. They are not provided with drinking water. They expect the peasants to live and work there and bring the land under cultivation, without the provision of such facilities. If this problem is looked at realistically, I am sure we can develop thousands of acres without the assistance of these companies. I believe it was last year that the Government leased out thousands of acres to certain foreign companies. Carson Cumberbatch & Company took a thousand acres. I do not know how far it is true, but my information is that companies which have taken lands on lease are using these lands as the dumping ground for heavy machinery for which they are the agents in Ceylon.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

That is right !

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

You will find that our regulations do not permit these foreign companies, which have their sub-offices in Ceylon, to remit money to their home countries. This scheme has provided an ideal opportunity for them to remit money abroad.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

That is quite right !

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

I hear there are hundreds and hundreds of useless heavy machines being imported on the pretext of developing these lands. This is something I heard from a person who knows what he is talking about. I say that we must aim not only at self-sufficiency in paddy but even at exporting paddy at a future date. However, I must disagree with the method that the hon. Member proposes in his Motion of achieving that goal.

Now, in the Amparai District the Ministry of Land, Irrigation and Power is hoping to start big multi-purpose projects but experience shows that these large multi-purpose projects do not give benefits commensurate with the expenditure incurred. If certain small tanks are improved—and also certain retention reservoirs—two to three thousand acres of land could be brought under cultivation. It is a good proposition. The Government is today worried about foreign exchange. It may be that we will require millions and millions worth of machinery to start the Heda-oya Scheme. If two or three lakhs of rupees are spent you can improve four or five old village tanks. By means of those tanks you can


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

irrigate ten thousand to fifteen thousand acres. If you summon the Irrigation Engineer at Batticaloa, or any irrigation engineer with some knowledge of this problem from the Amparai District, he will inform the Hon. Minister about the tanks that are available immediately for improvement. If two or three lakhs are spent in the manner I have stated, I am sure the Heda-oya Scheme need not be started. I say this because we have to cut our coat according to the cloth.

Everybody is now complaining about the lack of money. Why is the Government going to experiment with the Heda-oya Scheme which might cost about Rs. 750 million? All the benefit we might get out of the scheme is the bringing under cultivation of about ten to fifteen thousand acres of land. Every year we hear it said that millions have been spent on the Gal-Oya Scheme. It is said that Satan finds some work for idle hands to do. Now, for the last two or three years there has been practically no development work done under the Gal-Oya Development Board. All that the officers are doing there is shifting a bus stand or an office from one place to another, while practically ninety per cent. of the workers under this scheme are doing nothing. There is nobody to look into the state of affairs prevailing there. In fact, I have said this a number of times, and I say it again with all sincerity. However, some people have unfortunately taken me amiss. I have been saying that if seven or eight thousand acres of land, on which sugar cane is now being grown, are utilized for paddy cultivation, we will be well on the road to self-sufficiency in paddy. It has been said that we are losing annually about Rs. 8 million in the production of sugar, which costs the Government about Rs. 1.75 per pound. We are, in fact, producing the miserably low quantity of three hundred tons of sugar whereas our annual requirement for consumption is something like thirty thousand tons.

I feel that we have to look at this problem anew. I would even suggest that a Committee of Members of Parliament be appointed to go into the working of the Gal-Oya Development Scheme, because it may be that we can——

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Are you not straying from the subject?

**මුස්තාෆා මයා.**

*(ஜனாப் முஸ்தபா)*

(Mr. Mustapha)

I am sorry, Sir.

I suggest that even at this stage it would be useful if a sub-committee of this House goes there and sees what the Gal-Oya Development Board has been able to achieve.

I do not want to take much more of the time of the House, but I must say that the Motion, as it is, will not find my support for the reason that I am opposed to foreign companies being given our jungle lands for the production of paddy. It is not only unwise, but I feel that, far from producing paddy, they will find in it a grand opportunity to send out money to their own countries.

අ. භා. 5.20

**පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉතාමත් සන්තෝෂ වෙනව, සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමාගේ කථාවට පසුව කථා කරන්ට ඉඩක් ලැබීම ගැන. ගොවියකුගේ පුතකු හැටියට සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාට පැහැදිලි ලෙස පෙනී ගොස් තිබෙනව, මේ යෝජනාව ක්‍රියාවේ යෙදීමෙන් මේ රටට සිදු විය හැකි විපත්තිය කෙබඳුද කියා. ඒ විපත්තිය පෙනෙන නිසා තමයි, අද එතුමා ආණ්ඩු පක්ෂයෙන් පිටවෙලා ආණ්ඩුවෙන් පත් කරන ලද මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාවට සම්පූර්ණයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කරන්ට ඉදිරිපත් වුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුරාණයේ සුදු අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ අපේ රටේ ඉඩම් අධිරාජ්‍යවාදී කොම්පැණිවලට තේ රබර් වවන්ට පවරා දීම නිසා ඒවායේ කටයුතු සඳහා ඉන්දියානු කම්කරුවන් යෙදවීමෙන් මේ රටේ ඉන්දියානු ප්‍රශ්නය උග්‍ර වී තිබෙන මේ අවධියේ අපේ රටේ ජනතාවටවත් අවශ්‍ය තරම් ඉඩම් නොමැතිව සිටියදී ඉතුරු වෙලා තියෙන ඉඩම් ටිකත් විදේශීය කොම්පැණිවලට පවරා දෙන්ට යයි ආණ්ඩුවෙන් පත් කරන ලද මන්ත්‍රීවරයෙක් යෝජනා කිරීම ඇත්ත වශයෙන්ම කනගාටුදායකයි.

සිංහල රජදරුවන්ගෙ කාලයේ මේ රටේ ගොවිතැන් කර නිපදවා ගත් සහල් පිට රට යවන්ට තරම් තත්ත්වයක් ඇති කළේ මේ විදේශික කොම්පැණිකාරයින් නොවන බව තමුන්නාන්සෙ දන්නවා ඇති. අද මේ රටේ ජනතාවට මුහුණපාන්ට සිදුවී තිබෙන තත්ත්වය කුමක්ද ? අපේ රටේ ජනතාවට පදිංචි වන්ට ඉඩම් කෑබැල්ලක් මිළදී ගැනීම අද දුෂ්කර කාරියක්ව තිබෙනව. තමුන්නාන්සෙගෙ කොට්ඨාවයෙත්, මගේ කොට්ඨාශයෙත්, අනිකුත් කොට්ඨාශවලත් අද ඉඩම් බෙදා දීම සඳහා ඉඩම් කච්චේරි පවත්වනව. දැන් අවුරුදු 10 කට පමණ පෙර කාලයෙදි එක ගොවියෙකුට ඉඩම් අක්කර 2 බැගින් ලැබුණා. පසුව එය ක්‍රමයෙන්, අක්කරය, අක්කර බාගය, අක්කර කාල, ආදී වශයෙන් අඩු වීගෙන ගොස් දැන් මාතර දිස්ත්‍රික්කයේ ගොවියෙකුට ලැබෙන්නෙ ඉඩම් අක්කර 1/8 යි. ඉඩම් ප්‍රශ්නය අපේ ප්‍රදේශවල ඒතරම් දැවෙන ප්‍රශ්නයක්ව තිබෙනව. අක්කර 1/8 ක් කුමකට ලබා ගන්නවාද කියන එකයි, ගොවීන් නගන ප්‍රශ්නය. එපමණක් නොවෙයි, ඉඩම් කච්චේරියකින් ඉඩමක් ලබා ගන්න ගියාම සිදු වෙන්නෙ කුමක්ද ? ඉඩම් ලබාගැනීමට පැමිණෙන අයගෙන් නිලධාරියා අහන පළමුවෙනි ප්‍රශ්නය "ඔබ කසාද බැඳලද, නැද්ද ?" කියන එකයි. කසාද බැඳල නම් ඉඩම ලැබෙනව ; බැඳල නැත්නම් ලබෙන්නෙ නැහැ. ඒ වගේම කසාද බඳින්ට ගියාම අහන්නෙ, "ඉඩම් තිබෙනවද, නැද්ද ?" කියලයි. ඉඩම් නැත්නම් කසාද බඳින්ට බැහැ ; කසාද බැන්දෙ නැත්නම් ඉඩම් ලැබෙන්නෙ නැහැ. ඒකයි, අද රටේ තිබෙන තත්ත්වය. මෙතරම් ප්‍රශ්න කරලයි සාමාන්‍ය ගොවියෙකුට රජයෙන් ඉඩම් කෑබැල්ලක් දෙන්නෙ. අද එවැනි තත්ත්වයක් පවතින මේ රටේ පත් කරන ලද මන්ත්‍රීතුමා කියනව, ඉතුරුව තිබෙන ඉඩම් ටිකත් විදේශික කොම්පැණිවලට භාර දෙන්ට කියා. අඩු ගණනේ අපේ රටේ ධන පතීන්ටවත් දෙන්න යයි කිව්ව නම්, දෙන්ට කියන්නෙ ලාංකික ජනතාවටය කියාවත් අපට ටිකක් සැහීමකට පත් වන්ට ඉඩක් තිබුණා. ඒ මන්ත්‍රීතුමා කියන්නෙ, අමෙරිකන්, ඉංග්‍රීසි, ප්‍රංශ, ජපන් ආදී විදේශික කොම්පැණිවලට දෙන්ට කියලයි. එහෙම කළොත් අර සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්ව වගේ ඔවුන් මෙරටට පිටරටින් යන්ත්‍රෝපකරණ ගෙනැවිත් ඔවුන්ගේ ජාවාරම් ඉදිරියට ගෙන යන්ට උත්සාහ කරනව මිසක් ඒවා දියුණු කරන්ට මහන්සි ගන්නෙ නැහැ. ඒ මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කළේ කොහේ ලණුවක් කාලාදැයි මා දන්නෙ නැහැ.

මේක පුදුම යෝජනාවක්. මේකට මොන විධියකටද, එකඟවන්ට පුළුවන් ? වී වපුරන්න පොළොව සකස් කරන්නෙ කවුද ? සාමාන්‍ය ගොවියා. පුරන් කොටන්නෙ ගොවියා ; පොළොව සකස් කරන්නෙත් ගොවියා ; නියරවල් බඳින්නෙත් ගොවියා ; ඇළ-වේළි සුද්ධ කරන්නෙත් ගොවියා ; ගොයම් කපා පාගන්නෙත් ගොවියා. මේ සියලුම කටයුතු කර ගන්නෙ සාමාන්‍ය ගොවි ජනයායි. ඇයි, ඒ ජනතාවට වගා කරන්ට ඉඩම් දෙන්ට බැරි ? පිටිරටින් එන සුද්දට තමයි, ඕක කරන්ට පුළුවන්. අපේ රටේ කුඹුරුවල උදේ සිට හැන්දෑ වනතුරු කුඹුරු වැඩ කරන ගොවියා ඊට සුදුසු නැහැ! මේ අයිතිවාසිකම් සියල්ලක්ම ගොවියාට ලබා දෙනවා නම් මේ කටයුත්තට අපේ ගොවීන් ඉතා දක්ෂ බව මා මතක් කරන්ට කැමතියි.

අපේ රටේ දැනට වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණයේ අස්වැන්න ලෝකයේ අනිකුත් දියුණු රටවල අස්වැන්න ප්‍රමාණයට වැඩි කර ගන්නව නම් අළුතෙන් කුඹුරු වගා නොකළාට රට ස්වයංපෝෂිත කර ගන්ට පුළුවන් බව මා පසුගියදා විශේෂඥයින් පිරිසකගේ වාර්තාවකින් දුටුව. පසුගිය කාලයේ ලැබුණෙ අක්කරයකින් බුසල් 28 යි. දැන් එය බුසල් 45 ක්, 46 ක් තරම දක්වා වැඩි කරගෙන තිබෙනව. නවීන යන්ත්‍රෝපකරණ, රසායනික පෝර වර්ග යොදන ගොවීන් අද තව ටිකක් උනන්දුවෙන් වැඩ කරනව. කුඹුරු පණත නිසා තවත් ටිකක් උනන්දුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

වැඩ කරනව. ඒ වගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ගොවීන්ට උපදෙසුත් ලැබෙනව. ඔය ආදි කටයුතු නිසා අද අස්වැන්න වැඩි වී තිබෙනව. අස්වැන්න තවත් වැඩි කර ගැනීමට ගොවීන්ට ආධාර දෙනව විනා අපේ රටේ තිබෙන ඉඩම් ටික විදේශීය කොම්පැනිවලට දෙන එක සුදුසු ද කියා තමුන්නාන්සෙට කල්පනා වෙනව ඇති.

එපමණක් නොවෙයි. අද යම්කිසි විදියකින් අපේ රටේ කුඹුරු පාළු වෙනව නම් එසේ වෙන්නේ ගොවීන්ගෙ වරදක් නිසා නොවෙයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ වරද නිසා බව අපි කල්පනා කරන්ට ඕනෑ. බොහෝ ප්‍රදේශවල ඉන්න ගොවීන් අද උනන්දුවෙනව, තමන්ගෙ කුඹුරු ටික ඉතාමත් උසස් අන්දමට සශ්‍රීක කරගන්ට නමුත් මේ රටේ තිබෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ ඇලිමැලි දුබලකම නිසා, උදාසීනභාවය නිසා, අර ගොවීන්ට තමන්ගෙ උත්සාහයෙන් නියම ප්‍රයෝජනයක් ලබා ගන්ට බැරි වී තිබෙනව. පසුගිය දවස්වල සිදුවුණු ජලගැලීම නිසා විපතට පත්වුණු අයට ආධාර ලබා දෙන්ට අපි සමාජ සේවා ඇමතිතුමා ළඟට ගියා. සෑමදාමත් මේ විදියෙ ජලගැලීම්වලින් විපතට පත්වන අයට ආධාර ලබා දෙන්ට පුළුවන් ද? සෑම අවුරුද්දකම වගෙ යම්කිසි ප්‍රදේශයක් ජල ගැලීමකින් යටවෙනව. එවිට ගොවීන්ට ආධාර දෙනව; කැඩිච්ච ගෙවල් හිමියන්ට ආධාර දෙනව. මේ වැඩපිළිවෙළ දිගටම ගෙනයනව. ඊට වඩා නරකද, මේ ගොවීන්ට සිදුවන විපතින් ඔවුන් සදහටම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් යෙදුවොත්? නිල්වළාගඟ යෝජනා ක්‍රමය වැනි යෝජනා ක්‍රම මේ සභාවට ඉදිරිපත් කර අවුරුදු ගණනාවක් වෙනව. නමුත් අද වන තුරු ක්‍රියාත්මක වී නැහැ. මෙන්න මේ නිසා තමයි, අද මේ රට ස්වයංපෝෂිත කිරීමේ පරමාර්ථය මුදුන්පත් කරගන්ට බැරි වී තිබෙන්නෙ. ඒ මිස ගොවීන්ගෙ අලසකම නිසා නොවෙයි. ගොවීන්ට ලැබෙන්ට තිබෙන ආධාර රජයෙන් නිසියාකාරව ලැබෙන්නෙ නැහැ. නමුත් අපේ ගොවීන් ඉතාමත් උනන්දුවෙන් කටයුතු කරනව.

කම්කරු හා සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්ව වගෙ, දනට අක්කර 34,000 ක් පමණ "සිලෝන් ටුබැකෝ", "කාසන් කම්බර්බැච්" ආදි කොම්පැනිවලට දී තිබෙනව. ඒ ඉඩම් කොම්පැණිවලට දී තිබුණට, ඒවයෙ වැඩ කරන්නෙ කවුද? ඒවයෙ වැඩ කරන්නෙ අපේ රටේ සාමාන්‍ය දුප්පත් මහජනතාවයි. ඒ මිස ඒ උදවිය පිටරටින් මිනිස්සු ගෙනැවිත් නැහැ. ඒ කොම්පැණිවලට දෙන ආධාර සාමාන්‍ය ගොවීන්ට දෙනව නම් ගොවීන් මීට වඩා උනන්දුවෙන් වැඩ කරනව ඇති.

ගල්ඔය ව්‍යාපාරය දිහා බලන්න. ඒ ව්‍යාපාරයෙ ගොවීන් උනන්දුවෙන් වැඩ කරන්නෙ නැද්ද? චන්ද්‍රිකා ව්‍යාපාරය පටන් ගැන්මෙදි ගොවීන් පිටත් කළේ කැලෑවලටයි. ගොවීන්ට යන්න පාරක්වත් සකස් කර තිබුණෙ නැහැ. ඒ විදියෙ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයෙ ඒ ගොවීන් එම ඉඩම් සකස් කර, අද ඒ ව්‍යාපාරය ක්‍රමයෙන් විශාල ජනපද ව්‍යාපාරයක තත්ත්වයට පමුණුවා තිබෙන බව තමුන්නාන්සෙ දන්නව ඇති. ආණ්ඩුව උඩවලවේ යෝජනා ක්‍රමයෙ ගොවීන් පදිංචි කළේ ඊට වඩා වෙනස් අන්දමකටයි. ගොවීන්ට නියම තත්ත්වයක් ඇතිව ජීවත්වීමට ආණ්ඩුවෙන් ගෙවල්, පාරවල් සාදා දී උඩවලවේ යෝජනා ක්‍රමය ඇති කර තිබෙනව. ඒ යෝජනා ක්‍රමයට ගිය ගොවීන් උනන්දුවෙන් වැඩ කරනව. ඇයි? මඩින් අක්කර 3 ක් හම්බ වෙනව; ගොඩින් අක්කර 2ක් හම්බ වෙනව; පදිංචියට ගෙයක් හම්බ වෙනව.

උඩවලවේ යෝජනා ක්‍රමයෙන්, චන්ද්‍රිකා වැව යෝජනා ක්‍රමයෙන්, රාජාංගන වැව යෝජනා ක්‍රමයෙන්, ගල්ඔය යෝජනා ක්‍රමයෙන් ඉඩම් ඉල්ලා මාතර දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ගෙන් අපට පෙත්සම් ලැබෙනව. අපේ පළාත්වල ඉන්නෙ කුඹුරු වැඩට සහජ දක්ෂතාවයන් ඇති, එමෙන්ම හුරුපුරුදුකම් ඇති ගොවි ජනතාවක්. කුඹුරු කිරීම සඳහා ඉඩම් නැති වයි, ඒ ජනතාව අද ඉන්නෙ. ඒ නිසා මන්ත්‍රීවරුන් වන අපෙන් සෑමදාම ඉඩම් ඉල්ලනව. ගොවිතැන් කරන්ට. ඒ අතර තුර, තිබෙන ඉඩම් ටිකත් විදේශීය කොම්පැණිවලට දෙන්ටය කියා මේ ගරු සභාවට යෝජනා කරනව. මේකයි, පුදුම කාරණය. ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් කර ඔවුන්ට රජයෙන් ආධාර ලබා දෙනවා නම් ඒ ඉඩම් නැති ගොවීන් කැමතියි, ඕනෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තැනකින් ඉඩම් ලබාගෙන ගොවිතැන් කරන්ට. එවැනි වැඩ පිළිවෙළක් යෙදීම ගැන මේ ගරු සභාවෙ කිසිවෙක් විරුද්ධ වේය කියා මම හිතන්නෙ නැහැ. මේ සභාවෙ ආණ්ඩු පැත්තෙ හිටියත්, විරුද්ධ පැත්තෙ හිටියත් කාටත් වුවමනා කරන්නෙ මේ රට ස්වයංපෝෂිත කිරීමටයි. කිසිවෙක් ඊට විරුද්ධ වන්නෙ නැහැ. මේ රට ස්වයංපෝෂිත කරන තුරු මේ රටේ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යාමට බැරි බව අපි කවුරුත් පිළිගෙන තිබෙනව. ඒ නිසා, රට ස්වයංපෝෂිත කිරීමයි, ඉතාමත් වැදගත් කාරණය. තත්ත්වය එසේ තිබියදී මේ රටේ ඉතුරු වී තිබෙන ඉඩම් ටිකත් විදේශීය කොම්පැණිවලට දෙන්ට කියා යෝජනා කරනව නම්, ඊට අපේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරනව.

ඉන්න තැනක් නැති නිසා, ගොවිතැන් කර කියා ගැනීමට ඉඩමක් නැති නිසා, අද ඇතැම් ප්‍රදේශවල ගම්බද ජනතාව තමන් වාසය කරන ස්ථානය අවට තිබෙන ඉඩම් බලහත්කාරයෙන් අල්ලාගෙන තිබෙන බව තමුන්නාන්සෙත් දන්නව. උඩ වලවේ යෝජනා ක්‍රමය වැනි යෝජනා ක්‍රම ඇති කර ගොවි ජනතාව අතර ඉඩම් බෙදා දීමේ වැඩ පිළිවෙළක් ඇති කරනවා නම් ගොවීන් ඒවා ලබාගෙන කටයුතු කරන්න සූදානමින් සිටිනව. එහෙත් දැන් තිබෙන ප්‍රශ්නය කුමක්ද? විදේශීය කොම්පැනිවලට ඉඩම් දීමයි දැන් කෙරෙන්නෙ. විදේශීය කොම්පැනිවලට ඉඩම් දුන්නත් යන්ත්‍රෝපකරණ ගෙන්වන්න පුළුවන්ද? ඔන්න ඔය ප්‍රශ්නය උඩයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ. අපට දැන් කරන්න තිබෙන්නෙ විදේශීය කොම්පැනිවලට අපේ ඉඩම් දීම නොවෙයි. අපේ ගොවි ජනතාවටයි ඉඩම් දිය යුතුව තිබෙන්නෙ. අපේ ජනතාවට—අපේ ගොවීන්ට—ඉඩම් දී පුළුවන් තරම් රජයෙන් ආධාරත් දෙන්න ඕනෑ. ගොවීන්ට අවශ්‍ය වන උපදෙස් දෙන්නත් ඕනෑ. නවීන ක්‍රම උපයෝගී කරගෙන වඩාත් සාර්ථක අන්දමට ගොවිතැන් කරන ආකාරය ඒ අයට කියා දෙන්න ඕනෑ. රජයෙන් ලැබෙන උපදෙස් අනුව වඩාත් ප්‍රතිඵල ලැබෙන ආකාරයට ගොවිතැන් කරන්න වැඩ පිළිවෙළක් යොදන්නයි අපට වුවමනා කරන්නෙ. දැනටමත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් දෙනු ලබන උපදෙස් අනුව ගොවි ජනතාව උනන්දුවෙන් වැඩ නොකරතැයි කියන්න පුළුවන්කමක් නැහැ. උපදෙස් අනුව ගොවිතැන් කරන නිසා තමයි අස්වැන්න වැඩි වෙලා තිබෙන්නෙ. ලබා ගත හැකි අස්වනු ප්‍රමාණය තව තවත් වැඩි කර ගැනීමට රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලොකු වාරිමාර්ග කටයුතු හරියාකාර සකස් නොවන නිසයි ගොවීන්ට අද නොයෙක් හිරිහැර කරදරවලට මුහුණ පාන්න සිදු වී තිබෙන්නෙ.

මාතර දිස්ත්‍රික්කයේ නගරයට ආසන්න වම ඉඩම් අක්කර හාර දහක් පමණ කිසිම වගාවක් නැතිව තිබෙනව. එය හොඳ කුඹුරු යායක් කරන්න පුළුවනි. වතුර ලබා ගන්න වැඩ පිළිවෙළක් නැති නිසා එය ප්‍රයෝජනයට ගන්න බැරි තත්ත්වයක තිබෙනව. තීන්තාවුර්හි ගරු මන්ත්‍රීතුමා (එම්. එම්. මුස්තාෆා මයා.) කීවාක් මෙන්, වතුර නැතිකම නිසා විශාල බිම් ප්‍රමාණයක් කිසිම ප්‍රයෝජනයක් ගන්න බැරි තත්ත්වයක පවතිනව. කිරළ කැලේ යෝජනා ක්‍රමය නමින් හැඳින්වෙන මේ ඉඩම් කට්ටියට ජලය සපයන ලෙස ගරු මන්ත්‍රීවරුන් නොයෙක් වර කරුණු ඉදිරිපත් කර තිබෙනව. මේ සඳහා වුවමනා කරන්නේ රුපියල් ලක්ෂ අටක් පමණයි. ඒ සඳහා වැය වන මුදල් ප්‍රමාණය මෙතෙකැයි ඇස්තමේන්තු කර තිබෙනව. ගරු ඇමතිතුමාගේ සංවර්ධන යෝජනා ක්‍රමවලට මෙය අඩංගු කර තිබෙනව. මේ යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය වන්නේ රුපියල් අට ලක්ෂයක් පමණක් වුවත් තවම එය කරන්න බැරි වී තිබෙනව. මුදල් නැතැයි කියන්න බැහැ. පරණ හුවන්දිරම් බදු ක්‍රමයෙන් එකතු කරන ලද රුපියල් ලක්ෂ හතක මුදලක් මාතර කච්චේරියේ තිබෙනව. එහෙත් ඒ මුදල ලොකු වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා යොදන්න බැරි බවක් භාණ්ඩාගාරය කියනවලු. ඒ කියමන සනාථ කරන්න ඔවුන් පරණ පුස්කාපු රෙගුලාසි ඉදිරිපත් කරනවා. සුළු යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මිස ලොකු යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මේ මුදල් යොදන්න බැරිලු. මැෂින් දෙකක් සවි කළොත් අක්කර හාර දාහක් වී ගොවිතැන සඳහා පාවිච්චි කරන්න පුළුවනැයි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂඥ පරීක්ෂණයකින් පසු වාර්තා කර තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

මෙවැනි ඉඩම් නොයෙක් පළාත්වල ඕනෑ තරම් තිබෙනව. මෙවැනි තත්ත්වයක් පවතිද්දී මේ ඉඩම් ප්‍රමාණය විදේශීය අධිරාජ්‍යවාදීන්ට දීමට යම්කිසි වැඩ පිළිවෙළක් යම් කෙනකු විසින් සකස් කෙරෙතොත් ඊට අප තරයේම විරුද්ධ වන බව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ ප්‍රතිපත්තියට විරුද්ධව අප සටන් කරන බවත් ප්‍රකාශ කරන්න ඕනෑ. සමාජවාදී ලංකාවක් ගොඩ නැංවීමට බලාපොරොත්තු වෙනවා නම් නැවතත් අපේ රටේ ඉඩම් අධිරාජ්‍යවාදීන්ට ලබා ගැනීමට ඉඩ නොතබා විරුද්ධත්වය පළ කළ යුතු බව මතක් කරන්න කැමතියි. අධිරාජ්‍යවාදීන්ට නැවතත් වරක් අපේ රටේ ඉඩම් ලබා ගැනීමට අවස්ථාවක් ඇති කර දීම සමාජවාදී ලංකාවක් ගොඩනැඟීමේ ප්‍රතිපත්තියට ඉදුරාම පටහැණි බව තමුන්නාන්සේ පිළිගනු ඇතැයි මා කල්පනා කරනව. මේ ප්‍රශ්නය ඔය ආකාරයට උග්‍ර තත්ත්වයක මේ රටේ තිබියදී පත් කරන ලද ගරු මන්ත්‍රීතුමා—දොස්තර රත්න පාල මහත්මයාට සිත් වේදනා ඇති වන යමක් කියන්න මා කැමති නැහැ—මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර ඇතත් අපට එය පිළිගන්න බැහැ. පත් කරන ලද මන්ත්‍රීවරයකු ඇමති කෙනකු හැටියට කට යුතු කිරීමෙන් එහා ස්ථානයේ සිට කර තිබෙන දේ තමුන්නාන්සේ දන්නව. ඒත් දොස්තර මහත්මයෙක්. තවත් පත් කරන ලද ගරු මන්ත්‍රීවරයෙකු වන දෙස්තර මහත්මයෙක් මේ ගරු සභාව වෙත යෝජනාවක් ඉදිරිපත් කරමින් විදේශීය කොම්පැනිවලට මේ රටේ ඉඩම් දෙන්නැයි කියනව. ගොවි ජනතාවගේ එදිනෙදා ජීවිතය සම්බන්ධයෙන් මනා දැනීමක් තිබෙන මන්ත්‍රීවරයෙකු හැටියටත්, බහුල වශයෙන් ගොවි ජනයා වාසය කරන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියටත්, මා ඊට විරුද්ධත්වය පළ කරනව. ආණ්ඩු පක්ෂයේ සිටියදීත් නිත්තාවූර්හි ගරු මන්ත්‍රීතුමා පවා ඒ අන්දමට කථා කරන්නට ඇත්තේ ඒ නිසාම වෙන්න ඕනෑ. ඒ නිසා අපට මෙයට එකඟ වෙන්න පුළුවන්කමක් ඇත්තේම නැහැ. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන් පවා සම්පූර්ණයෙන් විරුද්ධත්වය පළ කරන නිසා මේ යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලෙස පත් කරන ලද ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනව.

අ. භා. 5.35

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව යටතේ දීර්ඝ කථාවක් කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. කථා දෙක තුනකට පමණක් පිළිතුරු දීමටයි මා අදහස් කරන්නෙ. මෙම අවස්ථාවෙදි අප කාටත් නොයෙකුත් අන්දමේ විවේචන වලට කන් දෙන්ට ලැබුණා. ඒ විවේචන වලට සවන් දුන්න කාටත් පෙනී යන්නට ඇති, අපි මේ රටේ සංවර්ධනය උදෙසා කිසිවක් නොකරන නොසැළකිලිමත් පිරිසක් හැටියට. ගැලරියෙ අසා සිටින ජනතාවටත් පත්‍ර කියවන ජනතාවටත් බොහොම ලොකුවට ඒ හැඟීම ඇති වෙනව. අපි කිසිම සැළකිල්ලක් දක්වන්නෙ නැතුව මේ රට විනාශ කරනවය කියන හැඟීම ඇති වෙනව, ඒ අයට. මගෙ අමාත්‍යාංශයෙ පාර්ලිමේන්තු ලේකම්තුමා කියන්ට යෙදුණා සීනි කර්මාන්තය ගැන. එයින් අවුරුද්දකට ලක්ෂ 80 ක් පාඩු විදින්ට සිදු වෙනව. මේ ආණ්ඩුව කෙසේ හෝ එය පවත්වා ගෙන යන්ට ඕනෑ. වගා කර තිබෙන උක් ප්‍රමාණයෙන් නිපදවන සීනි ප්‍රමාණය ලංකාවෙ ජනතාවට දින 3 කට වත් සෑහෙන්නෙ නැහැ. ඒකට වැරදිකාරයො කවුද? අපි! නමුත් මේක පටන් ගත්තෙ 1961 නැතිනම් 1962 දීයි.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**

(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)

(Dr. S. A. Wickremasinghe—Akuressa)

පිළිපුයි, සීපීයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**

(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)

(The Hon. N. H. A. M. Karunaratne)

කොහොම මිනිහ හරි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව කාලෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)
තමුන්නාන්සෙ සිටියෙත් ඒකෙ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
මම කල් තියා පැන්න මිනිහෙක්. 1961 හෝ 1962 දීයි පටන් ගත්තෙ. [බාධා කිරීම්] මම කැබිනට් මණ්ඩලයෙ හිටිය මිනිහෙක් නොවෙයි. මම එම ආණ්ඩු පක්ෂයෙ සිටියදීම නිර්භයව එම ආණ්ඩුව විවේචනය කර පැනපු මිනිහෙක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
දැන් අරය විවේචනය කරනව.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratr e)
ඒකට කමක් නැහැ. පුද්ගලික යෝජනාවක් ගැන එහෙම කතා කළාට කමක් නෑ. I appreciate the view of my Parliamentary Secretary. 1961 දී හෝ 1962 පටන් ගත්, ලක්ෂ 80 ක් අවුරුද්දකට පාඩු විඳින ව්‍යාපාරයක් මේක. ඒ බර ලංකාවෙ ජනතාවට උසුලන්ට ඕනෑ. ඒක කියන්නෙ නැහැ. මේකෙන් මේ රටේ ජනතාවට දින 3 කට සෑහෙන සීනි නිපදවන්නට පුළුවන්කමක් නැහැ. සීනි මෝල හැදුවට උක් වගා කළේ නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
දැන් වවල තියෙනව.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
වවනවද නැද්ද බලන්න ඕනෑ. අපි අවුරුදු 5 ක් කළාට පස්සෙ හොඳ නැති නම් අපට විරුද්ධව කතිරෙ ගැසූ විට අපි ගෙදර යනව. එතකන් අපට ඉඩ දෙන්න ඕනෑ. තමුන්නාන්සෙල අවුරුදු 9 ක් පොල් ගාල තියෙනව. [බාධා කිරීම්] තමුන්නාන්සෙලයි, බණ්ඩාරනායක මැතිණියට පුළුවන් තරම් විරුද්ධව වැඩ කළේ. පුළුවන් තරම් මේ රටේ ස්වීරයික් ඇති කර රජයේ වැඩ කටයුතු කඩාකප්පල් කර රට කාපු මිනිස්සු දැන් ඔහොම කතා කරනව. [බාධා කිරීම්] නොමර මැරුව. දැන් ඔහොම කතා කෙරුවට අපියි එදා සටන් කරල ආණ්ඩුවක් පිහිටුවන්න කටයුතු කළේ ; තමුන්නාන්සෙල නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Is all this necessary ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
Sir, I have to reply to these interruptions, these provocations. I have to defend myself.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)
Quite right ! He has to reply to his Parliamentary Secretary.—[*Interruption*].

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඒ සීනි මෝල වෙනුවෙන් ලක්ෂ 80 ක ආණ්ඩුවේ ධනය නිකම් වැය වී තිබෙනව. මේව මහජන මුදල්. මේ රටේ මිනිසුන්ට දින 3 කට සෑහෙන්න සීනි නිපදවන්න බැහැ. නමුත් ඒක පවත්වා ගෙන යන්න ඕනෑ. ඒ බර උසුලා ගෙන යන අතරම අපේ බලාපොරොත්තුව වන්නෙ උක් වැවීම දියුණු කොට මෙම මෝල ප්‍රයෝජනයට ගෙන රටට ඇති වන ප්‍රමාණයට සීනි සෑදීමයි. අවුරුද්දකුත් මාස 5 ක්—

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
මොන වාර්තාවෙන්ද විස්තර ගත්තෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

වාර්තාව? අවුරුදු 5 අවසාන වන විට වාර්තාව පෙන්වන්නම් ඕනෑනම්. වාතීං වෙන් වැඩක් නැහැ; වැඩේ කෙරෙන්ටයි ඕනෙ. අපි පොතේ ගුරාල නොවෙයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඒ කාලෙ සීනි හදාපු එක්කෙනාමයි දන් හදන්නෙත්.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

අපිට පුළුවන් වුණොත් ඒ විධියට කර නව. බැරි වුණොත් එය මහජනය විසඳා ගනීවි.

ඊළඟට ඉඩම් බෙදීම සම්බන්ධව විවේච නය වුණා. මේ ඉඩම් විදේශීන්ට දෙන වය කීව. කාරණය ඇත්ත. අක්කර 2,000, 3,000, 8,000 සහ 10,000 යනාදී වශ යෙන් ඉඩම් දෙනව. කොහොමද? සින් නක්කර විදියට නොවෙයි; රත්වත්තෙ පවුල් විදේශීන්ට, ඉංග්‍රිසිකාරයින්ට පන් දම් අල්ලමින් ඔවුන්ට තේ වවන්ට අනූ නව අවුරුද්දෙ බද්දට ඉඩම් දුන්න වාගෙ නොවෙයි. මුළු උඩරට ප්‍රදේශයම අද සුද් දන්ගෙ අතේ තියෙන්නෙ කවුරු නිසාද?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

රත්වත්තෙ නොවෙයි; මොලමුරේ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

එක එක රදළ පවුල් විදේශිකයන්ට රට පාවා දුන්න; මේ රටේ ඉඩම් සුද්දන්ට දුන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මොලමුරේලා එහෙම. [බාධා කිරීමක්] බලංගොඩින් පිළිතුරු දීලා තිබෙන්නෙ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අය කියන විට අපි අහගෙන හිටියෙ. අපි කියන විට ඒ අයට බොහොම අමාරුයි. ඒ පැත්තෙ මන්ත්‍රීවරු කථා කරන විට අපි අහගෙන ඉන්න ඕන. අපි කථාකරන විට ඒ අයට ඕනෑ දෙයක් කථා කරන්න ඉඩ දෙන්න ඕන. මේ ගරු සභාවේ තිබෙන නීතිය ඒකද? එය තමුන්නාන්සේගේ වරදක් නොවෙයි; ඒ අයගේ නැහැදිච්ච කම.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

කාටද නැහැදිච්ච අයය කියන්නෙ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

නැහැදිච්ච අයටයි කියන්නෙ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! Please stop these private conversations. The Hon. Minister may go on with his speech.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

You know, Sir, I am ready for anything.—[*Interruption*].

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Hon. Member for Baddegama, please allow the Minister to continue his speech.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

Are they to have the privilege of revelling in this way with criticisms of this sort? They must not interrupt me; they must allow me to speak. Does it mean that only they can hold the Floor in this House? Are they the only Members of Parliament?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Minister is now holding the Floor. Please go on.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තමුන්නාන්සේට කියමින් සිටියේ ඉඩම් බෙදාදීම සම්බන්ධවයි. අපි ඉඩම් බෙදා තිබෙන්නේ මෙන්න මේ ක්‍රමයටයි: මෙතෙක් කල් මේ රටට අවශ්‍ය කරන මිරිස්, ළූණු, අර්තාපල් ආදී දේවල් ගෙන්වා ගත්තේ මුදල් ගෙවා පිටරට වලිනුයි. අදත් ඒ ද්‍රව්‍යයයන් සඳහා කෝටි 16ක් පමණ වැය කරනව. මේ රටේ ජනතාව ජීවත් වන්නේ අන්න ඒ තත්ත්වය යටතේයි. අද තිබෙන මුදල් තත්ත්වය අනුව මොන විධියකින් හෝ රට ආහාර අතින් ස්වයංපෝෂිත කරන්න ඕනෑය කියා අපි කල්පනා කළා. ධනය ඇති හොඳ ධන කුවේරයින් මේ රටේ සිටිනව. එමෙන්ම ධනවත් කොම්පැනි තිබෙනව. ඒ අයට ඉඩම් දී—සින්නක්කර නොවෙයි—මේ රටට වුවමනා කරන හාල්, මිරිස්, ළූණු ආදී ආහාර ද්‍රව්‍යයන් නිපදවා ඒවයින් මේ රට ස්වයංපෝෂිත කළ යුතුයි කියා අපි කල්පනා කළා. එසේ කරන්නේ ඒ අයගේම වියදමින්. ඒ කටයුතු සඳහා ආණ්ඩුවට මුදල් නැහැ. මුදල් නැතිවීම ගැන වගකිව යුත්තේ කවුරුන්ද කියන එක තමුන්නාන්සේලා දන්නවා ඇති. එසේ කළොත් අපේ විදේශ විනිමය ඉතිරි කර ගන්න පුළුවන් වෙනව. අද භාණ්ඩාගාරයේ තිබෙන මුදල් තත්ත්වය අනුව වෙන කළ හැකි දෙයක් නැහැ. දුප්පත් ගොවීන්ට ඉඩම් දී ඒ මගින් රට ආහාර අතින් ස්වයංපෝෂිත කළ හැකි නම් මාත් සන්තෝෂයි. එහෙත් එපමණකින්ම රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීම ටිකක් අමාරුයි. අපි ගොවීන්ටත් ඉඩම් දෙන අතරම මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීම සඳහා මා කලින් සඳහන් කළ විධියේ අයටත් ඉඩම් දෙනව. දුප්පත් මහජනතාවටත් ඕනෑ තරම් ඉඩම් දෙනව. අපේ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්න යෙදුණ අක්කර 2 දුන්නාය, අක්කර 1 දුන්නාය, අක්කර ½ දුන්නාය, අක්කර 1/4 ත් දීලා දැන් එයිනුත් පහළට බහිනවාය කියල. එය පසුගිය අවුරුදු එකකුත් මාස 5 තුළ සිදු වූ දෙයක් නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අදත් කෙරෙනව.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඒක අපි වෙනස් කරනව. අපි විදේශීය කොම්පැනි කාරයින්ට ඉඩම් දෙනව. එසේ දෙන්නෙ ගෙවල් හදාගෙන පදිංචි වී ඉන්න නොවෙයි. තාවකාලිකව මෙහි පදිංචි වී මේ රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිපදවීමටයි. ඒ සඳහා මේ ක්‍රමය මිස වෙනත් ක්‍රමයක් තිබෙනවදැයි මම විරුද්ධ පක්ෂයෙ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහනව. ගමේ දුප්පත් මනුෂ්‍යයට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය ටික කවුරුන් ලවා හෝ මෙහිම නිපදවා ගැනීමේ උත්සාහයක් අපි දරන්නෙ. මේ වැඩ පිළිවෙළ සාර්ථක වුණොත් අද විරුද්ධ පක්ෂය ඔය කියන බොරු ඔක්කොම නැති වී රට ස්වයංපෝෂිත වෙනව. මේ රටේ ඉඩම් ටික විදේශීය කොම්පැනි වලට දෙන බව ප්‍රකාශ කරමින් මහජනය කුපිත කරවීමයි අද විරුද්ධ පක්ෂය කරන්නෙ. අපි ඒ විධියට ඉඩම් දෙන බව ඇත්ත. එසේ කරන්නෙ අපට පිස්සුවක් හැදිල නොවෙයි. ඒ මාර්ගයෙන් ගම්බද ජනතාවගෙ ජීවන තත්ත්වය නගා සිටුවන්නත් ඔවුන්ගෙ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්නත් ඔවුන්ගෙ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවන්නත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න]

වුවමනා කරන මුදල් සොයාගෙන අපේ විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම උදෙසායි එසේ කරන්නෙ.

කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) ජල ගැලීම් ගැන කථා කළා. සුළි සුළං ඇල්ලීම, ගංවතුර ගැලීම, හෙන වැදීම, භූමි කම්පා ආදී දේවල් ඕනෑම රටක සිදුවන ස්වභාවික උපද්‍රව. ඒ්ව ඇති වන සමහර අවස්ථාවලදී කෝච්චි මුහුදට යනව, නැව් ගොඩ දුව නව. කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමාගෙ කථාව ගැන මට කියන්න තිබෙන්නෙ මෙපමණයි. මෙතෙක් කලක් කොයි මිනි හ ආණ්ඩු කළත් ගංවතුර, ජල ගැලීම් වළක්වන්න වැඩ කළ කෙනෙක් කවුරු වත් නෑ. කැළණි ගඟ හැම අවුරුද්දෙම උතුරා යනව. එයින් විපතට පත්වන අය ට ආධාර දෙන්න අපේ අමාත්‍යාංශයෙන් ලක්ෂ කෝටි ගණන් සල්ලි යනව. විප තට පත්වන අයගෙ සෑම වුවමනාවක්ම අපි පිරිමහනව. අවුරුද්දක් පාසාම සිද් ධ වෙන්නෙ ඔකයි. මේ සම්බන්ධයෙන් ස්ථිර වැඩ පිළිවෙළක් පිළිබඳව සැලැස් මක්වත් තවම කවුරුවත් යොදා නෑ. මේ හදිස්සියෙන් ඒ සේරම කරන්න අපට කියනව. අවුරුදු 9 ක් තිස්සෙ මොකවත් නොකර පොල් ගහා ඉඳල එකපාරටම ජල ගැලීම වළක්වන්න අපට කියනව. අපේ මුදල් තත්ත්වය අනුව මේ ප්‍රශ්න සම්බන්ධයෙන් කිසියම් වැඩ පිළිවෙළක් යොදන්න අදහස් කර තිබෙ නව. ඒ්ව මේ අවස්ථාවෙදි විස්තර කරන් න ඕන නෑ. අපේ රටේ ජල ගැලීම් ආදී උපද්‍රව වළක්වන්න ක්‍රම යොදන්න සැලැස්මක් අපි සකස් කරගෙන යනව. ඒ්ව ක්‍රියාත්මක වන විට විරුද්ධ පක් ෂයෙ ගරු මන්ත්‍රීවරුන්ට පෙනෙයි කෙරෙන්නෙ මොනවද යන වග.

ඊළඟට, මාතර ප්‍රදේශයෙ අක්කර 4,000 ක පමණ ප්‍රදේශයක වතුර පිට කර ගන්න බැරිව තිබෙන නිසා පොම්ප දෙ කක් එහි යොදන්න ඕනෑ බවක් කිය වුණා. පොම්ප දෙකක් දැම්මොත් වැඩේ හරියන බව ඒ ගරු මන්ත්‍රීතුමාට පේන්නෙ ඇනුයි.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අද විතරක් නෙමෙයි, එදත් පෙනුණා. එදත් අපි කිව්ව.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

1956 සිට 1965 වනතුරු ආණ්ඩු කළා. පොම්ප දෙක මතක් වෙන්නෙ දැනුයි. ඔය කුඹුරු වපුරන්න බැරි බව ඔච්චර කල් පෙනුණේ නෑ. මේ අවුරුද්දකුත් මාස 5 ඇතුළත අපට කියනව පොම්ප දාන්න.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අපි එදත් සී. පී. ද සිල්වා ඇමතිතුමාට කිව්ව. එතුමනෙ වතුර බස්සන්නෙ—

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

සී. පී. ද සිල්වා ඇමතිතුමානම් හොඳට වතුර බස්සන්න පුළුවන් මිනිහෙක් තමයි.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

තමුන්නාන්සෙට බැරිද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

අපි කාටත් වගේ පුළුවන්, තමුන් නාන්සෙලට වැඩිය හොඳට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් වී තිබෙන මේ යෝජනාව සම් බන්ධයෙන් නොයෙක් විධියෙ චෝදනා විරුද්ධ පක්ෂය විසින් අපට එල්ල කරන්නෙ අපි මේ රටට ලොකු අපරාධ යක් කරන්න යන බවක් මහජනතාවට පෙන්වා දෙන්නයි. විදේශිකයන්ට ඉඩම් දෙනවය, කුඹුරු දියුණු කරන්නෙ නැත, වාරිමාර්ග දියුණු කරන්නෙ නැත, ජල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැල්ම නවත්වන්නෙ නැත ආදී නොයෙකුත් චෝදනා අපට විරුද්ධව ඉදිරිපත් කරනව. නමුත් මේවායේ සත්‍යය කවදා හෝ ජනතාවට අවබෝධ වෙනව. මෙතෙක් කල් මේ ප්‍රශ්න සම්බන්ධව සිත් යොමු නොකර ආත්මාර්ථකාමීව බල ලෝභයෙන් දූගලු දේශ ද්‍රෝහීන් මහ ජනතාව රැවටීමට අද දඟලනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප සැලැස්මක් අනුව යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනව. මේ කාල සීමාව ඇතුළත කර තිබෙන වැඩ මොන වද කියා මහජනතාව අවබෝධ කර ගන්නවා ඇති. පසුගිය ආණ්ඩුවලින් මහජනතාව මුළා කළා විනා ක්‍රමවත් සැලැස්මක් අනුව වැඩ නොකළ බව තමුන්නාන්සේ දන්නවා ඇති. කපු වගා කිරීම පිළිබඳව කිසිම දෙයක් කල්පනා නොකර කෝටි ගණන් මුදල් වියදම් කරමින් විශාල මෝල් විවෘත කළා. උක් වගාව පිළිබඳව කිසිවක් කල්පනා නොකර සීනි කර්මාන්ත ශාලා පිහිටුවීම නිසා අවුරුද්දකට රුපියල් අසූ ලක්ෂයක් පමණ පාඩු වෙනව. පසුගිය ආණ්ඩු මේ අන්දමේ බොරු වැඩ කරමින් මහජනතාව මුළා කරමින් රට ප්‍රපාතයට හෙළුවා විනා ක්‍රමවත් සැලැස්මක් අනුව රටේ සංවර්ධනයට වැඩ කළේ නැහැ. දැන් ඇයි මේ මේව කරන්නෙ නැත්තෙ කියා අපෙන් හදිසියෙන් ප්‍රශ්න කරනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ආණ්ඩුව භාර ගන්නා අවස්ථාවේදී මේ රටේ මුදල් තත්ත්වය කොයි තරම් පිරිහී තිබුණාද කියා තමුන්නාන්සේත් අප කවුරුත් හොඳාකාරව දන්නව. රටේ මුදල් තත්ත්වය අනුව, විදේශීය වත්කම් අනුව අප ජනතාවත් රැකගෙන, රටත් රැකගෙන සංවර්ධන කටයුතු සියල්ලක්ම කරන්ට ඕනැ. ඒ අදහස් මුල් කර ගත් සැලැස්මක් උඩයි අප වැඩ කරගෙන යන්නෙ. වැඩි කල් නොගොස්ම මේ රට ප්‍රපාතයට හෙළුවෙ කව්ද, මේ රටේ සංවර්ධනයට, දියුණුවට වැඩ කළේ කව්ද කියා මහජනතාව කරුණු අවබෝධ කර ගන්නා බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.53

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව වගකීමෙන් තොරව ඉදිරිපත් කර තිබෙන යෝජනාවක් හැටියට අපට පෙනෙන බව මා පළමුවෙන්ම සඳහන් කරන්නට සතුටුයි. මා එසේ කියන්නෙ මක්නිසාද ? ඡන්දයෙන් තෝරා පත් කළ මන්ත්‍රීවරයකු විසින් නොවෙයි, ආණ්ඩු පක්ෂයේ පසුපස සිටින පත් කළ මන්ත්‍රීවරයකු විසිනුයි මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ. එමනිසා මෙම යෝජනාව වගකීමෙන් තොරව ඉදිරිපත් කරන ලද යෝජනාවක් හැටියට අපට පෙනෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව මේ රට අධිරාජ්‍යවාදීන්ට පාවා දීමේ දරුණු දේශ ද්‍රෝහී ව්‍යාපාරයේ අරමුණක් බව මා පළමුවෙන්ම ප්‍රකාශ කරනවා. මා එය සාධක සහිතව ඔප්පු කරන්නම්. 1966 සිට 1970 දක්වා වූ කාල සීමාව සඳහා පිළියෙළ කර තිබෙන කෘෂිකර්ම සංවර්ධන යෝජනාවලිය නම් වාර්තාව කෙරෙහි මා පළමුවෙන් තමුන්නාන්සේගේ සිත යොමු කරවනව. ඒ වාර්තාවට ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ පෙර වදනකුත් එම්. ඩී. බණ්ඩා කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ පෙර වදනකුත් ඇතුළත් කර තිබෙනව. ඒ වාර්තාවෙ කවුරුත් වැඩිය නොබලන අන්තිම පිටුවට මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනව. සම්පූර්ණයෙන්ම මූලික පාවා දීම, රට වහල් කිරීමේ අරමුණු ඇතුළත් කර තිබෙන්නෙ ඒ පිටුවෙයි. මා ඒ කොටස දැන් කියවනව, 327 වන පිටුවෙන් :

"පෞද්ගලික (ගොවි නොවන) අංශයෙහි කෘෂි කාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ

රජයේ ඉඩම් පැවරීමේදී පළාත්බද ගම්මුන්ට හා ග්‍රාමීය ගොවිජනයා කෙරෙහි ප්‍රමුඛ සැලකිල්ලක් දැක්වීමේ මූලධර්මය අනුගමනය කරන අතරම,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

දේශීය ආහාර නිෂ්පාදනය සඳහා කෘෂිකාර්මික සංවර්ධනයෙහි ක්‍රමවත් සැලස්මක් හා මූලධනය ඇතිව ඉදිරිපත් වන පෞද්ගලික උදවියටද, වෙළඳ සමාගම්වලටද, උචිත බදු කොන්දෙසි යටතේ රජයේ ඉඩම් පවරා දීමේ හේතුවක් දැන් පවතින බවට, මෑතකදී (1965 අගෝස්තු) රජය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගන්නා ලදී.

පවරා දීම සඳහා විශේෂයෙන්ම දිවයිනෙහි වියළි කලාපය තුළ සැලකිය යුතු තරම් ඉඩම් ප්‍රමාණයක් තිබෙන බවත්, තනිකරම ගොවීන් සඳහා සැකැසුණු පවරා දීමේ වැඩ පිළිවෙළකින් එය ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක කරනු ලැබුවද, එබඳු ඉඩම් ඉදිරි වර්ෂ කීපය තුළදීවත්, වගා කිරීමට නුපුළුවන් බවත් යන කරුණුද මේ තීරණයට පදනම් වී ඇත."

මේ ප්‍රකාශයෙන් කර තිබෙන්නේ ජාතියට අපහාස වන අදහස් බව කනගාටුවෙන් කිව යුතුව තිබෙනවා. මේ ප්‍රකාශය කර තිබෙන්නේ ජාතියට අපහාස වන අන්දමේ අදහස් කීපයක් පිළිගැනීම නිසයි. ගොවි ජනතාවට මේ රටේ සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට නුපුළුවන් බවත් ඒ නිසා කොම්පැනිවලට ඉඩම් පවරා දිය යුතු බවත් මේ ප්‍රකාශයෙන් කියැවෙනවා. මට මේ වාසගම සම්පූර්ණයෙන්ම කියවන්නට දැන් වේලාවක් නැහැ. මෙහි අන්දමට ග්ලැන්විල් සහ කාසන්ස් කොම්පැනිවල නම් සඳහන් වී තිබෙනවා. මේ විදේශික කොම්පැනිවලට මේ රටේ ඉඩම් පවරා දීම ඉතාමත්ම ලොකු වරදක් බව අප කියා තිබෙනවා. තේ වතුවලට සහ රබර් වතුවලට ඉඩම් දුන්නා වගේ තමයි, මේ ඉඩම්ද දෙන්නට යන්නේ. විදේශිකයන් සතු ඉඩම් ජන සතු කරනවා වෙනුවට තව තවත් ඉඩම් ඔවුන්ට දෙන්නට යනවා. අපේ මුඩු ඉඩම් විදේශිකයන්ට පාවා දීමේ තීරණයක් තිබෙන බව මේ කෘෂිකර්ම සංවර්ධන යෝජනාවලියේ සඳහන් වී තිබෙනවා.

පත් කරන ලද මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය රත්නපාල) විසින් අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවෙහි සඳහන් වන්නේ කුමක්ද?

"මේ රට ආහාරවලින්, විශේෂයෙන් සහලින් ස්වයංපෝෂිත කිරීම පිණිස, එක්තරා අවදියකදී අපේ මුතුන්මිත්තන්ගේ කුඹුරු වශයෙන් පැවති, දැනට විශාල යායවල් වශයෙන් පවතින කැලෑ ඉඩම්වල, විශේෂයෙන් සහල් සහ හැකිනම් තිරිඟු හා වෙනත් අවශේෂ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සුදුසු කොන්දේසි යටතේ බාර ගැනීමට රජය සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙන ලෙස, විශාල වශයෙන් කරන කෘෂිකාර්මික කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති විදේශීය සමාගම්වලට රජය ආරාධනා කළ යුතු යයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සර්ව ජන ඡන්දයට වගකීමක් නැති මන්ත්‍රීවරයකු ලවා මේ පාවා දීමේ ද්‍රෝහී යෝජනාව ඉදිරිපත් කරවා තිබෙන බවයි අපට පෙනෙන්නෙ. මෙය වගකීමෙන් තොරව හා කරුණු නොදැන ඉදිරිපත් කරන ලද යෝජනාවක් නොවෙයි. අප ඒ බව හොඳින් අවබෝධ කර ගන්නට ඕනෑ. අධිරාජ්‍යවාදීන්ට මේ රට වහල් කර ගැනීමට හැකි වන අන්දමටත්, සමාජවාදී රටවල් සමඟ ඇති සම්බන්ධකම් සම්පූර්ණයෙන්ම නැති කරවමින් ආර්ථික නිදහස නැති කරවන අන්දමටත්, ලාංකික ධනවතුන් සුළු පිරිසකට ආර්ථික ලාභ ප්‍රයෝජන ලබා ගත හැකි වන අතර, මුළු ජනතාවම රදල ක්‍රමයේ තිබුණු තින්දගම්වලින් පීඩා ලැබූ ප්‍රමාණයටත් වඩා දරුණු ලෙස පීඩා විඳින අන්දමටත්, ඒ ජනතාවගේ අයිතිවාසිකම් නැති වන අන්දමටත්, කොටින්ම කියනවා නම් රටේ පොදු ජනතාව දුගී බවේ තබමින් ඔවුන් අධිරාජ්‍යවාදීන්ට පාවා දෙන අන්දමටත් මේ යෝජනාව සකස් කර තිබෙන බව මුලින්ම මතක් කරන්නට ඕනෑ. මේ ප්‍රකාශයේ තියෙන්නෙ කොහොමද?

"ග්‍රාමීය ගොවි ජනයා කෙරෙහි ප්‍රමුඛ සැලකිල්ලක් දැක්වීමේ මූල ධර්මය අනුගමනය කරන අතර......"

විදේශීය කොම්පැනිකාරයන්ට ඉඩම් දෙනවලු. ග්‍රාමීය ගොවි ජනතාව කෙරෙහි ප්‍රමුඛ සැලකිල්ලක් දක්වනවාය කියන මූල ධර්මය ගැන අපි කල්පනා කර බලන්න ඕනෑ. අද ලංකාවේ සම්පූර්ණයෙන් අස්වැද්දූ කුඹුරු තියෙන්නෙ අක්කර 13 ලක්ෂයයි. මේ අක්කර 13 ලක්ෂයෙන් ඕයයට 85ක් අක්කර දෙකට වඩා අඩු ගොවිපොළවල්. අක්කර 11 ලක්ෂයක පමණ ගොවිපොළවල් ඒවායේ වැඩ කරන ගොවි ජනතවගේ ජීවිකාව සඳහා ප්‍රමාණවත් නොවන ගොවි පොළවල්. සංඛ්‍යා ලේඛන අනුව—වාර්තා අනුව—ලංකාවේ ජනගහනයෙන් සියයට 10 ක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණ සිටින්නේ වී ගොවිතැනින් ජීවිකාව කර ගන්නා ජනතාවයි. ඒ අනුව වී ගොවිතැන් කරන උදවිය 11 ලක්ෂයක් පමණ ඉන්නවා. මේ 11 ලක්ෂයෙන් සියයට 85ක් පමණ දෙනා ජීවත් වීමට ප්‍රමාණවත් නැති අක්කර දෙකට වඩා අඩු ඉඩම් කැබලිවලයි වැඩ කරන්නෙ. ට්‍රැක්ටර් තිබෙන—යන්ත්‍ර සූත්‍ර තිබෙන—මේ යුගයේ එක ගොවි පවුලකට අක්කර 10 ක වැඩ කරන්න පුළුවන් බව අපට තර්කානුකූලව ඔප්පු කරන්න පුළුවනි. නමුත් අපි අක්කර 10 ගණන් ගන්නෙ නැතිව එක පවුලකට අක්කර 5 බැගින් ගණන් බලමු. එක ගොවි පවුලකට අක්කර 5 ක වැඩ පහසු වෙන් කරන්න පුළුවන්ය කියන පදනම උඩ කල්පනා කරන විට අද කුඹුරු වැඩ කරන ගොවීන් අතරෙන් ලක්ෂ 5කට ඉඩම් සාගතය, ඉඩම් පිපාසය තියෙනවා. දුප්පත්කම තිබෙන, පහත් ජීවන තත්ත්වයක් තිබෙන, ඉඩම් හාමතය තිබෙන ගොවීන් ඒ තරම් ප්‍රමාණයක් එක පැත්තකින් ඉන්නවා. අද ලංකාවේ තිබෙන තත්ත්වය ගැන බලන විට—රැකීරක්ෂා රහිත අය පිළිබඳ වාර්තා දෙස බලන විට—ඉඩම් ගොවිතැන් කිරීම සඳහා යොදවන්න පුළුවන් ලක්ෂ 10 ක පමණ ජනකායක් අද රක්ෂාවක් නැතිව—ජීවිකාව කර ගන්නට මාර්ගයක් නැතිව—සිටින බව පැහැදිලිව පෙනෙනවා. එවැනි තත්ත්වයක් තියෙන අවදියේ—අවශ්‍ය ඉඩම් ප්‍රමාණය නැතිව ගොවිතැන් කරන ලක්ෂ 5කටත්, ඉඩම් නැතිවම සිටින ලක්ෂ 10 කටත් ඉඩම් දිය යුතුව තිබෙන අවදියේ—කොහොමද මේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවන්නෙ? ග්‍රාමීය ගොවි ජනතාව කෙරෙහි ප්‍රමුඛ සැලකිල්ලක් දැක්වීමේ මූල ධර්මය අනුගමනය කරන අතර විදේශීය කොම්පැනිකාරයන්ට අක්කර දහස් ගණන් දෙන්නට යෝජනා කරල තියෙනවා. මේ රටේ ඉඩම් නැති ගොවි ජනතාවට සලකනවාය කියා වචනයෙන් ප්‍රකාශ කර, විදේශීය සහ දේශීය ධනවතුන්ට මේ රටේ අද තිබෙන අස්නොවැද්දූ ඉඩම් අක්කර ලක්ෂ ගණන පවා බෙදා දීමටයි, මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කර තිබෙන්නෙ. අධිරාජ්‍යවාදී යුගයේදී ඒ විදේශීය අධිරාජ්‍යවාදීන් විසින් උඩරට ගැමි ජනතාවගේ ඉඩම් තේ රබර් ආදිය වැවීම සඳහා කොල්ලකා ගන්නට යෙදුණු නිසා වහල් තත්ත්වයට—නොදියුණු තත්ත්වයට—ඒ ගැමි ජනතාව වැටී සිටිද්දී, ඒ තත්ත්වය නැති කිරීම සඳහා තෙල් කොම්පැනි ජනසතු කළා වගේ විදේශිකයන්ට අයිති ඉඩම් ජනසතු කරනවා වෙනුවට අද කරන්න යන්නෙ මොකක්ද? ඒ වෙනුවට අද කරන්න යන්නෙ ඉතුරු වී තිබෙන මුඩු බිම් ටිකත් විදේශ කොම්පැනිකාරයන්ටත්, දේශීය විශාල කොම්පැනිකාරයන්ටත්, ජාවාරම්කාරයන්ටත් අයිති කර දී කිසිම සීමාවක් නැතිව සූරා කෑමට අවස්ථාව සලසා දීමයි. මේ රටේ ආහාර ප්‍රශ්නය විසඳීම සඳහා ගෙන යන ඒ ධනපති ක්‍රියා මාර්ගය මේ රටේ මුළු ජනතාවම පාවා දීමේ වැඩපිළිවෙළක් බව මම කියන්න කැමතියි. සම්පූර්ණයෙන්ම මේ රට මංකොල්ල කෑමට ලොකු ධනවතුන්ට අවස්ථාව සලසා දීමේ වැඩ පිළිවෙළක්, සූරා කෑමේ වැඩ පිළිවෙළක්, අද සිදු වේගන යනවා.

මේ කාරණාව සම්බන්ධයෙන් මේ ආණ්ඩුව විසින් මොන ප්‍රතිපත්තිද යොදාගෙන තිබෙන්නෙ? මොන අවවාදද පිළිගෙන තිබෙන්නෙ? කියන එක යම් යම් වාර්තාවල ඇතුළත් වී තිබෙන කරුණු අනුව අපට පැහැදිලිව පෙනී යනවා. මේ වාර්තාවල පිට කවර නම් හොඳයි. නමුත් ඒවායේ ගැබ් වී තිබෙන්නේ නම් රට සම්පූර්ණයෙන් පාවා දෙන ඉතාමත් ප්‍රතිගාමී වූ, නිදහස් ජාතියක් ලජ්ජා විය යුතු, ශිෂ්ට ආණ්ඩුවක් ලජ්ජා විය යුතු දේවල් බව කනගාටුවෙන් කියන්න සිදු වී තිබෙනවා. ලෝක බැංකුව මගින් රට ගැන ප්‍රකාශ කරන මෙවැනි වාර්තා මේ විධියට බෙදා හැරීමට කැමති වීම ගැන ආණ්ඩුව ලජ්ජා වෙන්න ඕනෑ. මම සඳහන් කරන වාර්තාව The foreign Exchange problem of Ceylon යන නමින් යුත් වාර්තාවයි. මෙහි සිංහල අනුවාද පොත නැහැ. ඉංග්‍රීසි පොත පමණයි තිබෙන්නෙ. විදේශ විනිමය ප්‍රශ්නය ගැන ඒ වාර්තාවේ එක තැනක මෙසේ සඳහන් වී තිබෙනවා:

" ...... New arable land is entirely in the so-called dry zone where yields from investment are small and slow to materialize. The scope for industrial development is limited by the small size of the domestic market and handicapped by the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

lack of domestic industrial raw materials as well as the absence—so far—of a well-established group of industrial entrepreneurs."

කාර්මික අතින් අපේ ලංකාවට අනාගතයක් නැතිලු. ලෝක බැංකුව මුදල් ගෙනැවිත් වියදම් කර අපට අපහාස කරන්න මේ වාතීාව ලියා තිබෙනවා. ඊ ළඟට කෘෂිකර්මය සම්බන්ධව මෙසේ කියා තිබෙනව:

"There are several large river basins in Ceylon, which, if properly developed, would increase substantially the output of a large variety of food crops. Judging by preliminary studies, it would appear that development of these basins could offer higher returns on investment than the numerous small and medium-sized colonization schemes in the dry zone to which the Government directed most of its attention and resources in the past. However, at the moment it is far too early to say when and at what pace these basins can be developed. Extensive studies are still required and substantial amounts of investment resources will have to be found."

මේ රටේ වගා නොකළ ඉඩම් අයිති කර ගැනීමේ වැඩ පිළිවෙළක් යෙදීමෙන් දැන් විදේශ කොම්පැනිකාරයින්ට මේ රටේ කඩුල්ල අරින්න ලැහැස්ති වෙනව. ඒකට පෙරවදනක් තමයි මේ තිබෙන්නෙ. ඒ අතරම ආණ්ඩුවේ අදහසක් ගැනත් ප්‍රකාශ කර තිබෙනව:

"...... The Government is also considering the construction of an oil refinery, probably in co-operation with a foreign company, and establishing a fertilizer plant and a hardware factory."

පසු ගිය ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂෙප කරන ලද ඒ අදහස දැන් නැවත ඉදිරිපත් කර තිබෙනව. තෙල් පවිත්‍රාගාරය සම්පූර්ණයෙන්ම මේ රටේ ජනතාවගේ ව්‍යාපාරයක් හැටියට ගෙන යාම පිණිස නීති සම්පාදනය කිරීමට තීරණය කළාට පස්සෙ දැන් මේ වාර්තාවෙන් අදහසක් ඉදිරිපත් කර තිබෙනව, තෙල් පවිත්‍රාගාරය විදේශ කොම්පැනියක් සමග සම්බන්ධ වී කරන්න යනවාය කියා. එතකොට අපේ මුඩු බිම් පමණක් නොවෙයි වගා කළ හැකි ඉඩම් පවා විදේශිකයන්ට අයිති කරන්න යනව. මේ රට නැති කරන්න ඇති වෙච්ච ද්‍රෝහීන්, එසේ නැති නම් අධිරාජ්‍යවාදීන්ට වහල් වුණු ඇමති මණ්ඩලයක් ඇති මේ ආණ්ඩුව, මේ රටට සම්පූර්ණයෙන්ම අයත් වන විධියට සමාජවාදී රටවල ආධාරය ඇතුව පිහිටුවන්නට යෝජනා කළ තෙල් පවිත්‍රාගාරය අද විදේශික කොම්පැනි සමග හවුල් වී පිහිටුවන්න යෝජනා කරනව. මෙවැනි වැඩ පිළිවෙළක් යෝජනා කිරීමෙන් පැහැදිලි වන්නෙ මොකක්ද? තෙල් ගෙන්වීම, බෙදා හැරීම, ආදී රුපියල් කෝටි ගණනක් ලාභ උපදවන ජනසතු කරන ලද මෙම ව්‍යාපාරය නැවත වරක් විදේශික කොම්පැනි කාරයන් අතට පත් කිරීමේ පියවර ගැනීමක් බව මතක් කරන්න ඕනැ. ඒ අන්දමට වෙළඳාම සම්පූර්ණයෙන්ම ආපසු අධිරාජ්‍යවාදීන් අතට පත් කිරීම, තෙල් පවිත්‍රාගාරයෙන් බෙදා හරින තෙල් නැවත වරක් විදේශික කොම්පැනි කාරයින් අතට පත් කිරීම, අප නැවතත් වහල් තත්ත්වයකට පත් කර අපේ ජනතාව දුගී දුප්පත් කුලීකාරයන් හැටියට ජීවත්වන්නට සැලැස්වීමක් බව පෙන්නා දෙන අතරම, එයට මේ ආණ්ඩුව දැනටමත් වැඩ පිළිවෙළවල් සකස් කරගෙන යන බවත් මතක් කර දෙන්න කැමතියි.

මෙම වාර්තාවෙහි ඇති තවත් කොටසක් මම කියවන්නම්:

"There are however other large and costly projects such as a Steel Mill and a Tyre Factory whose economic justification is questionable."

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

What has all this to do with the Motion?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මා විශෙෂයෙන්ම මේ කාරණය ගැන මතක් කරන්නෙ, අමතර ආහාර ද්‍රව්‍ය වගා කිරීමේ අදහසින් විදේශික කොම්පැනිවලට අපේ ඉඩකඩම් බෙදා දීමට ඉදිරිපත් කර ඇති යෝජනාව එතරම් හොඳ ප්‍රතිඵල ලැබෙන යෝජනාවක් නොවන බව පෙන්වා දීමටයි. විදේශික කොම්පැනි පාලනය කරන ලෝක බැංකුව නිකුත් කර ඇති වාර්තාවෙන් කියන ප්‍රකාශයන් හා සසඳා බැලීම. මෙම කාරණයෙදි වැදගත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනව. මන්ද? මෙම වාර්තාවෙහි දක්වෙන අන්දමට, පළමුවන වරට, සමාජවාදී රටවල ආධාර ඇතුව පසුගිය ආණ්ඩුව විසින් අපේ රටේ පිහිටුවන ලද වානේ සහ ටයර් කර්මාන්තයන් මේ රටට ප්‍රයෝජනවත් නොවන කර්මාන්තයන් හැටියටයි පෙන්නා දී තිබෙන්නෙ. ඒ කර්මාන්තයන්ට අපහාස වන අන්දමටයි, ඒ කර්මාන්ත ආර්ථික වශයෙන් අපට විශ්වාස කරන්න බැරි ප්‍රයෝජනයක් නොලැබෙන ඒවා හැටියටයි, කෘෂිකර්ම ප්‍රතිපත්තිය පිළිබඳව විස්තර දක්වෙන එම වාර්තාවෙහි සඳහන් කර තිබෙන්නෙ. එම නිසා, මෙවැනි ක්‍රමවලින් බලාපොරොත්තු වන්නේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදී නව යටත් විජිත ක්‍රමය, එසේ නැතිනම් කලින් තිබුණු ඇමෙරිකානු යටත් විජිත ආර්ථික ක්‍රමය, නැවත වරක් ගෙන යාමට කරන නින්දනීය, ප්‍රතිගාමී, උපක්‍රමශීලී වැඩ පිළිවෙළක් බව පැහැදිලි වශයෙන් අවබෝධ කරවීම අපේ යුතුකමක් බව මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක් ඇමතිවරයකු ප්‍රකාශ කළා "අප ආහාර ද්‍රව්‍ය අතින් ස්වයංපෝෂිත වන්නෙ කොහොමද වගා නොකර තිබෙන අක්කර ලක්ෂ ගණනක බිම් ප්‍රදේශය වගා කරන්න විදේශීය ආධාර ලබාගන්නෙ නැතුව, කොම්පැනිවලට පවරන්නෙ නැතුව" කියා. නමුත් අධිරාජ්‍යවාදීන් කියන්නෙ මොකක්ද? කර්මාන්තවලින් ලංකාව වැනි දුප්පත් රටකට අනාගතයක් නැති බව නොවෙද ඔවුන් කියන්නෙ? අපට කර්මාන්ත කර ගෙන යන්න පළපුරුද්දක් නැති බවත්, විදේශිකයන් ඇවිත් පුහුණුවක් ලබා දුන්නත් ඒවායින් දියුණුවක් ඇති වෙන්නෙ නැති බවත් ඔවුන්ගෙ වාර්තාවලින් කියනව.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
අපි රුසියාවට භාර දෙමු.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)
වානේ කර්මාන්ත ශාලාව හැදීමට ආධාර දුන්නෙ රුසියාවයි. රුසියාව දැනට එම කර්මාන්ත ශාලාව සාදාගෙන යනවා පමණක් නොවෙයි, දැනට ටයර් කර්මාන්තය සහ වානේ කර්මාන්තය පිළිබඳව සිය ගණනක් දෙනා පුහුණුව ලබනව. මේ පසුගිය අවුරුදු සිය ගණන ඇතුළත ඔය අධිරාජ්‍යවාදීන් අපේ රටේ එක් පුද්ගලයකුට වත් කර්මාන්ත අතින් පුහුණුවක් ලබා දී තිබෙනවාද? එම නිසා, තමන්ගෙ ආත්ම ගරුත්වය නැති ඔය විධියෙ ප්‍රශ්න අසන්න පුළුවන් වෙන්නෙ අධිරාජ්‍යවාදීන්ගේ පය ලෙවකන්න ලැජ්ජා නැති අයට පමණයි. "රුසියාවට භාර දෙන්න" යයි නින්දනීය ප්‍රශ්න අසන්න පුළුවන් වෙන්නෙ ඔය වාගේ පුද්ගලයින්ට පමණයි. [බාධා කිරීමක්] ඇත්ත වශයෙන්ම මේ ගරු සභාවට පමණක් නොවෙයි, මුළු ජාතියටම නින්දා අපහාස වෙන්නෙ ඔය විධියෙ ප්‍රශ්න අසන පුද්ගලයන් නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූලික කර්මාන්ත දියුණුවක් මේ රටේ ඇති කිරීම සඳහා මේ තරම් ප්‍රසංශනීය උත්සාහයක් ගත් සෝවියට් රුසියාව සම්බන්ධයෙන් මෙවැනි නින්දිත දේ කියන කවරකු වුවත් වහල් තත්ත්වයට වැටුණු පුද්ගලයකු බව ඔප්පු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තමුන්නාන්සෙට මතක් කරන්නෙ මේ රටේ ආහාර නිෂ්පාදනය වැඩි කරන්න ඕනෑ බවයි. අපට ආහාර සම්බන්ධයෙන් ස්වයම්පෝෂිත වීම අවශ්‍යයි. අපේ රට අද ආර්ථික තත්ත්වයෙන් භයානක අඩියකයි තිබෙන්නෙ. මිට පෙර ඒ ගැන කථා කළ නිසා නැවතත් ඒ ගැන යමක් ප්‍රකාශ කිරීමට කාලය ගත කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් අප එක් කාරණයක් අවබෝධ කර ගත යුතුව තිබෙනව. අපට වාර්තා පිට වාර්තා ලැබී තිබෙනව. පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී පිටරට වලින් —සමාජවාදී රට වලින්—පැමිණ ඉදිරිපත් කළ වාර්තා තිබෙනව. අමතර ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ රටට ස්වයම්පෝෂිත වීමට පුළුවන්කම තිබෙන බව පිළිගත යුතුයි. මේ රටේ කපු වගා කරන්න පුළුවන් බවට විශේෂඥ වාර්තා ලැබී තිබෙනව. සෝවියට් විශේෂඥයන් විසින් කරන ලද පර්යේෂණ අනුව ලත් ප්‍රතිඵල මත සකස් කරන ලද වාර්තා තිබෙනව. එක්සත් ජාතික පක්ෂයේ පළමුවන ආණ්ඩුව තිබුණු කාලයේදී අධිරාජ්‍යවාදී රටවලින් පැමිණි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

විශේෂඥයන් වැරදි වාර්තා ඉදිරිපත් කිරීම නිසා මේ ආණ්ඩුවට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වී තිබෙනව. සීනි කර්මාන්ත ශාලාව පිහිටුවීම සම්බන්ධයෙන් දෙන ලද වාර්තාත් වැරදි නිසයි එය සම්පූර්ණයෙන් විනාශ වීමට හේතු වුණේ. 1956ට පෙර අධිරාජ්‍යවාදීන් කෙරෙහි විශ්වාසය තබාගෙන ගල්ඔය ප්‍රදේශයේ පර්යේෂණ පැවැත්වීමට සලස්වා වාර්තා ලබා ගත්තා. උක් වගා කළ යුත්තේ මේ ප්‍රමාණයටයි යනුවෙන් වාර්තා කර තිබුණා. අක්කරයකින් මේ තරම් උක් ටොන් ගණනක් ලබා ගන්න පුළුවන්ය, මේ තරම් උක් ප්‍රමාණයකින් මේ තරම් සීනි ලබා ගන්න පුළුවන්ය යනාදි වශයෙන් වාර්තා කර තිබුණා. එහෙත් ඒ වාර්තාව සම්පූර්ණයෙන් ම වැරදියි. අක්කර පන්දාහ වෙනුවට අක්කර දහදාහක් මදි වුණා. මූලික පර්යේෂණ වැරදි ලෙස කර තිබුණු නිසා සීනි කර්මාන්ත ශාලාවට අවශ්‍ය තරම් අමු ද්‍රව්‍ය ලබා ගන්න බැරි වුණා. ඔය හේතු නිසා ආර්ථික වශයෙන් මේ රට දුර්වල වුණා. අධිරාජ්‍යවාදීන් ආර්ථික වශයෙන් අප සම්පූර්ණයෙන් වහල් කර ගැනීමේ බලාපොරොත්තුවෙන් කඩා කප්පල්කාරි ව්‍යාපාර ගෙන ගිය නිසා අපට අද මේ තත්ත්වයට මුහුණ පාන්න සිදු වී තිබෙනව.

පසුගිය කාලය තුළ මේ රටේ තිබුණු ආණ්ඩුවලින් මේ රටේ ආහාර ප්‍රශ්නය විසඳුනේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන්වත්, සහාග ආණ්ඩුවෙන්වත්, බණ්ඩාරනායක අගමැතිතුමාගේ මූලිකත්වයෙන් පැවැති මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවෙන්වත් ඒ ප්‍රශ්නය විසඳුණේ නැහැ. ඔය ආණ්ඩු තුනටම විශාල සෙනසුරු දශාවක් ලබා තිබුණා, සී. පී. ද සිල්වා ඇමතිතුමා නොකඩවාම ඒ ආණ්ඩුවල සිටිමින් ගෙන ගිය ප්‍රතිගාමී ප්‍රතිපත්තිය නිසා. මාගම්පුර ප්‍රදේශයේ සාරවත් බිම් ප්‍රදේශයේ උඩ වලවේ ව්‍යාපාරය පටන් ගන්න ලෑස්ති වුණා. "මාජිනල් ලෑන්ඩ්ස්" කියන වචන පාවිච්චි කරමින් වගා කරන්න පුළුවන් ඉඩම් වගා කරනවාය කියමින් විශාල ධන පතියන්ට ඉඩම් දෙනවාය කියමින් වැඩ පිළිවලක් යොදා උඩ වලවේ ව්‍යාපාරයෙන් ප්‍රතිඵල ලැබෙන්නට පෙර විශාල ධන පතියන්ට ඉඩම් දෙන්න වැඩ පිළිවෙළක් යෙදුවා. එහෙත් ඒ ඉඩම් කච්චේරියන්ට ඉඩ ලැබුණේ නැහැ, අපි ඊට විරුද්ධව විශාල උද්ඝෝෂණයක් ඇති කර ඒක නවත්වා දැම්ම. අද ඔහු මේ ආණ්ඩුවට එකතු වෙලා මහජනයා රවටන්ට—දැන් "මාජිනල් ලෑන්ඩ්ස්" යයි කියන්නෙ නැහැ—ගොවීන්ට ඉඩම් බෙදා දීමේ මූලික ප්‍රතිපත්තියට අපි සම්පූර්ණ සහාය දෙන ගමන් විශාල කොම්පැණිකාරයින්ටත් අක්කර දහස් ගණන් බෙදා දෙන්ට යනවා කියා ප්‍රකාශ කරගෙන යනව. මේ විධියේ වචනවලින් මහජනයා නොමග යවා ඒ පාවාදීම කරන්ට පුළුවන් යයි මේ උදවිය බලාපොරොත්තු වෙනව. ඉඩම් නැති ගොවීන් ලක්ෂ 5 කටත් 10 කටත් අතර ප්‍රමාණයක් ඉඩම් සාගතයෙන්, ඉඩම් පිපාසයෙන් පෙළෙනව. මේ රටේ වගා කරන්ට පුළුවන් මුඩු බිම් හොඳටම වැඩි වුණොත් තිබෙන්නෙ අක්කර 20,00,000 යි. ඉඩම් නැති ගොවීන් 10,00,000 ක් පමණ සිටිනව. ගොවීන්ට ප්‍රමාණවත් පරිදි ඉඩම් බෙදා දෙනවා නම් මේ ධනපතීන්ට බෙදා දෙන්ට තවත් ඉඩම් කොහෙද තිබෙන්නෙ? මහජනයා නොමග යවන්ට නිතින් දිත අන්දමට නොයෙක් විධියේ බොරු ප්‍රකාශ කරනව. තිබෙන ඉඩම් ටික ඉඩම් නැති ගොවීන්ට බෙදා දෙන්ටවත් මදි. ඒ වගේම අවුරුද්දකට 2,50,000 කින් ජනගහනය වැඩි වෙනව. ලෝක බැංකුවේ වාර්තාව අපි පිළිගන්න වාර්තාවක් නොවෙයි; එයාලගෙ වාර්තාවක්. එහි කියනව, ලංකාවට කාර්මික වශයෙන් අනාගතයක් නැහැ කියා. ටයර් කර්මාන්තශාලාවත්, වානේ කර්මාන්තශාලාවත් මේ රටට අවශ්‍ය නැති ඒවලු. කිසිම ලජ්ජාවක්, භයක්, සැකයක් නැතිව අධිරාජ්‍යවාදීන්ට වහල් වීම නිසයි, මේ විධියේ වාර්තා කෙලින්ම සකස් කරන්නෙ. අගමැති වුණු හැටියෙම දණ ගහගෙන නිව් යෝර්ක් වලට ගිය නිසා නේද භය නැතුව මේ විධියට වාර්තා ලියන්නෙ? පාර්ලිමේන්තු ලේකම්වරයාත් අගමැතිවරයගෙ ආදශීය ගෙන, ලංකාවට පමණක් නොව ලෝකයේ යටත් විජිත රටවලට ආර්ථික වශයෙන් නිදහස් වීමට ආධාර කරන සමාජවාදී රටවලට නින්දා අපහාස වන විධියේ ප්‍රකාශයන් කරනව. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවේ ගැබ්ව ඇති ආහාර වගා කිරීමේ ප්‍රතිපත්තිය නිකම්ම පිටුපස ආසන යක සිටින ආණ්ඩුවෙන් පත් කළ මන්ත්‍රී වරයකුගේ වගකීමක් නැති අදහසක් යයි අපට පිළිගන්ට පුළුවන්කමක් නැහැ. දොම්පේ ගරු මන්ත්‍රීතුමාගේ (ෆීජ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) ප්‍රකාශය මා සම්පූර්ණයෙන් අනුමත කරනව. ලංකාවේ ඉඩම් අඟලක්වත් විදේශිකයන් සතු කළොත් වැඩි කල් යන්ට මත්තෙන්—නව අවුරුදු 3 1/2 ක් මේ උදවියට ඉන්ට ලැබෙන්නෙ නැහැ, ඉඩම් විදේශිකයන් සතු කරන්ට ගියොත්—මේ ආණ්ඩුව සම්පූර්ණ යෙන්ම අතුගා දමා ඒ ඉඩම් ජනසතු කිරීම ඒකාන්තයෙන් සිදු කරන බවට අප දිවුරා පොරොන්දු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් එක ප්‍රශ්නයක් මතු කරල මගේ කථාව අවසාන කරන්ට අදහස් කරනව. හැඩ ඔය යෝජනා ක්‍රමය ගැන සමාජ සේවා කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා මතක් කළා. හැඩඔය ව්‍යාපාරයටත්, මල්වතුඔය ව්‍යාපාරයටත් අද ඇති වී තිබෙන බාධාව මොකක්ද? මල්වතුඔය ව්‍යාපාරයේ හොඳ සැලැස්මක් තිබෙනව, ජලාශයක් ඇති කර අක්කර 50,000 ක පමණ ඉඩම් ප්‍රමාණයක් වගා කරන්න. ඒ ජලාශය ඇති වෙන්නේ උතුරු මැද පළාතෙයි. වතුර බෙදන්නෙ උතුරු පළා තෙයි. යෝජනා කර ඇති විධියට හැඩඔය ව්‍යාපාරයේ වතුර එක්කාසු වෙන්නෙ, ජලය ඇති වෙන්නෙ ඌව ප්‍රදේශයෙයි. ජලය බෙදා හරින්නෙ නැගෙනහිර ප්‍රදේශ යෙයි. මේ කාරණයට ඩඩ්ලි සේනානායක-චෙල්වනායගම් රහස් ගිවිසුම සම්බන්ධ කළාම ප්‍රශ්නය හොඳට පෙනෙනව. රහස් ගිවිසුමක් තිබෙන බව දැන් පිළිගෙන තිබෙනව. ගිවිසුමේ තිබෙන්නෙ, ලංකාව බෙදන්න නොවෙයිලු. කොයි එක් වුණත් කොන්දේසි මොනවාද කියා පැහැ දිලි කරන්න එපායැ? නමුත් මම දන්නව කොන්දේසි.

උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඉඩම් බෙදූ දෙනව නම්, රහස් ගිවිසුම අනුව පළමු වෙන් ඒ ඉඩම් දිය යුත්තෙ ඒ ප්‍රදේශයෙ ඉඩම් නැති අයටයි. ඒ කියන්නෙ, ඉඩම් නැති දෙමළ ජනතාවටයි. එය සාධාරණයි, යුක්තිසහගතයි. ඊළඟට දෙන්නෙ කාටද? ලංකාවෙ අනෙකුත් ප්‍රදේශවල ඉන්න ඉඩම් නැති දෙමළ ජනතාවටයි. ඇත් තෙන්ම ඊළඟට දිය යුත්තෙ ඒ කිට්ටුව ඉන්න, ඉඩම් නැති සිංහල ජනතාවටයි. නමුත් කොන්දේසියෙ හැටියට එහෙම කරන්න බෑ. ඉඩම් නැති දෙමළ ජනතාවට දුන්නට පස්සෙ ලංකාවෙ අනෙක් ප්‍රදේශ වල ඉන්න ඉඩම් තිබෙන දෙමළ ජනතා වට දෙන්න ඕනැ, කොන්දේසිය අනුව. මුළු ලංකාවෙම ඉන්න ඉඩම් ඇති සහ නැති දෙමළ ජනතාව හොයල ඒ අයට දුන්නට පස්සෙ, කාටත් එපාවුණු ඉඩම් තිබෙනව නම් ඒ ඉඩම් ලබා ගන්ට සිංහලයටත් අයිතියක් තිබෙන වලු. උතුරු මැද පළාතෙ සිංහලයන්ගේ ඉඩම් වතුරෙන් යට කරන්ට හැරල, එම වාරිමාර්ග ක්‍රම වලින් තම ඉඩම් අස්වද්ද ගැනීමට සුළු ජාතියකට පමණක් අයිති වාසිකම ලබා දෙන්ට සිංහලයන් ඉඩදෙයි කියා තමුන්නාන්සෙ කල්පනා කරනවද? රටේ සංවර්ධනය සම්පූර්ණයෙන්ම නැති වීමට හේතු වී තිබෙන්නෙ මේ රහස් ගිවිසුමයි. සිංහලයන්ට උතුරේ ඉඩම් ලබා ගැනීමට ඉඩ ලැබෙනව නම් දෙමළ ජනතා වට දකුණු පළාතේ ඉඩම් දෙන්ට අපි කැමතියි. ලංකාවෙ මහ ජාතියටත්, සුළු ජාතීන්ටත් සාධාරණත්වය ඉටු කෙරෙන ප්‍රතිපත්තියකට ඉඩ තිබෙන්ට ඕනැ. ලංකාවෙන් 1/3 ක් පමණ වන උතුරු නැගෙනහිර ඉඩම්, ජනගහනයෙන් සියයට 11 කට සීමා කර තිබෙනව, මේ රහස් ගිවිසුම අනුව. මේ රහස් ගිවිසුම බලලෝභී කම නිසා රට පාවා දීමට කළ එකක්. එම ගිවිසුම නිසා රට සංවර්ධනය කරන්ට බැරි තත්ත්වයකට පත්වී තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

නියෝජ්‍ය කථානායකතුමනි, විශාල ලෙස ආහාර වගා කිරීමට පුළුවන් ප්‍රදේශයක් වන මහවැලිගඟ නිම්නය කොම්පැණි කාරයන්ට දීම සඳහා යෝජනා කර තිබෙනව. මහවැලිගඟ යෝජනා ක්‍රමය පසුගිය ආණ්ඩුවෙන් පිළියෙල කළ ව්‍යාපාරයක්. අද රුපියල් කෝටියක් පමණ වියදම් කර එක්සත් ජාතීන්ගේ මණ්ඩලයෙ විශේෂඥයන් කණ්ඩායමක් ලවා මහවැලිගඟ නිම්නය පරීක්ෂා කරගෙන යනව. එම ප්‍රදේශය වගා කරන්ට පුළුවන් අක්කර දස ලක්ෂයක් පමණ වූ ප්‍රදේශයක්. එම පර්යේෂණවලට පමණක් රුපියල් 10 ලක්ෂයක් පමණ යනව. මේ වාර්තාවෙ තිබෙනව හුඟක් පර්යේෂණ කරන්ට ඕනැය කියා. අධිරාජ්‍යවාදින් මේ ආණ්ඩුවට කර තිබෙන බලපෑම කොපමණද කිව්වොත් මහජන මුදල් යොදවා මේ විදියෙ පර්යේෂණ කරනව. පිටරටින් විශේෂඥයන් ගෙනැවිත් මහජන මුදල් වියදම් කර පර්යේෂණ කරන්නෙ අධිරාජ්‍යවාදීන්ට ලාභ ලබාගන්ට, සූරාකන්ට, වාසි ලබා ගන්ට පුළුවන් ව්‍යාපාර තිබෙනවද කියා සොයා බැලීමටයි.

ලංකාවෙ විතරක් නොවෙයි, අද එංගලන්තයෙත් ආර්ථික අර්බුද ඇති වී තිබෙනව. පවුම බේරාගන්ට බැරි වී තිබෙනව. ආදායමට වඩා වියදම් වැඩියි. එංගලන්තයෙත් විදේශ විනිමය භයානක තත්ත්වයට වැටී තිබෙනව. එංගලන්තය වගේම අමෙරිකාවත් ආර්ථික අර්බුදයකට මුහුණපා තිබෙනව. එම විදේශීය රටවල් ආර්ථික අර්බුදවලින් බේරීම සඳහා අපේ රට කෘෂිකර්මයට පමණක් සීමා කරන්ට උත්සාහ කරනව. කර්මාන්ත දියුණු කිරීමෙන් සමාජවාදි රටවල් අපේ රට නාස්ති කරන්ට යන බවට නින්දිත ප්‍රකාශ කරමින්, මේ රටේ ආහාර වගාව දියුණු කරන්ට ඕනැ යන ප්‍රචාරයක් ගෙන යනව. අපිට වගා කරන්ට බැරි නිසා අපේ රටේ ඉඩම් විදේශිකයන්ට දෙන්ට ඕනැය කියා යෝජනා කරනව. අධිරාජ්‍යවාදීන් සූරා කෑ රටවල් ගණන දැන් අඩු වී තිබෙනව. අපේ රට නැවත වරක් වහල් තත්ත්වයට පත් කරන්ටයි වුවමනා වෙලා තියෙන්නෙ. කොන්ත්‍රාත් ක්‍රමයට හෝ වේවා වෙනත් ක්‍රමයකට හෝ වේවා විදේශීන්ට ලාභ ලබා ගන්ට පුළුවන් වන ක්‍රමයට කටයුතු කරන්ටයි වුවමනා වෙලා තියෙන්නෙ. අපේ පාලනය පිට කටයුතු කෙරෙන පිළිවෙලට අපට පුහුණුවක් ලබා දෙන්ට තරම් අප ගැන විශ්වාසයක් ඔවුන් තුළ නැහැ.

මේ ආණ්ඩුවට අපේ රටේ ජනතාව ගැන විශ්වාසයක් නැතුව තිබියදී විදේශීන්ට ඇති වෙච්ච විශ්වාසයක් ? කෘෂිකර්මය අපේ රට වැසියන්ට කරන්ට බැරිලු. නමුත් අවංකව පුහුණුවක් ලබා දෙනව නම් අනුන්ට ලාභ අයිති වෙන්නට ඉඩ නොතබා අපේ මිනිසුන් ලවාම අපේ රට දියුණු කරන්ට බැරිද? විශෙෂඥයන් පඩියට කැඳවාගෙන අපේ රටවැසියන්ට කෘෂිකර්මය පිළිබඳව පුහුණුවක් දෙන්ට බැරිද ? මේ ආණ්ඩුව පිළිගෙන තිබෙනව අප රටේ වැසියන්ට මේව කරන්ට බැරිය කියා. ධනපති රටවලින් අපට උපදෙස් දෙන්ට එන්නෙ නැහැ. ලාභය සූරා ගැනීමේ පරමාර්ථයෙන් මේවා ඒ අයටම අයිති කර දෙන්ටයි වුවමනා කරන්නෙ. රජය නියම සමාජවාදී ප්‍රතිපත්ති අනුගමනය කරනව නම් මෙවැනි යෝජනා ඉදිරිපත් වෙන්නෙ නැහැ. තාවකාලික වශයෙන් හෝ ඒ ව්‍යාපාර විදේශීන්ට පවරා නොදී ඒවායේ ලාභ පිටරට ඇදී යන්ට ඉඩ නොතබා විදේශ රටවලින් පඩියට විශෙෂඥයන් කැඳවා ගන්න පුළුවන්කම තිබෙන මෙවැනි යුගයකත් මේ ආකාරයේ යෝජනා ඉදිරිපත් කිරීම අධිරාජ්‍යවාදීන්ට රට පාවා දීමේ ව්‍යාපාරයක් බව මතක් කරමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

අ. භා. 6.32

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power.

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපති තැන්පත් ටී. ක්වින්ටින් ප්‍රනාන්දු මයා. මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் (திரு. ரி. குவின்ரன் பெர்ணண்டோ) அக்கிராசனத் தமர்ந்தார்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. T. QUENTIN FERNANDO] *took the Chair.*

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමු කොටම මන්ත්‍රීවරයෙකුගේ මෙම පෞද්ගලික යෝජනාව සම්බන්ධව පිළිතුරු දෙන්ට ප්‍රථමයෙන් එක්තරා කරුණක් ඉදිරිපත් කරන්ට කැමතියි. කුඩා තුඹසක් විශාල කන්දක් කොට පෙන්වීමෙ පරමාර්ථයෙන් මෙපමණ වේලාවක් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පුහු ඝෝෂාවක් කරන්ට යෙදුණ. මේ අප ඉදිරියෙ තිබෙන්නෙ මන්ත්‍රීවරයකුගෙ පෞද්ගලික යෝජනාවක්. මේ රජයේ කිසිම අදහසක් නැහැ, මෙවැනි දෙයක් කරන්ට. මේ රජයේ ප්‍රතිපත්තියක් නොවෙයි, විදේශ කොම්පැණිවලට හෝ සවදේශ කොම්පැණිවලට හෝ වී ගොවිතැන් කිරීම පිණිස මේ රටේ ඉඩම් භාර දීම.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

එහෙනම් යෝජනාවට විරුද්ධව කතා කරන්න.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

කැබිනට් ඇමතිවරයෙක් මීට පක්ෂව කතා කළා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

පක්ෂ වුණු පිළිවෙල කියල දෙන්නම්. වචන මාරු කර කතා කරන්ඩ එපා.



**එම්. තෙන්නකෝන් මයා. (නිකවැරටිය)**
*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*
(Mr. M. Tennakoon—Nikaweratiya)

කොම්පැණිවලට ඉඩම් දීල නැද්ද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මම තවම කතා කරන්ට පටන් ගත්ත විතරයි. [බාධා කිරීමක්] අද මෙතන එක පුදුමයක් වුණා. මේක මෑතක සිට ඇති වී තිබෙන වෙනසක්. එම වෙනස අනුව සම සමාජ පක්ෂයෙන් සහ කොමියුනිස්ට් පක්ෂයෙන් මම ප්‍රශ්නයක් අහන්ට කැමතියි. එදා එක්සත් ජාතික පක්ෂයෙ ඩී. එස්. සේනානායක මහතා ඉඩම් පනත ඇති කර උතුරු ප්‍රදේශය කැලෑ ප්‍රදේශවලට වෙනත් ප්‍රදේශවලින් ගොවීන් කැඳවා ගෙන ගොස් පදිංචි කරවමින් ගොවි ජනපද ව්‍යාපාර බිහි කරන විට මොකද තමුන්නාන්සෙල කීවෙ? මේ රටේ මුදල් වියදම් කරමින් මිනිසුන් මරා දමන්ට ගෙනියනවද කියල එදා ප්‍රශ්න කරපු සමසමාජ පක්ෂයෙ සහෝදරයො තමයි අද මෙතන මේ විධියට කෑ ගහන්නෙ. මේ අය මෙසේ කෑ ගහන්නෙ ගොවියාට තිබෙන ආදරය නිසාමද? උන්නැහෙලගෙ එම අදහස වෙනස් කළේ කවදාද කියා මම උන්නැහෙලගෙන් අහනව.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

ඒ කාලයේ හැන්සාඩ් කියවන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

අපට නිදහස ලැබුණාට පසුව එදා ඩී. එස්. සේනානායක අගමැතිතුමා මුඩුබිම් පනත මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේ සමසමාජ පක්ෂයේ හා කොමියුනිස්ට් පක්ෂයේ අය කිව්වේ මොකක්ද? මා හිතන්නෙ මේ සමහරක් අය එතකොට ඉපදිලාවත් නැහැ කියලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)

ඒ කාලයේ මම පාර්ලිමේන්තුවෙ හිටිය.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

එදා මුඩුබිම් පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී මේ අයගේ නායකයින් වන ආචාර්ය එන්. එම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා ආදී මහත්වරුන් කිව්වේ මොකක්ද? මේ රටේ වතුකරයේ සිටින සෑම ඉන්දියන්කාරයෙක්ම මේ රටේ පුරවැසියන් කළ යුතුයි කියා මේ අය එදා කියා හිටිය. එහෙම බෙරිහන් දුන් පුද්ගලයන් මේ සාරිපොටේ එල්ලුණාට පසුවද ඒ ප්‍රතිපත්තිය වෙනස් කළේ කියා මා අහන්න කැමතියි. අවුරුදු 35 ක් තිස්සේ පරණ "රෙකෝඩ්" එකම ගහමින්, බංකොලොත් වුණු පුස්කාපු කොමියුනිස්ට් ප්‍රතිපත්තිය අනුගමනය කරමින් මේ රටේ කටයුතු කරන්නට බැරි වූ තැන දැන් සාරිපොටේ එල්ලී ගෙන හෙට උදේ "ඇත්ත" පත්තරයේ පළවෙන්නට මහ ලොකුවට කෑ ගහල ඒ නායකයින් දෙන්නම පැනල ගිහින්. පිළිතුරු දෙන විට මෙතන නැහැ. මොවුන්ගේ ඒ ප්‍රතිපත්තිය වෙනස් කළේ කවදද කියා මා අහනව.

මේ රටේ මෑත ඉතිහාසයේ දුප්පත් ජනතාවට රජයේ ඉඩම් බෙදාදීම පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවයි. මේ රටේ මෑත ඉතිහාසයේ පළමු වැනි වරට රජයට අයිති ඉඩම් මහජනතාවට දී ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ රජයයි. එදා සිට අද වනතුරු එක්සත් ජාතික පක්ෂයවත් මේ රජයවත් ඒ ප්‍රතිපත්තිය අකුරකින්වත් වෙනස් කළේ නැහැ; මින් ඉදිරියටවත් වෙනස් කරන්නෙ නැහැ. අවුරුදු 10 ක් තිස්සේ මුන්නැහෙලා මේ පැත්තේ සිටගෙන මේ රට ප්‍රපාතයට දමා, රටේ මුදල් කාබාසිනියා කර, රට හිඟමනට පත් කර, අන්තිමේදී මේ රට කොමියුනිස්ට්වාදී රටවලට වහල් වන්නට තිබුණු අවස්ථාවේ මේ රටේ බුද්ධිමත් මහජනතාව විසින් යන්තම් බේරා ගත්ත. [බාධා කිරීමක්]

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will hon. Members please listen to me? I do not want any kind of interruption. If you interrupt, I will take the necessary steps without fear or favour.—[*Interruption*].

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

You cannot expect anything but a grunt from a pig.—[*Interruption*]. අපි මෙපමණ වේලාවක් මුන්නැහෙලාගේ බෙරිහන්දීම්වලට කන් දුන්න; දෙබිඩි ප්‍රතිපත්තිය ගැන අහගෙන හිටිය. දැන් ඉතින් අපේ ප්‍රතිපත්තියත් කියා දෙන්නම්. මේ රජයේ ප්‍රතිපත්ති මොනවාද කියලත් ටිකක් අහගෙන ඉන්න. හෙට "ඇත්ත" පත්තරයේ උන්නැහෙලා කී දේවල් පළ වෙන අතර සාධාරණ පත්තරවල අපි කියන දේවලුත් මහජනයාගේ දැන ගැනීමට පළ වේවි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1965 අවුරුද්දේ තත්ත්වය මේකයි: 1965 අවුරුද්දේ රුපියල් කෝටි 5 ක මිරිස් මේ රටට පිටරටින් ගෙන්වා තිබෙනව; අදත් ගෙන්වනව. රුපියල් කෝටි 3½ ක පමණ අර්තාපල් ගෙන්වනව. බොම්බයි ළූණු කෝටි 1½ ක පමණ ගෙන්වනව. මේ ආහාර ද්‍රව්‍ය තුන් වර්ගයම මේ රටේ නිපදවන්නට පුළුවන්. අපේ කාලයේ නොකළේ ඇයි කියන ප්‍රශ්නය සමහරවිට දැන් විරුද්ධ පාර්ශ්වය අපෙන් අහවි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා එක්සත් ජාතික පක්ෂය මේ රටට නිදහස ලබා ගත්තේ අවුරුදු 150 ක පමණ විදේශීය ආධිපත්‍යයකින් පසුවයි. එසේ නිදහස ලබා ගෙන මේ රටේ මූලික ආහාරය වන සහල්වලින් මේ රට සවයංපෝෂිත කිරීම පිණිස වැදගත් පියවරවල් රාශියක්ම 1956 වන තුරුම අර ගෙන තිබෙනව. එය විරුද්ධ පාර්ශ්වයත් අවිවාදයෙන් පිළිගන්නවා ඇත කියා මා හිතනව. එහෙත්, 1956 සිට 1965 දක්වා කාලය තුළදී කලින් ගෙන ගිය ඒ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අඩපන කළා. එදා එක්සත් ජාතික පක්ෂය ගෙන ගිය ඒ ව්‍යාපාරයට විරුද්ධව තමයි, සමසමාජ හා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

කොමියුනිස්ට් සහෝදරවරු ඩී. එස්. සේනානායක අගමැතිතුමාගෙන් ඇහුවෙ "මේ මිනිසුන් ගෙන ගොස් රුපියල් කෝටි ගණනක් වියදම් කර කැලෑවල පදිංචි කරවන්නේ ඒ අය මරා දමන්න වද" කියා. කෙසේ හෝ අද මේ රට සියයට 65 කින් පමණ සහල්වලින් ස්වයං පෝෂිතයි. එහෙත්, තවමත්, අපේ රටේ නිපදවා ගන්න පුළුවන්කම තිබෙන මෙකී අතිරේක ආහාර වර්ග තුන සඳහා කෝටි 10 ක පමණ ධනයක් පිටරට ඇදී යනව. අවුරුදු 10 ක් තිස්සෙ ඒ ධනය ඇදී ගියා, අදත් යනව. අපි මේ කරන ක්‍රියාව එක්සත් ජාතීන්ගෙ සම්මේලනය විසින් ලංකාවට තෑග්ගක් දිය යුතු එකක්. උදාහරණයක් වශයෙන් ගනිතොත් මෙය විස්තර කරන්න තියෙන්නෙ, පිටරටවල රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න අප විසින් දරන වෑයමක් හැටියටයි. මේ රටේම නිෂ්පාදනය කර ගන්න පුළුවන්කම තිබෙන අපේ අතිරේක ආහාර වර්ග තුනක් පිටරටවලින් ගෙන්වා ගැනීමට අවුරුදු පතා කෝටි 10 බැගින් වැය කිරීම ඇත්ත වශයෙන්ම ඒ විධියටයි හඳුන්වන්න තියෙන්නෙ. මේ ද්‍රව්‍ය ගෙන්වීම රුපියල්වලින් කරන්න බෑ. ඒ සඳහා රන් පවුම් හෝ ඩොලර් හෝ වුවමනා කරනව. ඒ විදේශ විනිමයත් අද අන්තිම තත්ත්වයට බැහැලයි තියෙන්නෙ. එම නිසා අපි දැන් කරන්නෙ, එදා ගෙනගිය පුළුල් සංවර්ධන ප්‍රතිපත්තිය අනුව, අවස්ථානුකූලව, මෙකී ආහාර වර්ග තුන මේ රටේම නිපදවා ගැනීමට නිසි පියවරක් ගැනීමයි. සුළු කාල සීමාවක් ඇතුළතදී අපේ අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමේ බලාපොරොත්තුව ඇතිව, මේ රටේ රුපියල් වියදම් කර සුළු වශයෙන් නොව, විශාල වශයෙන් ව්‍යාපාර ගෙන යන ව්‍යාපාරිකයන්ට, සමාගම්වලට, පුද්ගල කණ්ඩායම්වලට ඉඩම් අක්කර 34,000 ක් දුන්න වගා කිරීම සඳහා. අන්න ඒකයි, අප ගත් තාවකාලික පියවර. මේ අක්කර 34,000 දුන්නෙ ලංකාවෙ පළාත් 4 කින්. මේව දෙන්න කලින්, මෙය දිය යුත්තෙ කාටද, දෙන්න පුළුවන්ද බැරිද, දීමෙන් ලැබෙන ප්‍රතිඵල මොනවද යන කරුණු පිළිබඳව අමාත්‍යාංශයට වාර්තා කළේ අපි නොවෙයි. ඒ ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරුන් ගෙනුත් ඒජන්තවරුන්ගෙනුත් යුත් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු මගිනුයි ඒ කටයුත්ත කළේ. මේ මේ ප්‍රදේශවල අසුවල් ඉඩම් තාවකාලික බදු ක්‍රමය යටතෙ දෙන්න පුළුවන්යයි ඒ කමිටු මගින් නිර්දේශ කළාට පසු විශෙෂ බදු මණ්ඩල මගින් ඉල්ලුම් පත් කැඳවා සුදුසු සමාගම්වලට ඒ ඉඩම් දෙන්න තීරණය කළා. කාටද මේ ඉඩම් දුන්නෙ? හෙට "ඇත්ත" පත්තරේ ලොකුවට වැටෙන්න ඕනෑ නිසා, අද විරුද්ධ පාර්ශ්වයෙ මන්ත්‍රීවරු "ආණ්ඩුව මේ රටේ ඉඩම් අධිරාජ්‍යවාදීන්ට දුන්නය, අරුන්ට දුන්නය මුන්ට දුන්නය" කියමින් කෑ ගහනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඉඩම් බෙදා දෙනු ලැබූ කොම්පැනි අතර විදේශීය සමාගම් තිබෙන්නෙ, කාසන්ස්, විටෝල් බවුස්ටඩ් යන සමාගම් දෙක පමණයි. අනෙක් සියල්ලම ලාංකික කොම්පැනි. සියයට 90ක්ම ඒවයෙ ඉන්නෙ සිංහලයො. අර කී විදේශීය කොම්පැනි දෙකෙත් අද සියයට 50 කට වැඩියෙන් සිටින්නෙ සිංහල අධ්‍යක්ෂවරුයි. විරුද්ධ පාර්ශවය ප්‍රශ්න කරනව නම් තව සතියකින් මේ පිළිබඳව සියලුම විස්තර මම ඉදිරිපත් කරන්නම්.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ධනපතින්ටම තමයි දීල තියෙන්නෙ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කෑං කෑං ගාන්නෙ නැතුව ඉන්නව. කටේ මැස්සො රිංගයි. දඹදෙණියෙ ගරු මන්ත්‍රීතුමාගෙ (ආර්. ජී. සේනානායක මයා.) නෝනටත් අක්කර 500ක් දීල තියෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කජු වවන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කජ්ජුද බිජ්ජුද මම දන්නෙ නෑ. අධිරාජ්‍යවාදීන්ට දුන්නයි කිය කියා මෙතන බොරු බඩ බෙරිහන් දෙනව. දෙවියන්ගෙ නාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

යෙන්, මේ මවුබිමේ නාමයෙන් අප විසින් ගත් පියවර සාර්ථක පියවර වේගෙන එන නිසා මේ උදවියට දූන් ලොකු බයක් ඇති වී තිබෙනව. මා කලිනුත් කී පරිදි මේ කොම්පැනිවලින් 2 ක් හැර අනෙක් සියල්ලම ලාංකික සිංහල කොම්පැනි. රුපියල් වියදම් කර අක්කර දහස් ගණනක් එළි පෙහෙළි කර සුළු කාලයක් ඇතුළතදී අපට වුවමනා කරන නිෂ්පාදනයන් කරන්න පුළුවන් ශක්තියක් තියෙනවය යන විශ්වාසය ඇතිව මේ සමාගම්වලට ඉඩම් දුන්නෙ, රජයෙන් ආධාර දීල නොවෙයි. ඒ දුන් ස්ථානවල එකම වැවක්වත් නැහැ. ගම් පුලුල් කිරීමේ ව්‍යාපාරයක් යටතේ හෝ විශාල වාරිමාර්ග ක්‍රම යටතේ හෝ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන හෝ ඉදිරියට සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන හෝ එකම වැවක්වත් දුන්නෙ නැහැ. දුන්නෙ ගඟක් අයිනෙ තිබෙන බිම් කොටස් පමණයි. පුලුවන් නම් ගඟෙන් ජලය අරගෙන වගා කරපල්ලාය කියල මේ ඉඩම් දුන්න. මා මේ කරුණු විස්තර කරන්නෙ ඉඩම් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්වරයා නිසයි. මේ ඉඩම් වගා කිරීමට වැය වන මුදල් ගොවි මහතුන්ට දෙන්නෙ නැතිව ඒ ධනපතියන්ට දුන්නෙ මක්නිසාද කියාත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රශ්නයක් ඇසුවා. ඊට පිළිතුරක් වශයෙන් අප තඹ සල්ලි අලුක්කාලක්වත් ඔය ඉඩම් දුන් සමාගම්වලට දී නැති බව මා කියනවා. අඩුම කාලය අවුරුදු 15 යි. වැඩිම කාලය අවුරුදු 20 යි. ඒවාගේම තාවකාලික බදු ක්‍රමයකටයි මේ ඉඩම් දී තිබෙන්නෙ. අනෙක් කොන්දේසි මොනවාද? "subsidiary food crops" නැත්නම් අතිරේක ආහාර ද්‍රව්‍ය පමණයි මේ ඉඩම්වල වගා කරන්ට පුලුවන්. ස්ථිර බෝග වවන්න බැහැ. ඔන්න එක කොන්දේසියක්.

**සෝමවීර චන්ද්‍රසිරි මයා.** (කැස්බෑව)
*(திரு. சோமவீர சந்திரசிறி—கெஸ்பாவ)*
(Mr. Somaweera Chandrasiri—Kesbewa)

තණකොළ වවන්න පුලුවන්ද? [බාධා කිරීමක්]

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මහියංගනයෙ මට ඉඩම් තිබෙනව හාන්න. එනව.

විරුද්ධ පක්ෂයෙන් තවත් බොරු දර්ශනයක් ඉදිරිපත් කළා. ඒ ධනපති විදේශික සමාගම්වල ලොරිවලින් කොපමණ ලී ප්‍රමාණයක් කොළඹට ගෙනෙනවාද කියා ප්‍රශ්න කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක ලී අගලක් ගෙනෙන්නෙ නැහැ. මෙන්න ඒ පිළිබඳව අප අනුගමනය කරන ප්‍රතිපත්ති. ඔය දී තිබෙන අක්කර 34,000 හෙවට අඩි 5 කට වැඩි සෑම ගහක්ම කැලෑ දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් කරුවන්ගෙ මාර්ගයෙන් අරගෙන අවසානයි. අවුරුදු දහයක් තිස්සෙ ලී අර ගත්තා. ඒකට ඉංග්‍රීසියෙන් "extract" කියනව. ඒ අන්දමට දූව අරගත් දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටිවලදී දිසාපතිවරුන් විසින් නිර්දේශ කරන ලද ඉඩම් තමයි දී තිබෙන්නෙ. එතකොට අඩි 5 න් පහළ පොඩි කඳන් තිබෙන ගස් පමණයි මේ ඉඩම්වල තිබෙන්නෙ. ඒවත් කොහොමද දෙන්නෙ? ප්‍රමුඛත්වය දෙන්නෙ කැලෑ දෙපාර්තමේන්තුවටයි. කැලෑ දෙපාර්තමේන්තුවට ඒ ලී අවශ්‍ය නම් අන්න අප අසවල් ගස් කපා තිබෙනවාය කියා දන්වනව. මේ ගරු සභාවෙන් සම්මත කළ "Basic rate" නම් ගණන් තිබෙනව. ඒ කියන්නෙ අඩුම ගණන. ඒ ගණන ඒ අයට ගෙවනව. ගෙවා ඒ ලී අරගෙන රජයේ මෝල්වලින් ඉරවනව. නමුත් ඇතැම් අවස්ථාවලදී කැලෑ දෙපාර්තමේන්තුවට ඒ ලී අවශ්‍ය නැත කියනව නම් "Royalty" නැත්නම් අර රජයට දෙන්න තිබෙන ගණන අරගෙන කොන්ත්‍රාත්කරුට දෙනව. හොඳයි, එහෙම ලී දුන්නා නම් කොහාටද ඒ ලී ගෙනෙන්නෙ? ඒ ලී ඉන්දියාවට යවනවද? නැහැ. මේ කොළඹ වැනි ප්‍රදේශවලටයි ඒ ලී ගෙනෙන්නෙ. ඒ ලී ඉරා පෞද්ගලික කඩ සාප්පුවලටත් ගෙවල් දොරවල් සෑදීමටත් ගන්නව. එපමණක් නොවෙයි. ඒ වට අඩි 5 ට අඩු ගස් ප්‍රතිපත්තියක් වශයෙන් කැලෑ දෙපාර්තමේන්තුව ඉරන්නෙ නැහැ. ඒ ගස් ඉරන එක පාඩුයි. වට අඩි 5 ට වැඩි ලොකු ගස්වලින් ඉරුවම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙන්නෙත් ඉරන ලද ලී 55% ක් පමණයි. එතකොට වට අඩි 5 කට අඩු ගස් ඉරුවොත් පාවිච්චි කරන්ට පුලුවන් ඉරන ලද ලී ලැබෙන්නෙ 30% ක් පමණයි. එත කොට ඉරීමෙන් 30 ක් පමණක් ලැබෙන ලීයි අර පෞද්ගලික කොන්ත්‍රාත්කරුට දෙනව නම් දෙන්නෙ. ඔන්න ප්‍රතිපත්ති.

ඊළඟට ඔය ඉඩම් දීමේදී කිසිම ප්‍රදේශ යක කිසිම ගමක ගැමියකුට ඉඩම් අහිමි වීමක් වී නැහැ. ඒවාගේම කිසියම්ම ගැමි යකුට හෝ ගොවියකුට ලැබිය යුතු ඉඩම් නොලැබී නැහැ. ඒ ප්‍රදේශවල ජනතාව විසින් යම් අවස්ථාවක ඉඩම් ඉල්ලුවාද, ඉල්ලා තිබෙනවාද, පළාතේ මන්ත්‍රීවරයා විසින් ඉඩම් කච්චේරියක් පැවැත්විය යුතුය කියා නිර්දේශයක් කර තිබෙනවාද ඒ සෑම අවස්ථාවකදීම, සෑම ස්ථානයක දීම ප්‍රදේශයේ ඉපදී, ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා වුවමනා වන් පිරිමැසීමෙන් පසු වැඩි හරිය තමයි දී තිබෙන්නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennekoon)
ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
නැහැ. එහි කිසිම අසත්‍යභාවයක් නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennekoon)
ඔප්පු කරන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
මම දන්නව. ඔය ඊයෙ ඇසූ ප්‍රශ්නය ගැනයි කියන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අක්කර 34,000 ක් බෙදන විට සමහර විට ගැමියන් දහ දොළොස් දෙනෙකු වාසය කළ ස්ථාන යක් අසු වෙන්න ඇති. නමුත් එවැනි අවස්ථාවක් ගැන අපට දැනුම් දුන් වහාම දිසාපතිවරයාට අප කියා යැව්ව, කරුණා කර අසවල් ගමේ අසවල් අයට අයිති ඉඩම් මේකට අසු වෙනව නම් ඒ ඉඩම් වෙන් කරන්නය කියා. ඔන්න ගරු මන්ත්‍රී තුමනි, අපේ ප්‍රතිපත්ති.

අපට කිසියම් කාරණයක් ඉදිරිපත් කළ විට අප ඒ ගැන වහාම ක්‍රියා කරනවා. නික වැරටියේ ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් ඇති බව මා දන්නවා. නමුත් මට නම් රපෝර්තුවක් ඇවිත් නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennekoon)
බීරි අලියාට වීනා ගායනා කරනවා වගෙයි, කොච්චර කිව්වත්.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කොම්පැනිවලට ඉඩම් දීම නොපිට පෙරළා පෙන්වන්නට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් උත්සාහ කළා. ගංගා වලින් මුහුදට ගලාගෙන යන වතුර ටික රඳවාගෙන අපේ රටට අවශ්‍ය මිරිස්, ලූනු, අල ආදිය වගා කිරීමට ක්‍රියා කිරීම වර දක්ද? අවුරුද්දක් දෙකක් ඇතුළත මේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙහිම වගා කරවා ගන්නට අපට පුළුවන් වුණොත් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපට ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
රත්තරන් මොළ !

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඔව්, මේ මොල පුස් කාපුවා නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ යහ පත සඳහා මේ ආණ්ඩුව ගෙන යන ප්‍රති පත්තිය නොපිට පෙරළා පෙන්වන්නට විරුද්ධ පාර්ශ්වයෙ ගරු මන්ත්‍රීවරුන් උත්සාහ කරනවා. ඒ අය කියන අන්දමට විදේශීය කොම්පැනිවලට අපේ රටේ ඉඩම් ටික බෙදා දීලා නැහැ. ස්ටර්ලිං කොම්පැනි දෙකකට ඉඩම් ප්‍රමාණයක් දීලා තිබෙනවා පමණයි. ඒවායේත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අයගෙන් සියයට පණහක්ම ලාංකික යන් බව මතක් කරන්නට කැමතියි. මේ අය හැරෙන විට මධ්‍යම පන්තියේ ඉල්ලුම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

කරුවන්ට අක්කර සියය, දෙසිය බැගින් ඉඩම් ඉල්ලා තිබෙනවා. කණ්ඩායම් සෑදී හෝ ඒ විධියට ඉඩම් ඉල්ලුම් කරන්නට පුළුවන්කමක් තිබෙනවා. ඒ වැඩ කරගෙන යන්නට පුළුවන් බව පෙනෙන කාට වුණත් ඉඩම් දීම අපේ ප්‍රතිපත්තියයි. වැඩ කරගෙන යන්නට පුළුවන්කමක් ඇතිව ඉඩම් ඉල්ලූ අයට ඉඩම් දීම අප ප්‍රතික්ෂේප කෙළේ නැහැ. හැබැයි ඉඩම් ඉල්ලූ තරමින් ඒ සියලු දෙනාටම ඉඩම් දෙන්නට අප ලෑස්ති වුණේ නැහැ. අප මේ කරන්නේ අත්හදා බැලීමක්.

ස්වදේශීය කොම්පැනි ලවා හෝ විදේශීය කොම්පැනි ලවා හෝ වී ගොවිතැන් කරවන්නට මේ ආණ්ඩුව ක්‍රියා කෙළේ නැහැ. ඊට හේතුවක් තියෙනවා. වී බුසලකට රුපියල් දොළහ බැගින් දී මේ රටේ ගොවියා දිරිමත් කෙළේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවයි. ලෝක වෙළඳ පොළේ රුපියල් හයක් නැත්නම් හතක් මිළ වන වී බුසලකට රුපියල් දොළහක් ගෙවන්නට එදා ක්‍රියා කෙළේ අපේ ගොවියාට දිරි දීමක් වශයෙනුයි. නමුත් ඒ දුප්පත් ගොවියන්ට වී බුසලකට රුපියල් දොළහක් දුන්නත් ස්වදේශීය හෝ විදේශීය කොම්පැනියට ඒ තරම් වූ මුදලක් ගෙවමින් වී මිලදී ගන්නට රජය කැමති වෙනවාද? කිසි සේත්ම කැමති වන්නේ නැහැ. වී නිෂ්පාදනය සඳහා ගොවීන්ට විශාල ධෛර්යයක් දී තිබෙනවා. වාරිමාර්ග ක්‍රම සලසා තිබෙනවා. තරමක් දුර්වල වූ වාරිමාර්ග ක්‍රමයක් ඇතත් ඇත්ත වශයෙන්ම පසුගිය දස වසට වඩා ශීඝ්‍රයෙන් අද වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඉදිරියට යන බව කියන්නට පුළුවනි. පසුගිය වර්ෂයේදී බලාපොරොත්තු වුණාට වඩා සියයට 15 ක් වැඩි වූ ප්‍රමාණයකින් ගොවීන්ට වතුර සපයන්නට පුළුවන් වුණා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඒ සියලුම වැඩ නොපිට පෙරළන්නට උත්සාහ කරනවා.

සමාජවාදී රටවලින් යන්ත්‍ර සූත්‍ර ගෙන්වා ගෙන වැඩ කරගෙන නොයන්නේ මන්දැයි ඒ මන්ත්‍රීවරුන් ප්‍රශ්න කරනවා. මෙහිදී එක කාරණයක් මතක් කළ යුතුයි. 1954 වර්ෂයට පසුව ගෙන්වා තිබෙන්නේ ට්‍රැක්ටර් 4 ක් පමණයි. මේ රටේ ජනගහණය වැඩි වීමේ වේගය අනුව කෘෂිකර්ම සංවර්ධනය ඇති කරන්නට ඕනෑ. නමුත් පසුගිය කාලය තුළ ගෙන්වා ඇත්තේ ට්‍රැක්ටර් යන්ත්‍ර හතරයි. ඒ යන්ත්‍ර හතර යොදා ඔය සංවර්ධනය කරන්නට පුළුවන්ද? විරුද්ධ පාර්ශ්වයේ උදවිය පසුගිය කාලයේදී රට සංවර්ධනය කෙළේ ඔහොමද? සමාජ සේවා ඇමතිතුමා නම් විරුඬ පාර්ශ්වයට හොඳ පිළිතුරක් දුන්නා. "උඹලා රට කෑවා. අපි හදා ගන්න ඕනෑ" යි එතුමා ප්‍රකාශ කළා. [බාධා කිරීමක්] දැනට සිටින ඉඩම් ඇමතිතුමා පසුගිය ආණ්ඩුවේත් එම ඇමති ධුරයම දැරූ බව ඇත්තයි. එතුමා වැඩ කරගෙන ගියේ කැබිනට් මණ්ඩලයක් සමග පොදු වගකීමකින් බැඳී නොවේද? එසේ නම් ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තේ එදා සිටි මුළු කැබිනට් මණ්ඩලයම නේද? [බාධා කිරීමක්] අනික් අය බූරුවන් වන්නට ඇති. සෙවල ප්‍රතිපත්තියක් තිබෙන්නට ඇති. ඇයි එක ඇමතිවරයකුට පමණක් දොස් කියන්නේ?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විවාදයේදී මගේ සහෝදර සමාජ සේවා ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා උන්නැහෙගෙ අදහස ප්‍රකාශ කළා. ඒ ගැන මම සන්තෝෂ වෙනව. කොහෙන් හෝ එතුමාට වැරදි අදහස් ටිකක් ලැබී තිබෙන බව මම කියන්න කැමතියි. මා හිතන විධියට විශේෂ බදු ක්‍රමය යටතේ ඒ සමාගම්වලින් ඔය කියන විධියට පිටරටින් ට්‍රැක්ටර් ගෙන්වා නැහැ. අක්කර තුන් හාර දහකට එක ට්‍රැක්ටර් යන්ත්‍රයක් ඇති. මගේ මයියංගන ආසනයේ අක්කර 9,000 ක් දී තිබෙන නිසා මම ඒ ගැන පෞද්ගලිකව දන්නව. අක්කර 4,000 කට නැත්නම් 5,000 කට එක යන්ත්‍රයක් ගෙන්වා ඇති. ඒවා නැතිව වැඩ කරන්න බැහැ. ශීඝ්‍රයෙන් ජනගහනය වැඩි වන විට, ඉක්මණින් ඉටු කළ යුතු අවශ්‍යතාවක් රටේ තියෙන විට, තියෙන යන්ත්‍රවලින් සංවර්ධනය කරන්න බැරි නිසා—සංවර්ධනය කරන්න යන්ත්‍ර නැති නිසා—පිටරටින් යන්ත්‍රෝපකරණ ගෙන්වා ගන්න සිදු වෙනව. ඒවා රුපියල්වලින් ගෙන්වා ගන්න බැහැ. ඒවා ගෙන්වා ගැනීමට විදේශ විනිමය වුවමනා කරනව. විදේශ විනිමයත් අපට නැහැ. තිබෙන විදේශ විනිමය ප්‍රමාණයවත් ආරක්ෂා කර ගන්නයි, මේ රටේ නිපද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්න පුළුවන් අතිරේක ආහාර මේ රටේ නිපදවන්න අපි ඉතාම අවංක පරිශ්‍රමයක් දරන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර ඇමතිතුමා දන් මේ ස්ථානයේ නැහැ. නමුත් මට එක කාරණාවක් කියන්න පුළුවන්. 1965 දී මේ මුළු ලංකාවෙම අර්තාපල් වවා තිබුනේ අක්කර හාරසිය ගණනක පමණයි. නමුත් මම දන් ආඩම්බරයෙන් කියනව, මේ අවස්ථාව වන විට අර්තාපල් වවා තිබෙන අක්කර ප්‍රමාණය 2,500 ට වඩා වැඩි වී තිබෙන බව. අපේ රට අර්තාපල්වලින් ස්වයංපෝෂිත කිරීම සඳහා අක්කර 8,000 ක පමණ අර්තාපල් වවන්න ඕනෑ. මේ අදහස සාර්ථක වේය කියා තරහයි ; බයයි.

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிரி)*
(Mr. Somaweera Chandrasiri)
කඩවල අර්තාපල් නැත්තෙ ඇයි ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
කඩවල අර්තාපල් නැත්තෙ තමුන්නාන්සෙල විදේශ විනිමය කාපු නිසා. ඒකයි හේතුව. පොතේ ගුරත් ඇවිත් ඉතිරි ටිකත් කාලා රා පමණක් ඉදිරිපත් කළා. ඔකයි, සිදු වුනේ. විදේශ විනිමය නැතිව රුපියල්වලින් අල ගෙන්වන්න බැහැ.

ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්ව, පෞද්ගලික කොම්පැනියක් මාර්ගයෙන් ගල්ඔයේ අත්හදා බැලුවාය කියා. මේ රජයේ ප්‍රතිපත්තියක් නැහැ ; අදහසක් නැහැ ; බලාපොරොත්තුවක් නැහැ, විදේශීය හෝ දේශීය හෝ කොම්පැනි මාර්ගයෙන් හෝ වේවා, සමාගම් මාර්ගයෙන් හෝ වේවා, මේ රටේ වී නිපදවීමට. හැබැයි, සංවර්ධන වැඩ කොන්ත්‍රාත් මාර්ගයෙන්, කොම්පැනි මාර්ගයෙන් කෙරෙනව. පත්කළ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඒ ගැනද කියන්න මම දන්නෙ නැහැ.

අද එක එක කොම්පැනි අපේ ඉලෙක්ට්‍රික් අංශයේ කොන්ත්‍රාත් අරගෙන තියෙනව ; වාරිමාර්ග අංශයෙ කොන්ත්‍රාත් අරගෙන තියෙනව ; විශාල වැව් කොන්ත්‍රාත් අරගෙන තියෙනව, වැඩ කරන්න. එදත් ඒ විධියට කොන්ත්‍රාත් දුන්න. ගල්ඔය මණ්ඩලයේ කොන්ත්‍රාත්තුව එදා ගත්තෙ මොරිසන් නඩ්සන් කොම්පැනියයි. මේ අවස්ථාවෙත් අපි ටෙන්ඩර් කැඳවා තිබෙනව, අපේ විදුලි බල මාර්ගය ගෙන යාමට. මේ ගැන වැඩ කරන්න අපි ලෝකයෙන්ම ටෙන්ඩර් කැඳවා තිබෙනවා. මා හිතන පිළිවෙළට කොම්පැනි කීපයක් ටෙන්ඩර් ඉදිරිපත් කර තිබෙනව. ඒ ප්‍රතිපත්තිය එදත් තිබුන ; අදත් තියෙනව.

පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) එතුමගෙ කථාවෙදි කිව්ව මේ රටේ ගොවීන් හෝ කවුරුන් හෝ වී නිපදෙව්වට උන්නැහෙගෙ විරුද්ධත්වයක් නැත, ලෝක වෙළඳ පොළේ අතිරේක ආහාර ද්‍රව්‍යවල මිළ දිනෙන් දින බැහැගෙන යනවය, මිළ වැඩි වේගන යන ආහාර ද්‍රව්‍ය නිපදවනව වෙනුවට එසේ මිළ බැහැගෙන යන අතිරේක ආහාර ද්‍රව්‍ය නිපදවීමෙන් ප්‍රයෝජනයක් නැත, කියා. දිනෙන් දින මිළ බැහැගෙන යන අතිරේක ආහාර ද්‍රව්‍යයයි කිව්වෙ මිරිස්, අර්තාපල්, ලූනු ආදියයි. දිනෙන් දින මිළ නැග්ගත් බැස්සත්, ඒවා අපේ විදේශ විනිමය පාවිච්චි කර ගෙන්වන්නට තියෙන ඒවා.

අනික් කාරණාව, ගරු සභාපතිතුමනි, අපේ රටේ ජනගහණයෙන් සියයට 85ක්ම සිටින්නෙ ගොවි ජනතාවයි. ගොවිතැන, ඉපැයීම් මාධ්‍යය කරගෙන ඒවා විකුණා ගන්න මුදලින් ඕනෑ කර්මාන්ත අංශයෙන් නිපදවන දේවල් ගන්න. එතකොට සියයට 85 ක් ගොවියන් සිටින ලංකාවෙ, තේ, පොල්, රබර්, මිරිස් රට ලූණු ආදිය නිපදෙව්වෙ නැත්නම් කර්මාන්ත අංශයෙන් නිපදවන බැටරි, බයිසිකල්, පෑන්, පැන්සල්, රේඩියෝ යන්ත්‍ර, ඔර්ලෝසු ආදිය ගැනීමට ඒ සියයට 85 ක් සිටින ජනතාවට මුදල් කොහෙන්ද ලැබෙන්නෙ ? පොතේ ගුරාලගෙ අර්ථශාස්ත්‍රය අනුව මුන්නැහෙල කියනව දවසින් දවස ලෝක වෙළඳපොළේ ගණන් බහින දේවල් නිපදවන්න එපාය කියා. හොඳ නේද පොතේ ගුරාලග පාඩම ? ඔක තමුන්නාන්සේලාම තියාගෙන තමුන්ගෙ මට්ටම් තම්මට්ටම් කියා ගහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

ගන්න එකයි තිබෙන්නෙ. අපි අපේ ආර්ථික ප්‍රතිපත්තිය ගෙන යන්නම්. තව අවුරුදු කීපෙකින් ඒවායෙ ප්‍රතිඵල ලැබේවි.

මේ කාරණය ප්‍රකාශ කෙළේ පානදුරේ ගරු මන්ත්‍රීතුමායි (ලෙස්ලි ගුණවර්ධන මයා.) කාර්මික නිෂ්පාදන දියුණු කර මොන යකාට දෙන්නද ඒව ගන්න ගොවීන්ට සල්ලි නැත්නම්? සියයට 85ක් සිටින ඒ ගොවි ජනතාව තමන්ගේ ගොවි නිෂ්පාදන විකුණා ගත්තොත් තමයි ඔවුන්ට මුදල් ලැබෙන්නෙ. ඔන්න ඒ ගොල්ලන්ගෙ අළුත් ශාස්ත්‍රය. සමාජවාදී රටවල්, අධිරාජ්‍යවාදය, සූරා කෑමේ ප්‍රතිපත්තිය, ආදිය කියමින් බෙරිහන් දිදී කෑ ගහනවා. කවද්ද මේ ගොල්ල මේ සමාජවාදය වෙනස් කෙළේ? මේ අවස්ථාවෙදී මම එක කරුණක් ඉදිරිපත් කරන්නම්, 1948 හැන්සාඩ් වාර්තාවකින්. එදා ඩී. එස්. සේනානායක අගමැතිතුමා මුඩුබිම් පනත මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී ඔය දෙබිඩි ප්‍රතිපත්ති කාරයන්ගෙ—කොල්වින් ආර්. ද සිල්වා මහතාගෙ—පිළිතුරත් සමග තිබෙන කථාව මම දැන් ඉදිරිපත් කරන්නම්. අද ජාතික ප්‍රශ්න ගැන කෑ ගහනව. උන්නැහෙල තුළ සිංහලට ලැදි කමක් ඇති වී තිබෙන්නෙ අදයි. මෙන්න ඩී. එස්. සේනානායක අගමැතිතුමා මුඩු බිම් පනත ඉදිරිපත් කළ අවස්ථාවේදි කී කථාවෙන් කොටසක්.

"In our attempts to find a solution from 1941 onwards, and even before, we tried our best to maintain that close friendship."

That is, with India.

"We may be a small country, but however small we may be, we have a right to our country. At the same time, I would like to say that, however big India may be, whatever the population of India may be, however possible it may be for India by peaceful penetration to distribute her population all over the world and try to maintain them as citizens of that country too, it is not an attitude that should be adopted by a country from which we expect very much more in the future."—[OFFICIAL REPORT, 9th December 1948; Vol. 5, c. 427.]

ඒ කියන්නෙ මොකක්ද? ඉන්දියාව කොපමණ ලොකු වුණත්, විශාල ජාතියක් වුණත්, අපි ඉන්දියාවෙ ජනතාව මේ රටට හෝ වෙන රටකට හෝ ගෙන්වා ඒ ජනතාව ස්ථිර පුරවැසියන් හැටියට පදිංචි කරවීමේ ව්‍යාපාරයට අපි විරුද්ධය කියන එකයි.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தர)*
(Mr. Wijesundara)
මොකක්ද වැරද්ද?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
මෙන්න පිළිතුර.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
මොකක්ද හරි?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
කවුද එහෙම කියන්නෙ?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ඒ කොටස ඩී. එස්. සේනානායක අගමැතිතුමා කළ කථාවෙන් කොටසක්.

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிரி)*
(Mr. Somaweera Chandrasiri)
ඉතින් එයාගෙ පුතාට බැරිද ඕක කියන්න?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)
ටිකක් ඇහුම්කන් දෙන්න.

"We agree with every thinking person in Ceylon that unless we can assimilate every single element in our social structure into our policy and our society, our society will be doomed; ......"—[OFFICIAL REPORT, 9th December, 1948; Vol. 5, c. 450.]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

ඔක රෙද්ද ගලවල කියන්න ඕනෑ.—[*Interruption*].

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

There is something wrong somewhere.

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

There is nothing wrong.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මම දන්නව තමුසෙ වාගෙ තුච්චු දෙකේ කාඩයෙකුට රෙද්ද ගලවන්න පුළුවන් බව. මම උඹෙ රෙද්ද ගලවා—[බාධාකිරීම්] අනේ පලයන් බූරුව.

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

උඹ මිනිහො බූරුව [බාධාකිරීම්]

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Order, please!

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

ඩී. එස්. සේනානායක අගමැතිතුමාගෙ ප්‍රකාශය තවත් වරක් කියවන්න.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

ඔන්න එක සැරයක් කියෙව්ව. [බාධාකිරීම්] තමුසෙ කට වහගන්නව මම කියන් නම් කරුණාවෙන්—

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මගේ කට වහන්න කාටවත් බැහැ. අපි මෙහාට ආවෙ කාටවත් කියා කට වස්ස ගන්න නොවෙයි.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

මම කිව්වෙ ආදරේටයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B Tennekoon)

කාටවත් කියල කට වස්ස ගන්න නොවෙයි අපි ආවෙ.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

පලයන් මිනිහො යන්න.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

පලයන්.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Order, please! Will the hon. Member for Kesbewa please sit down?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

බූරුව වාගෙ නිකම් කෑ ගහනව, මම මොකක්ද කිව්වෙ කියලවත් තේරුම් ගන්නෙ නැතුව [බාධාකිරීම්]

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

කව්ද බූරුව? අනේ නිකම් කට වහගන්නව. [බාධාකිරීමක්] වනචරය.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

අපිව මට්ටු කරන්න කාටවත් බැහැ. සමාජවාදය ගැන නිකම් බෙරිහන් දෙනව, දෙබිඩි ප්‍රතිපත්ති කාරයො. කවද්ද තමුසෙ සමාජවාදියෙක් වුණේ? අවස්ථාවාදී දෙබිඩි ප්‍රතිපත්තිකාරයො, ජාතිද්‍රෝහියො, කොමියුනිස්ට්වාදී, අවස්ථාවාදී ජාති ද්‍රෝහියො.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

තමුසෙලගෙ නායකය නේද අවස්ථාවාදිය? ජාතිද්‍රෝහිය.?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

අනේ කට වහගෙන හිටපං මිනිහො. අපටත් ඕනෑ තරම් දේවල් කියන්න පුළුවනි. [බාධාකිරීම්]

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

අවලං නැහැදිච්ච, නිකෘෂ්ට, චණ්ඩාල, බලු ද්‍රෝහියා.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

අනේ පලයන් යන්න නිකම් කෑ ගහන්නෙ නැතුව බූරුව වගේ. [බාධාකිරීම්] මට ඔය කියන ඔක්කොටම පිළිතුරු දෙන්න පුළුවනි.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා.**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

I do not want any kind of disorderly conduct in this House. If any hon. Member wants to say anything he may do so when he gets his chance to speak, and I will permit him to say it, but no disorderly conduct will I permit in this House.

The hon. Parliamentary Secretary may carry on now.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

අර ඉංග්‍රීසි කියමනක් තිබෙනව, ගරු සභාපතිතුමනි,

You cannot expect anything from a pig, but a grunt කියල.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

On a point of Order, Sir; the hon. Parliamentary Secretary should withdraw that remark.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

He did not refer to any particular Member. If he had done so, I would have called him to Order.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

සත්‍යය ප්‍රකාශ කරන කොට කාගෙත් තුවාල රිදෙනව. [බාධාකිරීමක්] නොයෙක් විධියෙ බොරු ප්‍රචාර කර මේ රටේ ජනතාව මුළා කරනව. [බාධාකිරීමක්]

ගරු සභාපතිතුමනි, මම සඳහන් කළ කරුණුවලින් මේ ගරු සභාවට ඒත්තු යනවා ඇති, මේ රටේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම ප්‍රපාතයකට වැටී තිබුණු අවස්ථාවේදී, විදේශ විනිමය සම්පූර්ණයෙන්ම බංකොලොත් භාවයට පත්ව තිබුණු අවස්ථාවේදී, මහජනතාවට අවශ්‍ය මූලික ආහාර ද්‍රව්‍ය, අතිරේක ආහාර ද්‍රව්‍ය, මේ රටේම නිපදවන්න පුළුවන්කම තිබෙද්දී රටේ ජනතාවට පාඩුවක් නොකර, රටේ ස්වාධීනත්වයට පාඩුවක් නොකර, රටේ ජනතාවගේ ආගමට හෝ මූලික ප්‍රතිපත්තිවලට පාඩුවක් නොකර, අපේ රට ස්වයංපෝෂිත කර ගැනීමේ ලා අවුරුදු දහයකට පමණ කාලයකට පසු මෙම වර්තමාන ආණ්ඩුව ගත් ප්‍රතිපත්තියෙහි වරදක් තිබෙනවාද කියා. වගා කර නොමැති අක්කර ලක්ෂ ගණනක බිම් ප්‍රමාණයෙන් අක්කර දහස් ගණනක්, දුප්පත් ගොවියාට පාඩු නොකර ඔවුන්ට හැකි හැම අයුරකින්ම ආධාර කරමින්, ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාලමින්, ඉතිහාසයෙ කවරාදාවත් වෙන් නොකළ මුදල් ප්‍රමාණයක් ඉඩම් සංවර්ධනය සඳහා වෙන් කරමින්, මහජන මුදල්වලින් ශතයක්වත් කොම්පැනිවලට දෙන්නෙ නැතුව, ඔවුන්ගේම මුදල් වැය කරමින්, මේ රටේ සංවර්ධනයට ඔවුනුත් සහාය කර ගනිමින්, ඔවුන් සමග අත්වැල් බැඳගනිමින් රට ස්වයංපෝෂිත කිරීමෙහිලා මේ රජය ගෙන යන ප්‍රතිපත්තියෙහි වරදක් තිබෙනවාද? කොතැනද ගැමියට අපි පාඩු කර තිබෙන්නෙ? සංවර්ධනය කරන්න බලාපොරොත්තු වුණු කොයි වැවද අපි කොම්පැණි කාරයින්ට භාර දුන්නෙ? කවුද මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොම්පැනි කාරයො? ඇත්ත වශයෙන්ම
මේ කොම්පැනි කාරයින්ගෙන් සියයට අනූ
නවයකුත් දශම නවයක් ලාංකිකයො.
එයින් සියයට හැට පහක් හැත්තෑවක්
පමණ සිංහලයො. ඒ ගැන ප්‍රශ්න කරනවා
නම් මම ඒ කාරණය ඔප්පු කර පෙන්වන්
නම්. අප ඒවා දුන්නේ අපේ වුවමනාව
කට නොවෙයි. ඒ ඒ ප්‍රදේශවල ගරු පාර්ලි
මේන්තු මන්ත්‍රීවරුන්ගෙන් යුක්ත වූ
දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවල නිර්දේශ
අනුව ඒවා දෙන ලද බව මතක් කරන්න
කැමතියි. යම්කිසි ප්‍රදේශයක හෝ යම්කිසි
පළාතක හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ
කාරකසභා මගින් ලැබුණු නිර්දේශවලට
අප සැලකුවා. යම් ප්‍රදේශයක තිබෙන ඉඩම්
දෙනවට විරුද්ධ බව—තමන් කැමති නැති
බව—දන්වා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු
වෙන් ලිපි ලැබුණා නම් ඒ ප්‍රදේශවල ඉඩම්
දුන්නෙ නෑ. උදාහරණයක් වශයෙන්
මොනරාගල සඳහන් කරන්න පුළුවනි. මා
නම් මගේ ආසනයට අයිති ප්‍රදේශයෙන්
දෙන්න කැමති වුණා. එහි අක්කර කෝටි
ගණන් තිබෙනවා. මගේ ජනතාවට දෙන්න
තවත් ඉඩම් එහි තිබෙනවා. ඒ ජනතාවට
අයිති වෙන්න තිබෙන ඉඩම්, ඒ ජනතාව
වෙනුවෙන් තිබිය යුතු ඉඩම්, ඒ ජනතාවට
තබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්
වලින් බිම් අඟලක්වත් දුන්නෙ නැහැ. මහ
වැලි ගඟ දකුණු ඉවුරෙන් අක්කර නව
දාහක් දුන්නා. ඒවා දුන්නෙ තාවකාලික
බද්දට වාර්ෂික වශයෙනුයි. ආහාර ද්‍රව්‍ය
වගා කිරීමට පමණයි ඒවා දුන්නෙ, ස්ථිර
භෝග දැමීමට නොවෙයි. රජයෙන් තඹ
සල්ලි අලුක්කාලක්වත් වියදම් කළේ
නැහැ ඒ වෙනුවෙන්. වාර්ෂික බද්දකුත්
අය කළා. ඒ මුදලත් ලැබෙන්නෙ රජයට
යි. මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට
ඒ සම්බන්ධයෙන් විරුද්ධ වීමට හේතුවක්
ඇතැයි මා කල්පනා කරන්නෙ නැහැ. ලී
දුව ආදියත් හොරකම් කරන්නෙ නැහැ.
ඒ වගේම කිසිම දෙයක් පිටරට පටවන්
නෙත් නැහැ. නීත්‍යානුකූල ලෙසත් හොඳ
පිළිවෙලටත් දෙපාර්තමේන්තු යන්ත්‍රයෙහි
නියමයන් අනුවත් ඒ කාර්යයන් හරියා
කාර කෙරෙනවා.

සමාජසේවා කටයුතු පිළිබඳ ගරු පාර්ලි
මේන්තු ලේකම්තුමාගේ කථාවෙන් ඉතා
මත් වැදගත් කරුණක් ඉදිරිපත් වුණා.
අප, බහුකාර්ය ව්‍යාපාර පටන් ගන්න
බවත් ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වන
බවත් ඒ අතර ඊට වඩා ඉක්මනින් සහ
අඩු වියදමකින් පිරිමසා ගන්න පුළුවන්
සුළු ව්‍යාපාර පටන් ගන්නෙ නැති බවත්
කියැවුණා. එය මාත් පිළිගන්නවා. එය අද
ඊයේ ඇති වූ දෙයක් නොවෙයි. එය මීට
පෙර ඇති වූ දෙයක්. අපේ ඉඩම් සංවර්ධන
කටයුතු පිළිබඳ ප්‍රතිපත්තිය දැන් හුඟක්
දුරට වෙනස් කර තිබෙනවා. බහුකාර්ය
විශාල ව්‍යාපාර—මහවැලි ගඟ වම් ඉවුර සහ
දකුණු ඉවුර වැනි ව්‍යාපාර ප්‍රමුඛත්ව ලේඛ
නයක් අනුවත් ලෝක බැංකුවෙන් දෙන
නිර්දේශ අනුවත් යම් රටකින් ආධාර
දෙන්න කැමති නම් ඒ ආධාර ගැනත්
කල්පනා කර බලා පටන් ගන්නවා. ඒ
අතර සුළු වාරිමාර්ග ක්‍රමවලටත් යම් තැනක්
දෙනවා. ඒ ප්‍රතිපත්තිය උඩයි ගරු ඇමති
තුමා දැනට මාස හයකට පමණ පෙර සුළු
වාරිමාර්ග අංශය දියුණු කළ යුතුයයි
තීරණය කළේ; වාරිමාර්ග දෙපාර්ත
මේන්තුව යටතේ එය කරන්නැයි තීරණය
කළේ. ඒ සුළු වාරිමාර්ග දියුණු කිරීමේ
අංශයේ මාර්ගයෙන් ලංකාවේ වාරිමාර්ග
ඇති කළහැකි ප්‍රදේශවල මධ්‍යස්ථාන පිහිටු
වන්න තීරණය කළා. ඒ සඳහා අවශ්‍ය
යන්ත්‍ර දෙකක් හෝ තුනක් ලබා
දෙන්නත් තීරණය කළා. එය කරන්නේ
වෙනම නිලධාරීන් යටතේයි. ඒ ප්‍රතිපත්
තිය අනුව අප විසින් කැකිරාවේත් ගල්
ගමුවේත් සුළු වාරිමාර්ග මධ්‍යස්ථාන
දෙකක් ඇති කර තිබෙනවා.

මා ඉහතින් සඳහන් කළ කාරණයට
අතිරේකව තවත් පියවරක් අප ඉදිරියට
තබා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ
යේ ආණ්ඩුව පැවති කාලේ වාරිමාර්ග
දෙපාර්තමේන්තුවට සුළු වාරිමාර්ග කට
යුත්තක් සම්බන්ධයෙන් වියදම් කිරීමේ
වරප්‍රසාදය තිබුණේ රුපියල් පණස්දාහ
දක්වා පමණයි. අප ඒ තත්ත්වය වෙනස්
කළා. ඒ තත්ත්වය වෙනස් කර රුපියල්
එක් ලක්ෂ පණස් දාහක් වන තුරු වියදම්
කරන්න බලය දී තිබෙනවා. ඒ අනුව
දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලින්
නිර්දේශ කරනු ලබන වැඩ, ප්‍රමුඛත්ව
ලේඛනය අනුව ගරු මන්ත්‍රීවරුන්ගේ
සහයෝගය සහ අනුමැතියත් ඇතිව,
කරන්නට පුළුවනි. වාරිමාර්ග අධ්‍යක්ෂ
වරයාට ඕනෑම අවස්ථාවක රුපියල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

1,50,000ක වැඩක් පටන් ගන්න බලය තිබෙනව. ඔය විධියේ සුළු වාරිමාර්ග 49ක වැඩ දැන් පටන්ගෙන තිබෙනව මුළු ලංකාවෙම. විශාල වාරිමාර්ග ගැන කියනොත් උදාහරණයක් වශයෙන් පසුගිය මාසයේ 19 වැනිදා මහියංගනයේ නාගදීප මහා ව්‍යාපාරයක් පටන්ගෙන තිබෙනව. ලක්ෂ 220ක හෙවත් කෝටි දෙක හමාරක පමණ ව්‍යාපාරයක් එය. අක්කර 4,000 ක පමණ වාරි මාර්ග යොදවා අක්කර දෙක බැගින් මඩ ඉඩමුත්, අක්කර 3 බැගින් ගොඩ ඉඩමුත් ගොවීන්ට බෙදා දී ගොවි පවුල් 2,000 ක් පමණ පදිංචි කරවන්ට පුළුවන් වැඩ පිළිවෙළක් ඒක. ඒ වගේම, ඔය අන්දමට පටන් ගත්ත රාජාංගනය, උඩවලවේ, චන්ද්‍රිකා වැව ආදී ව්‍යාපාර රාශියත් දිගටම ගෙන යනව. මහවැලි ගඟේ වම් ඉවුරත්, දකුණු ඉවුරත්, පාර්ලිමේන්තු ලේකම්වරයා සඳහන් කළ බහු කාර්ය ව්‍යාපාර, විශාල වාරිමාර්ගීය අංශය යටතේ අළුතෙන් පටන් ගන්න බලාපොරොත්තු වෙනව. සමාජවාදීන්,

He who fights and runs away
Lives to fight another day.

යන ප්‍රසිද්ධ පිරුළ සිහිපත් කරමින් යනව; ආයෙත් එනව. නැත්නම් අවුරුදු 35 ක් උන්නැහෙල ඔය වැඩේ කෙරුවෙ කොහොමද, දිව්වෙ නැත්නම්?

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)
අපි ඉන්නව.

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) හොඳ ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මමත් දන්නව ඒ තත්ත්වය එදා තිබුණු බව. එහෙත්, අදටයි ඒක එල්ල කළේ. 1965 න් ඉස්සර අපේ ගමේ කසාද නොබැන්ද කොල්ලෙක් ඉඩම් කච්චේරියකින් ඉඩමක් ලබා ගන්න ඉදිරිපත් වුණාම ඒජන්ත උන්නැහෙ කියනව, "යාළුව උඹට ඉඩම් දෙන්ට බැහැ, උඹ බැඳල නැති නිසා" කියා. ඒ කොලුව අපට ඇවිත් කියනව, "මන්ත්‍රීතුමා මම කොහොමද කසාද බඳින්නෙ ඉන්ට තැනක් නැති කෙනෙකුට කොහොමද අපේ කෙල්ල් දෙන්නෙ කියා කසාද බඳින්න ගියාම කෙල්ලගේ දෙමව්පියන් අහනව" කියල. ඒක වෙනස් කළා, ඉඩම් ඉතිහාසයේ පළමු වෙනි වරට මේ ජාතික රජය. අපි චක්‍රලේඛන මගින් ඒජන්තවරුන්ට නියම කර තිබෙනව, ගොවි කර්මාන්තයට තම ජීවිතය කැප කරන්න කැමැත්තෙන් සිටින තරුණයන්ට අනිකුත් විවාහක ගොවීන්ට මෙන්ම සලකා ඉඩම් බෙදා දෙන්ට කියා. ඒ ප්‍රතිපත්තිය උඩයි, අද ක්‍රියා කරන්නෙ.

1970 පමණ වන විට තරුණයන් 25,000 ක් ගොවි ජනපදවල පදිංචි කරවීමෙ අරමුණ ඇතුව දැනට තරුණයන් ඒවායේ පදිංචි කරවාගෙන යනව. වාසනාවකට මෙන් එහි මූලික ව්‍යාපාරය පටන් ගත්තෙ මහියංගනය ආසනයේ ගල්පෝරුවෙ ගොවිපොළෙහි තරුණයන් 200 ක් පදිංචි කරවීමෙන්. තම ආත්මගෞරවය රැකගෙන, තම ස්වාධීනත්වය රැකගෙන, මේ රටේ අනික් ජනතාව සමග අත්වැල් බැඳගෙන, උරෙන්-උර ගැටී එම තරුණයන් කටයුතු කරගෙන යනව. ඒ වගේම දැනට පිහිටුවා තිබෙන අනික් ගොවිපොළවල් 28 ත් එසේම කටයුතු කරගෙන යනව. මෙවැනි ගොවිපොළවල් නොයෙක් ප්‍රදේශවල පිහිටුවා ඒ ඒ ප්‍රදේශවල වගා කළ හැකි දේවල් නිපදවීමට අපි ක්‍රියා කරනව. ගාල්ල, රත්නපුර වගේ ප්‍රදේශවල තේ වවන්ට පුළුවන්. නුවරඑළියෙ අපි එළවලු වවනව. [බාධාකිරීමක්] ග්‍රේප්ස් හෝ මොනව හෝ වවනව.

ආසියා පදනමෙන් අපට මේ කටයුතු සඳහා බොහෝ ආධාර දෙනව. අපේ තරුණ ගොවිපොළවලට අවශ්‍ය ට්‍රැක්ටර් 2ක් 3ක් ලැබී තිබෙනව. අවුරුදු 2ක් විතර තරුණයන්ට පදිංචිවන්ට පුළුවන්කම ඇති, බිමට සිමෙන්ති දමා අතු සෙවිලි කර සෑදූ තාවකාලික වාඩියක් හදාදී තිබෙනව. නොමිළයේ බිත්තර වී සහ පෝර ලැබෙනව. උපදෙස් ලබා දෙන්ට නිලධාරීන් දෙතුන් දෙනෙක් සිටිනව. ඒ වගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගිනුත් අවශ්‍ය උපදෙස් ලැබෙනව. ඒ ගොවිජනපදවල පදිංචි වන තරුණයන්ට අවුරුදු 2 ක් ගත වන තුරු යැපීමේ දීමනාවක් වශයෙන් දිනකට රු. 1.50 ක් බැගින් ගෙවනව. ඒක තමයි මේ රජය විසින් පටන් ගත් ප්‍රතිපත්තියේ ප්‍රගති අංගයක්. එහි තවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හොඳ අංගයක් තිබෙනව. මෙපමණ කලක් කොලනි ජනපදවලට තෝරාගත් විවාහක ගොවියෙකුගෙ පවුලකට ආධාර වශයෙන් ලැබුණෙ මාසයකට රුපියල් 30 ක් බැගින් පමණයි. ඒ මුදල දුන්නෙත් 6 මාසයක් ගතවන තුරු පමණයි. අපි තරුණයන් ධෛර්‍යය කිරීමේ පියවරක් වශයෙන් දිනකට රුපියල් 1.50 ක් බැගින් ගෙවීමේ ක්‍රමය සකස් කළා. ඒ ප්‍රතිපත්තිය උඩ මේ වන විට 7,000 කට පමණ රක්ෂා දී තිබෙනව. දැනට මාස 3 කට පමණ පෙර විශේෂයෙන් මේ කොළඹ අවට ප්‍රදේශවලින් තරුණයින් 50 දෙනකු ඒ ගොවිජනපදයේ පදිංචියට යැව්ව. රාජාංගනයේ ඒ ගොවිපොළෙයි දැන් තරුණයන් 200ක් ඉතා ලස්සණට උද්‍යෝගයෙන් සාර්ථක ලෙස කටයුතු කරගෙන යනව. ඔවුන් අත්වැල් බැඳගෙන සමගියෙන් ගොවිතැන් කටයුතු කරගෙන යනව. මේ පිළිවෙළට සමාජය දියුණු කිරීම සඳහා ප්‍රගතිශීලී සමාජවාදී වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යන විට මේ ප්‍රතිගාමීන් මෙයට විරුද්ධ වන්නෙ ඇයි? මේ ප්‍රතිගාමීන් මේ වැඩපිළිවෙලට විරුද්ධව බෙරිසන් දෙනව. මේ රටට ආදරයක් තිබෙනව නම්, පපුව අත ගා බලා සිංහල ලෙයක් තිබෙන බව හැඟෙනව නම්, මේ ප්‍රතිගාමීන් අපිට ආශිර්වාද කරන්ට ඕනෑ. "උඹල ගෙන යන පියවර හරි, අපේ ආශිර්වාදයත් දෙනව" කියල. නමුත් මෙතැන ඇවිත් කෑගහනව, හෙට උදේ "ඇත්ත" පත්‍රයට දෙන්න. "ඔන්න පෞද්ගලික අංශයට තැන දුන්න" "සමාජවාදය", "ඉදිරිගමන" "හංගවේවා" කියල මොන මොන වද කියනව, මම දන්නෙ නැහැ.

ඔක තමයි, හැමදාමත් මෙතැන "කුරු කුරු" ගාමින් ගහන රෙකෝඩ් එක. ඇයි මේ අය මේ වැඩ පිළිවෙළට විරුද්ධ? අපෙත් කැබිනට් මණ්ඩලයෙත් වැරදි ඇති. අපි ප්‍රෘථග්ජන මිනිස්සු. අපි සෝවාන් වෙලා නැහැ. නමුත් අපේ වැරදි ඇත්නම් ඒව මොනවාද කියා සොයාගෙන, ඒව හරිගස්සාගෙන, ආත්ම ගරුත්වයක් ඇති දේශප්‍රේමී වගකිවයුතු පිරිමින් වගේ ඉදිරියට යන්ට අපිට පුළුවන්කමක් තිබෙන්ට ඕනෑ. නමුත් නාන්සෙල මේ පැත්තෙ ඉන්නකොට අපි කියූ දේවල් පිළිගත්තෙ නැහැ. ඔක්කොම පණ්ඩිතයො, පොතේ ගුරාල. එහෙම වැඩ කරමින් තමයි අවුරුදු 9 ක් තිස්සෙ රට කෑවෙ. නමුන්නාන්සෙල මේ රටේ මොනවාද ඉතුරු කළේ? නමුන්නාන්සෙලාගෙන් අපිට ලැබුණු උරුමය මොකක් ද? රක්ෂා නැති තරුණයන් හත් ලක්ෂයක්. නමුන්නාන්සෙල අවුරුදු 9 ක් තිස්සෙ පොල් ගෑව. අද ඒ රක්ෂා නැති තරුණයන්ගෙ වගකීම අපේ හිස උඩයි තිබෙන්නේ. අද කෑගහනව. "කෝ රක්ෂාවල් දුන්නද?" කියල. අපි සෑහෙන ගණනකට රක්ෂාවල් දීල තිබෙනව. අපේ ප්‍රතිපත්තිය අනුව ඉදිරියටත් දීගෙන යනව. මේ අය රට හිඟමනට පත් කර රක්ෂා නැති හත් ලක්ෂයක උරුමයකුත් අපිට දීල ගියා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ මෝඩ පුද්ගලයන්ට ඒ ප්‍රතිපත්තිය ඒ පිළිවෙළට ගෙන යන්නට අනුබල දෙමින් මූන්නැහෙල මෙහෙන් මුක්කු ගහනව අර වෘකයා මෙහාට ගෙනැවිත් දාන්න, "වැටියන්, වැටියන්" කියල. මම හිතන්නෙ නැහැ ඊට ඉඩ ලැබෙයි කියා. අවශ්‍ය වේලාවක මේ රටට අවබෝධයක් දෙන්ට පුළුවන් කොල්ලො ටිකකුත් මේකෙ ඉන්නව. අපි අත්වැල් බැඳගෙන බොහොම මහන්සියෙන් කටයුතු කරනව අපේ ගමන සාර්ථක කර ගනීමට. එය සාර්ථක වන බව අපි දන්නව. දැන් කොච්චර හිනා වුණත් ඒ වෙලාවට මහජනයා සාක්ෂි දේවි. අපිට එය කරන්ට බැරි වුණොත් තමන් අතේ පාවිච්චි කරයි. අපි වැරදි කළා. නැවත තිබෙන වැදගත් ආයුධය මහජනයා පාවිච්චි කරයි. අපි වැරදි කළා. නැවත වරක් මෙතැනට ආවෙ ඒ වැරදි හරිගස්සාගෙනයි. අපි විශ්වාස කරනව, බලාපොරොත්තු වෙනව, පුළුවන් තරම් වීරිය කරනව අපේ ඒ ගමන සාර්ථක කරගන්ට. අපේ ක්‍රියා ශූරත්වයක් තිබෙනව නම් එය සම්පූර්ණයෙන්ම යොදා, පුද්ගලික කටයුතු සඳහා වෙන් කළ යුතු කාලය පවා මේ රටේ යහපත වෙනුවෙන් යොදා මේ රට අපේ අදහස් අනුව ස්වයම්පෝෂිත කිරීමෙහිලා අපි සෑම පියවරක්ම ගන්න බවට මේ අවස්ථාවේදී පොරොන්දු වෙනව.

අ. භා. 7.23

**ජේ. එල්. සිරිසේන මයා.** (බිංගිරිය)

*(திரு. ஜே. எல். சிறிசேன—பிங்கிரிய)*

(Mr. J. L. Sirisena—Bingiriya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් යෝජනාවක් ගැන බොහෝ තර්ක ඉදිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඇල්. සිරිසේන මයා.]

පත් වුණා. විරුද්ධ පාර්ශ්වයෙ පක්ෂ තුනෙන් අදහස් තුනක් ඉදිරිපත් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ හිටපු ඇමති වරයකු වන දොම්පෙ ගරු මන්ත්‍රීතුමා කීව, මේ රජය විදේශීන්ට ඉඩම් දුන් නොත් එය අපේ මුතුන් මිත්තන්ගේ අයිතිවාසිකම් විදේශීන්ට පවරා දීමට නැත් කිරීමක්ය කියා. ලංකා සමසමාජ පක්ෂයෙන් කියැවුණා "අපි ආහාර වගා කළ යුතු නැහැ, කර්මාන්ත ආරම්භ කළ යුතුය" කියා. කොමියුනිස්ට් පක්ෂයෙ නාය කයා කීව, "අපි නිතරම යන්නෙ අධිරාජ්‍ය වාදීන් පස්සෙයි, රුසියාව වැනි සමාජ වාදි රටවල් පස්සෙ යන්නෙ නැහැ" කියා. මම බලාපොරොත්තු වෙනව, මා දන්නා තරමින් මේ කරුණු තුන ගැනම අදහස් දැක්වීමට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පමණක නොවෙයි තුන් හවුලම ජාතික රජය රටේ සංවර්ධනයට ගන්න සෑම පියවරක් දිහාම බලන්නෙ ඊර්ෂ්‍යා වෙන්. ඒ පුරුද්ද තියෙන්නෙ අද විතරක් නොවෙයි. වර්තමාන අගමැතිතුමා කෘෂි කර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලෙදි එතුම තමයි වලවේ යෝජනා ක්‍රමය ආරම්භ කළේ. එහි සැලැස්මෙ සැදුවෙ. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ රජය 1956 දී බලයට පැමිණියායින් පසු අර වලවේ යෝජනා ක්‍රමය එක්සත් ජාතික පක්ෂය විසින් සකස් කරන ලද සැලැස් මක හෙයින් පස්සට ඇද දැමීම. 1960 වන තුරුම එය පස්සට ඇද දමා තිබුණු නිසා මේ රටේ පොදු මහජනතාවගෙ, ගොවි ජනතාවගෙ, සංවර්ධනය අවුරුදු හතරකින් පහකින් පස්සට තල්ලු වුණා.

අද දොම්පෙ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කීවෙ කුමක් ද? මේ රටේ ගොවීන්ට ජපානයේ ගොවීන්ට මෙන් අක්කරයකට බුසල් 70ක් 80ක් අස්වැන්න ලබා ගන්න බැරි කියමින් තර්කයක් ඉදිරිපත් කළා. අද මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කරන එම ගොවි ජනතාව අධෛර්යයී කිරී මෙ පරම චේතනාවෙනුයි එම ප්‍රකාශය කළේ. ගරු නියෝජ්‍ය සභාපති තුමාටත් මේ රටේ ජනතාවටත් මතක ඇති දොම්පෙ ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිවරයා වශ යෙන් කටයුතු කරද්දී සහල් සලාකය

කපන්ට තැත් කළ ආකාරය ගැන. එය කරන්ට බැරි වුණායින් පසු එම ඇමති කමත් අතහැර ගියෙ, මම මේ රජයෙ තණ කොළ වවන ඇමතිවරය හැටියටත් ආපසු එනනෙ නැත කියමිනුයි. එසේ කියා මාස ගණනක් ගත වන්ට පෙර මොකද වුණේ?

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාවෙ ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இன்மையால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென கட்டளையிடப் பட்டது.*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**පසුව ගණපූරණයක් නොතුබුයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් 11 වන ස්ථාවර නියෝ ගය යටතේ, ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදි.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7.28 ට 1966 නොවැම්බර් 8 වන අඟහරුවාද අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*பின்னர் நிறைவெண் இன்மையினால் குழுக்களின் உப அக்கிராசனர் நிலையற் கட்டளை இல. 11 இன் பிரகாரம் வினாவின்றிச் சபையை ஒத்திவைத்தார்.*

*அதன்படி சபை பி. ப. 7.28 க்கு 1966 நவம்பர் 8, செவ்வாய்க்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*Later, a Quorum not being present,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House, without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 7.28* P.M. *until 2* P.M. *on Tuesday, 8th November 1966.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. BOX, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org